# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ පොසොන් පුර පසළොස්වක පෝදා 2022 ජූනි 14 අඟහරුවාදා BUDUSARANA TUESDAY JUNE 14, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 01 පත්‍රය, පිටු 36 ආරම්භය 1965 - 06 - 13 මිල රු. 50.00




මිස්සක පව්වට අපි යන ගමනේ
කියමින් බුදුගුණ සූවිසි වරුණේ
අනුබුදු හිමි ගුණ සිහිකර නිතිනේ
අරහත් මාහිමි වඳිනෙමු ඉතිනේ

ගාමිණී ජයලත් තල්දෙන

# යුගාන්ධකාරය දුරුකරවමින් පායා ආ රන් හිරුමඬල බුදුරජාණන් වහන්සේ



කල්ප ගණනක් පුරාවට සංසාරය නැමැති නුබකුස වසා පැතිර ගිය මෝහය නම් වූ යුගාන්ධකාරය දුරුකරවමින් පායා ආ රන් හිරුමඬල මහා ගෞතම බුදුරජාණෝ ය.

ඒ සිරිමත් සිදුහත් භගවතාණෝ පැහැබර වෙසක් සඳේ සිහිලසින් මිහිලිය සිහිල් වන පින්බර දිනෙක මෙත් කරුණා සලිලයෙන් දනමන නිවාලමින් මිහිමත පහළ වූහ.

දසලක්ෂයක් ලෝධා සලිත කරවමින් අසමසම සම්බුදු පදවිය ලැබූහ. පුරා පන්සාළිස් වසරක් සිදුකොට වදාළ පස් බුදුකිස නිමවා අපමණ සත්වගක් දුකින් මුදවා සංසාර සරණියෙන් සමුගත් සේක.

එදින අදින් සහස්‍ර දෙකහමාරකට පෙර උදා වූ වෙසක් පුන් පොහෝ දිනයකි. ජලතල සහිත මුළු පොළෝ කුස පස් පියුමින් වැසී ගියේ ය. ගස් වැල් තුරු ගොමු මලින් හරිත විය. මල් වියනකින් අහස් කුස වැසෙද්දී තරු රාශි පිරිවැරූ හිරු - සඳු වඩාත් සිහිල් වී එකවිට මුදුන් විය. පරසතු මදාරා දිවමල් බිම හෙළමින් සාධු නාද නංවන දෙව් බඹුන්ගෙන් හා දිව්‍යමය පසඟතුරු ඝෝෂාවෙන් ගගනෝදරය ඇළලී ගියේ ය. සියොත් බමර සමුළුවක් වූ සුපුෂ්පිත ලුම්බිණි සාල වනපෙත දිව්‍යමය සුගන්ධයකින් යුතු මන්ද මාරුතයකින් සාන්තව සලිත විය.

දෙව්ලියන් පිරිවැරූ දෙවඟනක් නඳුන් උයනට පිවිසෙන්නාක් විලසින් උත්තම රූ සොභා ඇති මායාව උයන් සිරි විඳිමින් සල් තුරු අතරින් වැඩම කොට එක් සුවිසල් සල් ගසක් මුල නතර වූවා ය.

බෝසත් පුතු මිහිමත සිරිපා පිහිටුවීමට සැරසෙන බව මායාවට දැනී ගියේ ය. වටතිර ඇද පිළිසන් වූ දේවිය වෙත අරහත්තක බ්‍රහ්මරාජවරු සතර දෙනෙක් පැමිණ රන් දැලක් සතර කොනින් අල්ලා සිටියහ. ධර්ම කථිකයකු ධර්මාසනයෙන් බසින්නාක් මෙන් බෝසත් පුතු සිරිපා දිගුකොට රන් දැලට වැඩම කළහ. අනතුරුව සතරවරම් දෙව්රජුන්ගේ මංගල සම්මත අඳුන් දිවි සමට වැඩි බෝසත් කුමරු ඉන් ඉක්බිතිව රාජකීයයන් විසින් දුකූල වස්ත්‍රයෙන් පිළිගන්නා ලදී. අවසානයේ සිරිපා පොඩි මිහිමත පිහිට වූ මොහොතේ බොල් පොළොව පලා නැඟී රත්පියුම් සමූහයෙහි සිරිපා පිහිටවූහ.

දසදිගින් නැගෙන සාධු නාද හා පසඟතුරු නාදයට මුහු වූ තුති ගී ගැයෙන විට දසදිශා ලෝකනය කළ බෝසතාණෝ උතුරු දිශාවට සත්පද වීතිහාරයකින් වැඩම කළහ. මිහිකත ගුගුරා රාව ප්‍රතිරාව නැංවීය. දකුණු ශ්‍රී හස්තය අහසට ඔසවා මොළකැටි සිරිමුවමඬල විවර කළ බෝසත් පුතු "මම ලොවට අග්‍ර වෙමි" ආදී සිංහ නාදයක් නැංවූහ.

එදා පටන් පුරා වර්ෂ තිස්පහක් ගෙවී ගිය පසු නැවතත් වෙසක් සොමි සඳමඬල උදාවන අසිරිමත් දිනය උදාවිය. පුරා විසිනව වසරක් ගෙවූ රාජ සුකුමාල ජීවිතය, අතහැර දැමූ සිද්ධාර්ථයන් වහන්සේ තපෝවනයට වැඩම කළහ. හඬන - වැළපෙන ලෝකයට අස්වැසිලිදායක විමුක්ති මාවත සොයනු වස් පුරා සය වසක් ආත්ම ක්ලමථනයෙන් යුතුව අනුගමනය කළ, ඇසෙන විටත් බිය ගෙන දෙන අතිශය දුෂ්කර තපෝ ක්‍රමයන් හැර දමා මධ්‍යම ප්‍රතිපදා මාවතට අවතීර්ණ වූහ.

> **"දෙව්ලියන් පිරිවැරූ දෙවඟනක් නඳුන් උයනට පිවිසෙන්නාක් විලසින් උත්තම රූ සොභා ඇති මායාව උයන් සිරි විඳිමින් සල් තුරු අතරින් වැඩම කොට එක් සුවිසල් සල් ගසක් මුල නතර වූවා ය."**

"මෙම හේතුව ඇති කල්හි මෙම ඵලය වේ - මෙම හේතුව නොමැති කල්හි මෙම ඵලය නොවේ" යන හේතුඵල විමර්ශන ඤාණ ගවේෂණයෙන් යුතු සබුද්ධික චින්තනය මඟින් සත්‍යාවබෝධයෙහි මාවත විවර විය. යහපත් දැක්ම හා ආත්ම පාරිශුද්ධියත්, යහපත් වචන සහ ක්‍රියාවන්ගෙන් පිරිසුදු දිවිපැවැත්මත් ඇතිව පව් තවන වීර්යය හා සිහියෙන් යුක්තව ලබන යහපත් චිත්තේකාග්‍රතාව වෙත යොමු වූ මහා බෝසතාණෝ නේරංජරා ගඟබඩ වූ අස්සත්ථ බෝධි මණ්ඩලය වෙත වැඩම කළහ. සුජාතා සිටු කුමරිය පිදූ ක්ෂීරපායාසය වළඳා සොත්ථිය බමුණාගෙන් ලද කුසතණ අතුරා විදුරසුන්හි වැඩහිඳ පස්මරුන් පරයා අසමසම සම්බුදු පදවිය ලැබූ සේක්, වෙසක් දිනෙක සංසාර චක්‍රයේ අර සිඳලමින් විද්‍යා විමුක්තිය සාක්ෂාත් කළහ. එනම් ලොව අසමසම බුදු පදවිය ලදහ.

සත්ත්වයන්ගේ නෙතු තෙත් කළ කඳුළ වෙනුවට හසරැල්ලත්, ක්‍රෝධ - කෝප - ආවේග - පීඩාවන් වෙනුවට මෛත්‍රිය - කරුණාව - ඉවසීම හා අතහැරීමත් මත පදනම් වූ නිෂ්කාමී අකාමුක ජීවිතයත් මායාව හා මුළාව වෙනුවට අව්‍යාජත්වයෙන් සුන්දර වූ හුදෙකලාවත් භජනය කළ ඒ මුනිරජහු සදහම් අම මිහිරෙන් කැලතුණ, සත්‍යාවබෝධයෙන් රසගැන්වුණ ශාන්ති මාවත ලෝ සතුන් උදෙසා නොමසුරුව විවර කළහ.

ඉසිපතන මිගදාය නැමති ආමන්ත්‍රණ භූමියේ දී දෙව්මිනිස් ප්‍රජාව වෙත විවර වූ සදහම් අමා දොරින් ගැලූ ඒ ශාන්ති ධාරාව හදවතින් හදවත, යුගයෙන් යුගයට, මිහිරට මිහිරක් ම විය. සිසිලට සිසිලක් ම විය. රාග විරාගයට, මද නිම්මදනයනට, පිපාස විනයනයට අමා ඔසුවක් ම විය.

පස්වග තාපසවරුන් ඇතුලු දහඅට කෝටියක් දෙව්බඹ ප්‍රජාවක් විශුද්ධ වූ විමුක්තියෙහි පිහිටුවා විවර කළ ප්‍රතිසෝතගාමී ක්ෂේම නිම්නයෙන් අසරණ දෙව් මිනිසුන්ගේ හද මැදුරු වෙත අමා වතුරක් ගලා ගියේ ය.

කුලය, පරම්පරාව, වත්පෝසත්කම, සමාජ තත්ත්වය වැනි ලෞකික සාධක නොසලකා පෙර කළ පින් ඇති බව සලකා දම් දෙසූ ඒ මුනිරජුන් පුරා සතළිස් පස් අවුරුද්දක් මිහිමත වැඩ සිටි සේක. අවම වශයෙන් කෝටි ලක්ෂයක්වත් සක්වලට පැතිර යන සම්බුද්ධ රාජ්‍යය පිහිටුවා මිනිස් නොමිනිස් අපමණ පිරිසක් සසර සයුරෙන් ගොඩ කරවූහ.

රජමැදුරට මෙන්ම දුගී පැලටත් සමසිතින් වැඩම කළ මහා ගෞතම මුනිරජුන්ගේ පිහිට ලැබූ කප්පින, පුක්කුසාති, පච්චය, බිම්සර, කොසොල් ආදී රජ දරුවෝ ද, සෝණදණ්ඩ, අම්බරට්ඨ, කූටදන්ත ආදී බ්‍රාහ්මණවරු ද, අනාථපිණ්ඩික, චිත්ත ආදී ගෘහපති වරු ද, යශෝධරා, ප්‍රජාපති, විශාකා, ඛේමා, උප්පලවණ්ණා ආදී කුමාරිකාවෝ ද, සක්ක, සුප්පබුද්ධ, පටාචාරා, සුනීත, සෝපාක ආදී අසරණයෝ ද, අංගුලිමාල, අජාතසත්තු ආදී සාහසිකයෝ ද, කන්ථක, ධනපාල, පාරිලෙය්‍යක, නන්දෝපනන්ද ආදී තිර්ශ්චානයෝ ද, ආලවක, සුචිරෝම, බරරෝම යක්ෂයෝ ද, ආදරණීය හදවත් ඇති, ප්‍රේමණීය මෘදු මොළොක් ළය මඬුලු ඇතියන් බවට පත්වූහ.

පන්සාළිස් වසරක සදහම් චාරිකාව නිමවා මහා ගෞතම දම් රජාණෝ වෙසක් දිනෙක සවස් භාගයෙහි කුසිනාරාවේ උපවත්තන සාල වනය වෙත වැඩම කළහ. අසිරිමත් පාරමී ගමනක අවසාන නිශායම උදාවිය. මල හිරු බැස ගියේ ය. මළානික වෙසක් සඳ උදා විය. සරාගීන්ගේ නෙතු අගින් වෑහෙන කඳුලු ධාරාවන්ගෙන් නෙතු සඟල රක්ත විය. විරාගීන්ගේ හදවතෙහි දහම් සංවේගය පහළ විය. අනන්ත දෙව්බඹහු ශෝ ගී ප්‍රකාශ කළහ.

"මහණෙනි, අවසන් වතාවට නුඹ අමතමි. හටගත් සියල්ල නැසෙන සුලු ය. අප්‍රමාදී ව කුසල් දහම් සම්පාදනය කොට නිවන් දකින්න" යන අවසන් බුදු වදන නිකුත් විය. අභිනීල නෙතු පියාගත් ඒ දම්රජුන්ගේ කාරුණික හදමඬල සදහට ම නතර විය. පහන් සිලක් නිවුණා සේ පිරිනිවන් වැඩ සැනසුණාහ.

ඒ සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසීය තිස් හයකට පසු අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාද්වීපයට වැඩම කළහ. ඒ අදවන් පොසොන් පුර පසළොස්වක පොහෝ දිනෙක ය. සිරි ලක්දිව ධර්ම රාජ්‍යයක් බවට පරිවර්තනය වූයේ ඒ උතුම් මහින්දාගමනයත් සමඟ ය.



බෙලිහුල්ඔය සීලසමාහිත යෝගාශ්‍රමවාසී,
ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද,
අභිධර්මය පිළිබඳ කථිකාචාර්ය,
ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත,
**බලංගොඩ රාධ හිමි**



# ගැඹුරු දහමක් සරලව අවබෝධ කළ උපමා උපමේය

**දිනක් ජානුස්සෝණි බ්‍රාහ්මණයා අමතා බුදුරජාණන් වහන්සේ වදාළ "චුල්ලහත්ථිපදෝපම" සූත්‍රය එදා මිස්සක පර්වතය අභියස මිහිඳු හිමියන් ලක්දිව නරපති දෙවන පෑතිස් රජුට දේශනා කළහ. යමෙක් සන්සුන් මනසකින් මේ පිළිබඳ අවබෝධ කරගන්නේ නම්, මෙහි ඇති ප්‍රබල ඥානමාර්ගය ප්‍රත්‍යක්ෂ වේ.**

"මහ රජතුමණී, ඇතුන් වසන වනයකට ඇතුල්වන්නකුට දිගු පුළුල් ඇත් අඩි පියවර දුටුවහොත් ඒ පිළිබඳ ව අවබෝධය ඇත්තා එය මහ ඇතකුගේ පියවර යැයි එකවර තීරණයකට නොපැමිණේ." හේතුව "වාමනිකා" නම් මහ ඇතින්නගේ පියවර ඇති හෙයිනි.

එසේම "මහරජතුමණී, තව තවත් වනයේ ඉදිරියට යනකොට මහා ඇත් අඩි පියවර හා

උස් ගස්වල අතු කඩාදමා ඉහළින්ම දළ පහර ගසා තිබෙනු දක්නට පුළුවනි. ඒ පිළිබඳ ව මනා අවබෝධය ඇත්තා එය මහ ඇතකුගේ යැයි තීරණයට නොපැමිණේ." හේතුව "උච්චාකාළාරිකා" නම් ඇතින්නගේ අඩි ද විශාල හෙයිනි. එනිසා පූර්ව නිගමනය වෙනස්වෙන නිසා අවබෝධයක් ඇති තැනැත්තා වනයේ තවතවත් ඉදිරියට යයි. එවිට ඔහුට දකින්නට ලැබේවී මහ ඇතු. එවිට මැනවින්ම තීරණය නිවැරැදි යැයි ප්‍රත්‍යක්ෂ වේ.

"මහරජතුමනි, මේ උත්තම බුද්ධ ශාසනයත් එසේ ම ය. සිව්වනක් පිරිස බුද්ධ ශාසනයට

ඇතුළු වෙද්දී ඉතාම ප්‍රසාදයට පත්වේ. ධර්මයෙහි මුල, මැද, අග මනාව අවබෝධ වූ පසු ශීලයෙන්, ඉන්ද්‍රීය සංවරයෙන්, මනා සතියෙන් ඉදිරියට යයි. භාවනාව වඩයි. "ධ්‍යාන සමාපත්ති" ලබා ගනී. එතැනින් නොනැවතී "පුබ්බේනිවාසානුස්සති ඥාණය "චුතූපපත්ති" ඥානය ලැබෙයි.

එහෙත් අවසන් අවබෝධය යැයි තීරණය නොකරයි. ප්‍රත්‍යක්ෂ නොකරයි. ඉදිරියටම යයි.

කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත මුදවා නැවත නැවත ඉපදීම නතර කරන මාර්ගඵල අධිගමනයට පැමිණ අරහත් ඵලය පරමනිෂ්ට නිර්වාණය පසක් කරගනී.

"මහ රජතුමනි, ශාස්ත්‍රය ශිල්පය දන්න පුද්ගලයා කුඩා ඇත් අඩි මහ ඇත් අඩි දැක



වාද්දුව මොල්ලිගොඩ
දෙගම්බද මහා විහාරවාසී
ශාස්ත්‍රවේදී
**වැලිපත**
**ධම්මාරාම හිමි**

එකවරම තීරණය නොකළා සේ ධර්මය පිළිබඳවත් එසේ ම ය. මේ පිළිබඳ මනා සිහියෙන් අවබෝධයෙන් සිටී. දෙවන පෑතිස් නිරිඳු ශ්‍රේෂ්ඨ වූ තථාගත දහම පිළිබඳ මහත් වූ චිත්ත ප්‍රසාදයට පත්විය.

එදා මිහින්තලාවේ දී දේශනා කළ මේ සූත්‍රය කෙතරම් ගැඹුරු ද? උපමා උපමේය සංසන්දනය ඉතාම ශ්‍රේෂ්ඨ ය. ඇතුන් වනයේ සැරිසැරීම පංචනීවරණ ප්‍රහාණය යි. මේ බුදුන් වදාළ දහම යි. ඇතුන් පිළිබඳ අවබෝධය ඇත්තා යනු ධර්ම මාර්ගයට පිළිපන් පිළිවෙත් පුරන්නා ය. ලොකු ඇත් අඩි ලෙස දැක්වූයේ සතර කර්මක්ලේශ ප්‍රහාණයෙන් ලබන උතුම් නිවන යන්න යි. ධර්ම මාර්ගයට පිළිපන් පුද්ගලයා අතරමඟ නතර නොවේ. විමර්ශනය කරයි. ආර්ය මාර්ගය සොයයි. පරම සත්‍ය අවබෝධයෙන් පසු ස්ථිර කරගනී. හෙළ බුදු සසුනේ මංගල ශීලාව ලෙස "චුල්ලහත්ථි පදෝපම" සූත්‍රය පෙන්වා දිය හැක.

දොරටු අරින ලද ළඟ පිහිටි ගෙවල් දෙකක් අතර සිටින යම් පුද්ගලයකු ඒ ඒ ගෙට ඇතුල්වන්නේත්, පිටවන්නේත් මැනවින් දන්නා සේ ය. තමන් වහන්සේ ද උපදින සත්වයාගේ චුති සිත කෙසේ ද යන්න හොඳින් දන්නා බව බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළහ.

වැඩිහිටියන්ට, මව්පියන්ට, ශ්‍රමණයින් වහන්සේලාට නොසලකන පවේ ඇලුණු ගැලුණු යමෙක් මරණින් මතු නිරයේ උපදී. අපායේ දී යමපල්ලන් විසින් යම රජුවෙත ඔහු කැඳවාගෙන යයි.

*ඉතිරිය 21 පිටුවට ...*


## පාණදුර - ගොරකාන ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරස්ථ පුණ්‍ය භූමියේ ඉදිකෙරෙන

ගර්භය තුළට පිවිසිය හැකි ඓතිහාසික


# ගොරකාන "සීවලි මහා සෑයට" ඔබත් දායක වන්න

ගොරකාන - සීවලි මහා සෑයේ පාදමේ මූලික බිම් සැකසීමේ වැඩ සඳහා පමණක් වැය වන රු.5,000,000/- ( ලක්ෂ පනහ ) ක මුදල වෙනුවෙන් තනි හෝ සමූහ වශයෙන් දායකත්වයක් දැරීමට කැමති පින්වත් දනපතියන්ට, ධනපතියන්ට, ව්‍යාපාරිකයන්ට ඉදිරිපත් විය හැක.

| ගිණුමේ නම : සීවලි මහා සෑය අරමුදල | |
|---|---|
| සම්පත් බැංකුව ගිණුම<br>1151 6100 4890 | ලංකා බැංකුව ගිණුම<br>8 5 5 7 7 4 3 9 |
| මහජන බැංකුව ගිණුම<br>148-2-001-6-0038551 | සෙලාන් බැංකුව ගිණුම<br>0400-13126762-101 |

### විහාරස්ථානයට පැමිණෙන ගමන් මාර්ගය.

පාණදුර පරණ පාර (මාර්ග අංක 100 හෝ 183) බස් මාර්ගයේ පැමිණ "ගොරකාන" බස් නැවතුමෙන් බැස, ගොරකාන - ' කීල්ස් ' ආයතනය අසල ඇති ශ්‍රී ධම්මානන්ද මාවතෙන් හැරී විහාරස්ථානයට පැමිණෙන්න. (පැමිණමට පෙර දුරකථන මගින් ස්වාමින්වහන්සේ වැඩසිටින වෙලාවක් ලබාගන්නේ නම් ස්තූතිවන්ත වෙමු.)




මෙම උතුම් පුණ්‍ය ක්‍රියාවට දායකවී පින්කැමැත්තෝ කුසල් වඩවා ගනිත්වා !!!

පින්වත් ඔබගේ පුණ්‍යාධාර "සීවලි මහා සෑය අරමුදල" නමින් දක්වා ඇති බැංකු ගිණුමකට බැර කළ හැකිය. එලෙස බැංකු ගිණුමකට ඔබේ පුණ්‍යාධාරය බැර කොට ඇති බව සනාථ කිරීම පිණිස එම බැංකු ලදුපත හෝ එහි පැහැදිළි පිටපතක් සමග, ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංකය පැහැදිළි අකුරින් ලියා පහත ලිපිනයට තැපැල් කරන්න. එහි විනිවිදභාවය සඳහා පුණ්‍යානුමෝදනා පතක් තැපැල් මගින් ඔබ වෙත එවනු ලැබේ. විහාරස්ථානයට පැමිණෙන පින්වතුන් හට "සීවලි මහා සෑය අරමුදල - කාර්‍යාලයය" ට පුණ්‍යාධාර ලබාදිය හැක.

*තෙරුවන් සරණයි !*

**සියලු විමසීම් :**

ගරු සභාපති,
පූජ්‍ය ලියන්ගහවත්තේ නන්ද ස්ථවිර,
සීවලි මහා සෑය අරමුදල,
ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරය,
ශ්‍රී ධම්මානන්ද මාවත,
ගොරකාන,
කෙහෙල්වත්ත 12550.

ගොරකාන සීවලි මහා සෑය
සීවලි මහා සෑය අරමුදල
ආරම්භය : ශ්‍රී බු.ව. 2563 / ව්‍ය.ව. 2020

විහාරස්ථානය : ☎ - 038 22 97 914

සභාපති හිමි : 071 250 44 46

ස්වාමින්වහන්සේ පමණක් (බොහෝවිට) පන්සලේ වැඩවසන බැවින් බැහැරට වැඩසිටින අවස්ථාවලදී දුරකථන ඇමතුම් ලබාදීමේදී සැලකිලිමත් වීමට කාරුණික වන්න.



ශ්‍රී බුද්ධවර්ෂ 236 වැනි පොසොන් පුර පසළොස්වක පොහෝදා අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට ථෙරවාදී බුදුසමය හඳුන්වා දුන්හ. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා සතර නමත් ෂඩ් අභිඥලාභී සුමන සාමණේරයන් වහන්සේත් භණ්ඩුක නම් අනාගාමී උපාසකතුමාත් යන රාජකීය ධර්ම දූත පිරිස මිහිඳු මහරහතන් වහන්සේත් සමඟ මෙහි සැපත් වූහ.

# හෙළදිව ධර්මද්වීපයක් කළ අසිරිමත් පොසොන් පෝදා

## ධර්මාශෝක අධිරාජයා

මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව ධර්මාශෝක අධිරාජයාගේත් වේදිසා දේවියගේත් පුතණුවන් ය. මෞර්ය රාජ්‍ය වංශයේ ආරම්භකයා වූ චන්ද්‍රගුප්ත රජුගේ මුණුපුරකු වූ අශෝක බින්දුසාර රජුගේ පුත්‍රයා ය. අශෝක රාජ්‍යත්වයට පත් වන්නේ බින්දුසාර රජුගේ ඇවෑමෙන් පසුවය. මෙම මෞර්ය රාජ්‍ය වංශයේ රාජ්‍ය ප්‍රතිපත්තිය වූයේ දිග් විජය රට තුළ ක්‍රියාත්මක කරවීමයි. එනම් මිනිසුන් තලා පෙළා රාජ්‍ය සීමාවෙන් පිටස්තර දේශයන් ද ස්වකීය අණසකට ගැනීමයි.

අශෝක අනුගමනය කළේ ද එම ප්‍රතිපත්තිය මය. අශෝක රජු ක්‍රියාත්මක කළ දිග් විජය ව්‍යාපාරයේ බිහිසුණුම අවස්ථාව කාලිංගග දේශය යටත් කර ගැනීම සඳහා කළ කාලිංග යුද්ධයයි. එයින් ජයගත් හෙතෙම මුළු මහත් දඹදිවට ම අධිරාජයා බවට පත් විය. ජනතාවට දැඩි විපත් ගෙනදෙමින් සිදු කළ එම පීඩාකාරී පාලන රටාව හමුවේ අශෝක රජුට චණ්ඩාශෝක යන නමක් ද පටබැඳුණේ ය.

ලෝක ඉතිහාසයෙහි බොහෝ පාලකයෝ තමන් ලැබූ යුදමය ජයග්‍රහණ මත උදම් වනු මිස සිදු කළ අපරාධවල බිහිසුණු බවක් නොදකිති. එහෙත් එයට වඩා හාත්පසින්ම වෙනස් ස්වරූපයක් අශෝක චරිතය තුළින් පිළිබිඹු කෙරිණි. යුදමය ජයග්‍රහණයත් සමඟම බලවත් මානසික පීඩාවෙන් යුතුව කල් ගෙවූ අශෝක අධිරාජයා එය සමනය කර ගැනීම පිණිස විවිධ ආගම්වල පිළිසරණ පැතී ය. එහෙත් ඒ එක ද ඉගැන්වීමකින්වත් පලක් නො වීය. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ දැක පැහැදී "අප්පමාදො අමතපදං....." යනාදී ධම්මපද ගාථාව මුල්කරගත් කෙටි ධර්මාවවාදයක් ලැබීමෙන් පසුව රජුගේ මානසික පීඩාව දුරුව ගියේ ය. අශෝක යුද සේනාව අතින් අශෝක රජුගේ සොහොයුරන් ද ඝාතනයට ලක්වුණි. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ යනු එසේ ඝාතනයට පත් එක් සොහොයුරෙකු ගේ පුත්‍ර රත්නයකි.

එදා තෙරුවන් සරණ ගොස් සැදැහැති බෞද්ධ මහෝපාසකයෙකු වූ අශෝක අධිරාජයා එතැන් පටන් සියලු සත්ත්ව වර්ගයා කෙරෙහි කරුණාව, දයාව, මෛත්‍රිය පැතිරවීය. දිග් විජය සපුරාම අත්හළ අතර ඒ වෙනුවට ධර්ම විජය ස්වකීය රාජ්‍ය පාලන ක්‍රමවේදය බවට පත්කර ගත්තේ ය. බුදුරදුන් වදාළ සක්විතිවන එලෙසින් ම අනුගමනය කළ එතුමා එතැන් පටන් "ධර්මාශෝක අධිරාජයා" බවට පත් විය.

## මිහිඳු මා හිමි

එවකට ශාසනයෙහි ප්‍රධානත්වය දැරුවේ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ය. උන්වහන්සේ හමුවට ගිය ධර්මාශෝක අධිරාජයා තමා දැන් ශාසනයෙහි උරුමකරුවෙකු දැයි විමසී ය. එයට උන්වහන්සේ දුන් පිළිතුර වූයේ ශාසනයෙහි ඥාතිත්වය ලැබීමට නම් තම දරුවෙකු සසුන්ගත කළ යුතු බව ය. මෙම අදහස මහරජු සිය වැඩිමහලු දරු දෙදෙනාට ඉදිරිපත් කළේ ය. එය ක්‍රියාත්මක කිරීමට ඔවුහු නොපැකිලිව ඉදිරිපත් වූහ. ධර්මාශෝක අධිරාජයාගේ රාජ්‍යත්වයෙන් සය වැනි වසරේ දී මහින්ද හා සංඝමිත්තා යන දරු දෙදෙනා පැවිදි වූහ. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ මිහිඳු මාහිමිගේ උපාධ්‍යායන් වහන්සේ වූ අතර මහාදේව මහරහතන් වහන්සේ ආචාර්යවරයාණන් වහන්සේ වූහ. උපතින් විසි වැනි වියේ දී ප්‍රව්‍රජ්‍යාභාවයට පත් මිහිඳු මාහිමියෝ නොබෝ කලෙකින්ම සිව්පිළ සිඹියාපත් රහතන් වහන්සේ නමක් බවට පත් වූහ.

## තෙවැනි ධර්ම සංගායනාව

ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 218 කට පසුව පැලලුප් නුවර අශෝකාරාමයේ දී තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වුණි. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ මෙහි ප්‍රධානත්වය දැරූ අතර මහරහතන් වහන්සේලා දහස' නමක් සහභාගි වූහ. ධර්මාශෝක අධිරාජයා ප්‍රධාන දායකත්වය දැරීය. ධර්මාශෝක අධිරාජයා සැදැහැවත් බෞද්ධයෙකු බවට පත්ව බුදු දහමටත්, භික්ෂූන් වහන්සේලාටත් මහත් සේ අනුග්‍රහය දැක්වීම නිසා මිථ්‍යා දෘෂ්ටික අන්‍ය ලබ්ධිකයන්ගේ තත්ත්වය දිනෙන් දිනම පිරිහීමට පත් විය. එබැවින් ඔවුහු බුදු දහමට එරෙහිව දැඩි විරෝධතා ගෙන ගියහ. ඒ සමඟම ඔවුන්තර කොටසක් ජීවිකාව සඳහා සසුන් ගත වූහ. ඔවුන ගේ නොමනා හැසිරීම් රටාව නිසා බුදු සසුන ද අනුක්‍රමයෙන් කිලිටිව ගියේ ය. ශ්‍රමණ වේශධාරී මෙවන් මිථ්‍යා දෘෂ ටිකයන් ගෙන් සසුන බේරා ගැනීමට මහතෙරවරුන් වහන්සේලා නොපැකිලිව ගත් උත්සාහයක් ලෙස තෙවැනි ධර්ම සංගායනාව හඳුන්වා දිය හැකි ය. එසේම මෙමඟින් ගත් තවත් දූරදර්ශී තීරණයක් නම් එතෙක් දඹදිව සීමිත ප්‍රදේශයක පමණක් පැවැති බුදු දහම එවකට දැන සිටි රටවල් නවයකට ධර්ම දූතයන් මාර්ගයෙන් ප්‍රචාරය කොට හැරීමයි. ස්වකීය පුත්‍ර වූ මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ රාජකීය දූත පිරිසක් ම මෙරටට පිටත්කොට හැරීමෙන් පැහැදිලි වනුයේ ධර්මාශෝක අධිරාජයා ලක්දිව කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කල බවයි.

## දූත පිරිසෙහි සම්ප්‍රාප්තිය

දඹදිව වේදිසගිරි නුවරින් ලක්දිව අනුරාධපුරයේ මිහින්තලයට සැපත් දූත පිරිසට එහි දී දේවානම්පියතිස්ස මහරජු මුණ ගැසුණි. මිහිඳු මහරහතන් වහන්සේ මහරජුට ස්වකීය දූත පිරිස මෙසේ හඳුන්වා දුන්හ.

**සමණාමයං මහාරාජ**
**ධම්මරාජස්ස සාවකා**
**තමෙව අනුකම්පාය**
**ජම්බුදීපා ඉධාගතා**


මහරජතුමනි, ශ්‍රමණයන් වන අපි ධර්මරාජයාණන් වූ බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවකයෝ වෙමු. නුඹලාට අනුකම්පා පිණිස දඹදිව සිට මෙහි පැමිණියෙමු.

## බණ ඇසුමට මහ පිරිවර

ඉක්බිති මිහිඳු මහරහතන් වහන්සේ දේවානම්පියතිස්ස මහරජු පිළිබඳ විධිමත් බුද්ධි පරීක්ෂණයක් සිදු කළහ. අඹ පැනය හා නෑ පැනය ආදිය මුල් කරගෙන සිදු කළ එම බුද්ධි පරීක්ෂණයෙන් පසු දේවානම්පියත්සිස මහ රජු මනා බුද්ධිමතෙකු බව මිහිඳු මාහිමියනට අවබෝධ විය.

අනතුරුව පිරිස් සහිත මහ රජුට තෙරුවන් පිළිබඳවත් බෞද්ධ චින්තනය පිළිබඳවත් හඳුන්වාදීමට චුල්ල හත්ථිපදෝපම සූත්‍රය දේශයා කළේ ය. දේශනාවසානයෙහි මහරජු ප්‍රමුඛ හතළිස් දහසක් පිරිස තෙරුවන් සරණ ගියහ. මහින්දාගමනයෙන් දෙවැනි දිනයේ දී රජ මැදුරේ දී පේතවත්ථු, විමානවත්ථු, සච්චසංයුත්තාදිය මුල් කරගෙන ධර්ම දේශනා පැවැත්වීය. මුල් දිනයෙහි ධර්ම දූතයන් වහන්සේලා දුටු මිනිසුන් සිය අසල් වැසියනට ඒ ගැන දැන් වූ හෙයින් මෙම දෙවන දින බණ ඇසුමට දහස් ගණනින් ජනයා රජ මැදුරට එක්රැස් වූහ. ඒ සියලු දෙනාට රජ මැදුර ඉඩ මද වූයෙන් මහරජු මගුල් ඇත්හල සරසා එහි අසුන් පැනවීය. ඉක්බිතිව මිහිඳු මහරහතන් වහන්සේ පිළිවෙලින් දේවදූත බාලපණ්ඩිත, ආසීවිසෝපම, අනමතග්ගිය, ධම්මචක්කප්පවත්තන යනාදී සූත්‍ර දේශනාවන් පවත්වා දහස් ගණනින් ජනයා මාර්ගඵලාවබෝධයට පත් කරවූහ.

ධර්ම දූතයන් වහන්සේලාගේ වාසස්ථානය සඳහා "මහ මෙවුනා උයන" පූජා කළ මහ රජු මිහිඳු මාහිමි සමඟම එම උයන වටා ඇවිද සීමා මාලකාදිය පිහිටවිය යුතු තැන් නියම කරවා ගත්හ. දූත පිරිස අතර වූ භණ්ඩුක කුමරු පැවිදි උපසම්පදා කිරීමෙන් ලක්දිව මුල්ම පැවිදි උපසම්පදාව ද ඇරඹිණි.



ඌරුගමුවේ අස්සජී හිමි





# මිස්සක පව්වෙන් ගලා ගිය අමා සදහම් ගඟුල

**දඹදිව බින්දුසාර රජ පුත්, අශෝක, කුමාර අවධියේ පටන්ම රණශූරයෙකි. ස්වකීය යෞවන කාලයේ ම තක්සලා නුවර හටගත් කැරැල්ලක් කුමාරයෝ සාර්ථකව මැඩලූහ. කුමරු යුද්ධයෙහි පෑ බුහුටි බව දැක ප්‍රසාදයට පත් පිය රජතුමා විසින් අශෝක කුමාරයෝ උදේනි නුවර යුවරාජ පදවියට පත්කරනු ලැබූහ.**

බින්දුසාර රජතුමාගේ ඇවෑමෙන් රජකම පිණිස ස්වකීය සහෝදරයන් හා සටනට වැදී අශෝක යුවරාජ තෙමේ සොහොයුරන් මරා රජ පදවියට පත් වූයේ ය. ඉක්බිතිවැ තම පිය රජතුමා සහ මුත්තණු චන්ද්‍රගුප්ත අනුව ගිය අශෝක නරේන්ද්‍රයාණෝ බලය පා අසල රාජ්‍යයන් තම රාජ්‍යයට ඈඳා ගත්හ.

රජුගේ මේ චණ්ඩ ගති සොබා නිසාත්, සිහසුන සඳහා සොහොයුරන් මැරූ නිසාත් භාරතීය ජනයා අතර හෙතෙම චණ්ඩාශෝක නම් විය. රජතුමා කාලිංග රට සිය අණසක යටතට ගැනීමට කළ කාලිංග යුද්ධය ඉතාම බිහිසුණු වූවකි. මහා ජන සංහාරයේ දහස් සංඛ්‍යාත මළකඳන් ද, පොළොව තෙත් කළ රුධිර ගංගාව ද, අත්පා සිඳීමෙන් අසරණ වූවෝ ද දැක අශෝක හද සන්තානය සන්තාපයෙන් බරවැ සැලුණේ ය. පශ්චාත්තාපව හුන් මහ රජතුමාගේ කැළඹුණු මනසට සන්සුන් ගමනින් මහ මඟ වඩින නිග්‍රෝධ සාමණේර දසුන මහා ශාන්තියක් ගෙන දුන්නේ ය. චිත්ත ප්‍රසාදයට පත් නිරිඳාණෝ රාජපුරුෂයකු අත පණිවුඩ යවා සාමණේරයන් වහන්සේ රජ මැඳුරට වැඩමවා, සුදුසු තැන වඩා හිඳුවා, දන්පැන් පිළිගන්වා උන්වහන්සේ හා පිළිසඳර කථාවේ යෙදුණාහ.

රජුට දහම් මඟ කියාදීමට මේ සුදුසු ම අවස්ථාව බව දත් නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ රජ සිත දහම් මඟට යොමුකළ සේක. අනූපමේය මහා ශාසනික මෙහෙයක් ලෝසතහට අත්කරදීමට අවැසි සන්තානගත පරිවර්තනයේ මූලබීජ අශෝක හද සන්තානයේ රෝපණය කළෝ වයසින් කුඩා වූ, ආධ්‍යාත්මයෙන් වෘද්ධ වූ නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ ය.

උන්වහන්සේගේ දැමුණු ඉඳුරන්ගෙන් යුතුවූ පිය දසුන ද, පිය තෙපුළ ද, චණ්ඩාශෝක ධර්මාශෝක බවට පත් කළේ ය. ශාසනමාමක මහා උපාසකයකු බිහිකළේ ය.

"මහ රජතුමනි, සැබෑ ජය නම් රාජ්‍යයන් ජයගැනීම නොව ස්ව සන්තානය ජය ගැනීම ය. නුමුළා සිතින් ධර්මයේ අප්‍රමාදි වීමය. එවැන්නෝ නොමියෙති. යනුවෙන් තථාගත සම්බුදු වදන සාමණේරයන් වහන්සේ මහ රජතුමාට සිහි ගැන්වූහ.

සදහම් මඟ තබා සදහම් මඟ යමින් රටම ලේ විලක් කළ රුදුරු යුද්ධයෙහි, මනුෂ්‍ය ඝාතනයෙහි නිසරු බව පසක් කරගත් මහ නිරිඳාණෝ දිග්විජය හැරදා ධර්මවිජය පිළිවෙතෙහි යුහුසුළු වූහ. ජෛන ආගමිකයකු වූ එතුමා තිසරණයෙහි පිහිටා පන්සිල් සමාදන් වැ බෞද්ධ උපාසකයකු වූයේ ය. තුනුරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවක් ඇති කරගත් මෙතුමාණෝ ශ්‍රී සද්ධර්මය මැනවින් ප්‍රගුණ කළහ.

"සියලු රටවැසියෝ මාගේ දරුවෝ ය. මගේම දරුවන් කෙරෙහි මෙන් ඒ සැමගේ මෙලොවෙහි මෙන්ම එලොවෙහි ද යහපත සැලසීමට මම කැමැත්තෙමි."

"මුළු ලොවට හිත වැඩ සැලසීම මට අයත් කටයුත්ත කොට සලකමි. ලොවට හිත වැඩ කිරීමට වඩා වටිනා අන් යුතුකමක් නැති බැවිනි."

යනුවෙන් කළ ප්‍රකාශ තුළින් මහ රජතුමා බුදුදහමින් ලැබූ ආලෝකය මනාව පිළිබිඹු වෙයි. අශෝක අධිරාජයාගේ සන්තාන පරිවර්තනය මහා ධර්ම සංගායනාවකින් ශාසන ශුද්ධියකට ද, ලෝතලය සිසාරා සදහම් හඬ පතුරාලීමේ උත්කෘෂ්ට ධර්ම ප්‍රචාරක ව්‍යාපෘතියකට ද, අසූහාරදහසක් වෙහෙර විහාර ඉදිකිරීමට ද වශයෙන් මහා ශාසනික අභිවෘද්ධියකට හේතුභූත විය. දම්සෝ මහ නිරිඳුන්ගේ රාජානුග්‍රහයෙන් මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ ප්‍රධාන දහසක් රහතන් වහන්සේගේ සහභාගිත්වයෙන් පැළලුප්නුවර අශෝකරාමයේ දී සිදු කළ තුන්වැනි ධර්ම සංගීතිය, ලාභ සත්කාර අරමුණින් ම සසුනේ පැවිදි වූවත් වළකාලීමට ද සසුනේ චිර පැවැත්ම ට ද, ශ්‍රී සද්ධර්මය ලොව දස දෙස ප්‍රචලිත කිරීමට ද මහෝපකාරී විය.

අශෝක මහරජතුමාගේ ධර්ම ප්‍රචාරක සේවාවේ මහඟු ප්‍රතිඵලයකි, ලක්දිව බුදුසමය පිහිටුවීම. සිරිලකට සපැමිණි ධර්මදූත පිරිසේ මූලිකත්වය දැරූවෝ ධර්මාශෝක අධිරාජයාගේ පුත් මිහිඳු මහරහතන් වහන්සේ ය. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල, තෙරවරුන්ගෙන් ද, සුමන සාමණේරයන් වහන්සේගෙන් සහ භණ්ඩුක උපාසකගෙන් ධර්මදූත කණ්ඩායම සමන්විත විය.

මිස්සක පව්වට වැඩමවා සිටි මිහිඳු මහරහතන් වහන්සේ තිස්ස රජු අමතා

"සමණාමයං මහා රාජ – ධම්මරාජස්ස සාවකා

තවේව අනුකම්පාය – ජම්බුදීපා ඉධාගතා"

"මහරජතුමනි, අපි ධර්මරාජ සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු. ඔබට අනුකම්පාවෙන් දඹදිව සිට පැමිණියෙමු" යනුවෙන් තමන් වහන්සේ ප්‍රමුඛ පිරිස රජතුමාට හඳුන්වා දුන්හ. ඉක්බිතිව පිළිසඳර කථා නිමවා සුප්‍රකට අඹ පැනය, ඥාති පැනය, ආදියෙන් රජුගේ නැණ විමසා බුද්ධිය දැන ප්‍රසාදයට පත් මිහිඳු මහ රහතන් වහන්සේ චුල්ලහත්ථි පදෝපම සූත්‍රයෙන් ධර්මය දේශනා කළ සේක. තම අත රැඳි දුනු හී ඉවතලූ මහ රජාණෝ ද, හතළිස් දහසක පිරිවර ද, තිසරණයෙහි පිහිටා පංචශීලය සමාදන් වැ උපාසකයෝ වූහ.

එදා සිරිලක් දීපයට පෑයු පොසොන් සඳින් ලක්දිව සත්වගට ආලෝකය උදාවිය. ඉන් සම්මා ආජීවයෙන් සිරිලක් ජන දිවිය සැරසිණි. පංචශීලයෙන් සුසිල්වත්වැ සමාජ හිතකාමී ධාර්මික දිවිපෙවෙතකින් ජීවිතය රැක ගැනීමට හෙළයෝ පුරුදු වූහ. ලෝකයා නසන ආයුධ වෙළඳාමෙන් ඔවුහු වැළකුණාහ. මිනිස්කමට නිගාදෙන වහල් වෙළෙඳාම ඔවුහු පිටු දැක්කාහ. මෙත් සුතුරෙන් ආභාෂය ලත් හෙළ බොදු ජනයා එනිනෙකා හා දයාවෙන් බැඳුණාහ. කරුණා මෛත්‍රී සිතිවිල්ලෙන් එකිනෙකාට උපකාරවත්ව දිවිගෙවූහ. සතාසීපාවට ද කරුණාවෙන් සැලකූහ.

මස් පිණිස සත්ත්ව වෙළෙඳාම ඔවුහු පිළිකුල් කළහ. ප්‍රඥාව හීන කරන, සිහිය මොට කරන මත්වන දෑ විකිණීමට ද ප්‍රාණියකු නසන වස විෂ වෙළෙඳාම ද අත්හළ හෙළයෝ සම්මා ආජීවයෙන් දැහැමි ජීවනෝපායෙන් යුතු වූහ.

ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, ත්‍යාගයෙන් ප්‍රඥාවෙන් යුතුව කල්‍යාණ මිත්‍රත්වයෙන් එකිනෙකා සමඟි දමින් බැඳුණාහ.

ඉතිරිය 21 පිටුවට ...



උදම්මිට උත්තමාරාම
පුරාණ විහාරයේ
**මොරටුවේ**
**ආනන්ද හිමි**



# මිහිඳු මහරහතන් වහන්සේ දුටු අසිරිමත් දේශය

කැලණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ
අධ්‍යයනාංශයේ අංශාධිපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
**මකුරුප්පේ ධම්මානන්ද හිමි**



**නිර්මල ථෙරවාදී බුදුදහම සුරක්ෂිත කළ රටක් වශයෙන් ශ්‍රී ලංකාවට ලෝකය තුළ හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. විශේෂයෙන් වෙනත් ථේරවාදී රටවල් මෙන්ම මහායානික බෞද්ධ රටවල සුධීහු ශ්‍රී ලංකාවට මෙම ගෞරවය නොවක්ව පළකරති. මෙයට බලපාන ප්‍රධාන කරුණු රැසකි. මහින්දාගමනයත් සමඟ ලංකාවේ එතෙක් පැවති සමාජයීය සංස්කෘතිය වටපිටාවට නව්‍ය මුහුණුවරක් ලැබීමත් එහි හරපද්ධතීන් අඛණ්ඩව පවත්වාගෙන යාමත් ඊට පසුබිම් වන ප්‍රධාන කාරණා වේ.**

මෙරටට බුදුදහම රැගෙන ආ මිහිඳු හිමියන් ලක්දිවට පැමිණීමට බලපෑ කරුණ ඊටත් වඩා සැඟවුණු මහඟු කරුණක් බව මෙහිලා සඳහන් කළ යුතු ය.

සැබැවින්ම මිහිඳු මහරහතන් වහන්සේ තම ධර්මදූත මෙහෙවර වඩාත් ඵලදායක කර ගැනීමට ශ්‍රී ලංකාව තෝරා ගැනීම බෝසතාණන් වහන්සේ තම උපතට පස්මහ බැලුම් බැලීම හා සමාන කරුණකි.

මිහිඳු මහරහතන් වහන්සේ පැමිණීමට පෙර මෙරට දියුණු සාමාජීය සංස්කෘතික සහ ශිල්ප කලා ලක්ෂණ තිබුණු බවට ඉතිහාසමය සාධක, කතාපුවත්, පුරාවෘත්ත, සෙල්ලිපි සහ නටබුන් අදටත් සාක්ෂි දරයි.

ඊට පෙර මෙරට වනචාරී සමාජ සංස්කෘතියක් පැවති බව තහවුරු කිරීමට යමෙක් උත්සාහ දරයි නම් එය සත්‍යය විනිවිද දැකීමක් නොව හිතළු හෙළි කිරීමකි. ඓතිහාසික තොරතුරු අනුව මිහිඳු මහරහතන් වහන්සේගේ සම්ප්‍රාප්තියට පෙර පවා මෙරට ජනයා බුදුදහම පිළිබඳ දැඩි ලැදියාවකින් කටයුතු කළහ.

මහින්දාගමනයට පෙර ලක්දිව පැවති බෞද්ධ අවබෝධය පිළිබඳ කරන විමර්ශනයක දී භද්දකච්චායනා කුමරියගේ පැමිණීම අතිශය වැදගත් වේ. ඇය දෙතිසක් ස්ත්‍රීන් සමඟ මෙහි පැමිණ ඇත.

භද්දකච්චායනා කුමරිය බුදුරදුන්ගේ ඥාති සහෝදරයකු වූ පණ්ඩු නම් ශාක්‍ය වංශික රජුගේ දියණියක වූ බැව් ඓතිහාසික සාධක තුළින් ගම්‍ය වේ.

ඇය බුදුරදුන්ගේ සමීප ඥාතිවරියක වූවා නම් ඇය බුදුදහම නොදැන සිටියා යැයි කිසිසේත් සිතිය නොහැක. තවද කිරිමකුල්ගොල්ලේ සෙල්ලිපියක සඳහන් වන පරිදි යක්ෂ ගෝත්‍රික කෙර නමැත්තා විසින් භික්ෂූන් වහන්සේට ගල්ලෙනක් පිදූ බව සඳහන් වේ, එසේම බුදුන් වහන්සේ තෙවරක් මෙරටට වැඩම කිරීම අශ්‍රිත කරුණු රාශියක් නිසා මිහිඳු හිමියන්ගේ පැමිණීමට පෙර බුදුදහම පිළිබඳ උසස් අවබෝධයක් මෙරට ජනයා තුළ පැවති බවට සාධක හමුවේ.

එසේම තපස්සු භල්ලුක වෙළෙඳුන් දෙදෙනා ලංකාවේ දාගැබක් කළ බව දහතුන් වැනි සියවසේ රචිත පූජාවලියේ ස්ථිර කොටම සඳහන් කර ඇත.

ලොව පළමු චෛත්‍ය වන ගිරිහඬු සෑය ඇතුළු දාගැබ් 3 ක් පමණ මහින්දාගමනයට පෙර මෙරට ඉදි වී තිබුණි. දාගැබක ඇත්තේ පේළි දෙක තුනකින් කියා අවසන් කළ හැකි විද්‍යාවක් නොවේ.

දාගැබකින් කියන දර්ශනය, මනෝවිද්‍යාව, කෘෂිවිද්‍යාව, සමාජ විද්‍යාව වැනි දෑ වෙනම ම කතා කළ යුතු කාරණා ය. එවකට දාගැබ් නිර්මාණය කිරීමේ ශිල්පය තිබීමම ඒ වන විටත් උගත් හා බුද්ධිමත් ජනතාවකගේ උරුමය මේ පොළව තුළ ස්ථාපිත ව තිබු බවට සහතික ලෙස සැලකිය හැකි ය

මිහිඳු මහරහතන් වහන්සේ මෙරට දී මුල්ම වකවානුවේ දී දෙවනපෑතිස් රජතුමා ද ඇසුරු කොට ගනිමින් දේශනා කරන ලදැයි වාර්තා වන සූත්‍ර දේශනා වන චුල්ලහත්ථිපදෝපම සූත්‍රය, සමචිත්තපරියාය සූත්‍රය, සච්චසංයුත්ත සූත්‍ර, අනමතග්ගිය සූත්‍රය, දේවදූත සූත්‍රය, ආසිවිසොපම සූත්‍රය, අග්ගික්ඛන්ධොපම සූත්‍රය හා අප්පමාද සූත්‍රය වැනි සියලුම දේශනා ගැඹුරු දාර්ශනික හර පද්ධතියක් විවරණය කෙරෙන සූත්‍රාන්ත වේ.

මේවා බුදුදහමේ ගැඹුරුම සංකල්ප ප්‍රකට කෙරෙන ඒවා ය. මේවා තේරුම් ගැනීමට තරම් උගත් සබුද්ධික ජනතාවක් මෙරට වාසය කිරීම මිහිඳු මහරහතන් වහන්සේගේ චිත්ත ප්‍රමෝද්‍යයට හේතු වූවාට සැක නැත. එහෙයින්ම එතෙක් මෙරට පැවති බෞද්ධ පදනමට නව ජීවයක් දීමටත්, එමඟින්ම නව සංස්කෘතික ප්‍රබෝධයක් උදෙසා කැපවීමටත් උන්වහන්සේ තුළ හැඟීම පුබුදු කළා විය යුතු ය.

ධර්මාශෝක අධිරාජයාගේ ධර්මදූත ව්‍යාපෘතිය යටතේ විවිධ රටවලට වැඩි භික්ෂූන් අතුරෙන් දෙනමක් පමණක් යළි දඹදිවට නොපැමිණි බව ඓතිහාසික ව පිළිගෙන ඇත, උන්වහන්සේ දෙනම නම් මිහිඳු මහරහතන් වහන්සේ සහ යවන දේශයට වැඩි යෝනක ධම්මරක්ඛිත හිමියන් ය.

මිහිඳු මහරහතන් වහන්සේගේ දේහයේ අළු තැන්පත් කොට තැනූ ස්තූපයක් ගැන රජගල සෙල්ලිපියක සඳහන් වේ.

"මේ දීපයේ ශ්‍රී සමෘද්ධිය සඳහා වැඩම කළ මහින්ද තෙරුන්ගේ ස්තූපයයි."

යනුවෙන් එහි සඳහන් ය. මිහිඳු මහරහතන් වහන්සේ යළි දඹදිවට යාමට නොසිතා මෙරට ම වාසය කොට මෙහි ධර්මය ස්ථාපනය කිරීමට කැපවීම තම කාර්යභාරය බව සිතූ බව මෙයින් නිගමනය කළ හැකි ය.

ඉහත කරුණු අනුව බුදුරදුන්ගේ පාද ස්පර්ශයෙන් පූජනීය වූ අතීත ශ්‍රී ලංකාව උසස් ආර්ථික හා සංස්කෘතික පසුබිමක් සහිත රමණීය දේශයක් ව පැවති බවත්, එය මිහිඳු මහරහතන් වහන්සේගේ ධර්මදූත සේවාවට ඉවහල් වන බොහෝ අවශ්‍යතා සාධනය කර ගැනීමට පදනම් වූ බවත් සිතීම සුදුසු ය.

මිහිඳු මහරහතන් වහන්සේ වැඩම කළ පළමු දිනයෙහි ම කළ චුල්ලකම්මවිභංග සූත්‍ර දේශනාව අසා හතළිස් දහසක් දෙනා සෝවාන් ඵලයට පැමිණි බව සඳහන් වේ.

මිනිසුන්ගේ පමණක් නොව දෙවියන්ගේ නෙත් විවර වීමක් ද මේදින සිදුවිය. ඒ ඒදින පැවිදි කරන ලද භණ්ඩුක සාමණේරයන් වහන්සේ අභිඥා පාදක චතුර්ථ ධ්‍යානයට සමවැදී ඉන් නැගිට මුළු දිවයිනට ම ඇසෙන ධර්ම ශ්‍රවණය සඳහා දේවාරාධනයක් ද කළහ. එසේම උන්වහන්සේ ඒදින පැමිණි දෙවියන්ට සමචිත්තපරියාය නම් සූත්‍ර දේශනාව සිදු කළහ. එම සමචිත්තපරියාය සූත්‍ර දේශනාව ධ්‍යාන, විදර්ශනා, මාර්ග ඵල හා නිර්වාණය ලබා ගන්නා ආකාරය විස්තර කෙරෙන ගැඹුරු ධර්ම පර්යායකි. සය ආකාරයකින් විදර්ශනා භාවනාව වඩන ආකාරය මෙහි විස්තර වේ.


මෙම සූත්‍ර දේශනාව අවසානයෙහි ධර්මාභිසමය ලද දෙවියන්ගේ සංඛ්‍යාව නියමයක් නැති අතර, අසංඛ්‍ය වූ නාග සුපර්ණයෝ සරණ ශීලයෙහි පිහිටියහ. මිහිඳු මහරහතන් වහන්සේ දෙසූ මෙම සූත්‍රය අසා දහසක් දෙනා සෝවාන් ඵලයට පත්වූහ.

උන්වහන්සේ දිවයිනට පැමිණි දෙවැනි දිනයේ සවස් භාගය වන විට දෙදහස් පන්සියයක් දෙනා සෝවාන් ඵලයට පත්වූහ. කෙසේ වෙතත් දවස ගෙවී යනු කිසිවකුට නො දැනුණි. තෙරුන් වහන්සේ දැන් සවස් වී ඇතැයි මිස්සක පර්වතයට වඩිනු පිණිස සූදානම් වූහ.

රජතුමා බුහුමන් සහිතව ඒ අසල තිබූ මහමෙවුනා උයන ආවාසයක් වේවා'යි සඟුනට පූජා කළේ ය. එහි ඒදින වැඩ විසූ තෙරුන් වහන්සේ පසුදින රජ මැඳුරෙහි දානය වළඳා නන්දන වනයෙහි දී අනමතග්ගිය සූත්‍ර දේශනා කළහ. එයින් පැවසෙන්නේ අක් මුල් නැති සංසාරය පිළිබඳව ය.

මහණෙනි, මේ සංසාරය අනවරාග්‍රය, මුලක් අගක් නො දත හැක්කේ යැයි තථාගතයන් වහන්සේ විසින් දේශනා කළ කරුණ මෙහි නොයෙක් ආකාරයෙන් විස්තර වේ. මෙසේ දින හතක් කළ අනුශාසනාවන් ශ්‍රී ලාංකික ප්‍රබුද්ධ ජනයාගේ මනස ධර්මාස්වාදයෙන් කුළුගැන්වීමට මිහිඳු මහරහතන් වහන්සේ සමත් වූහ.

ධර්මය පමණක් නොව ඊට අනුරූපී වූ සිරිත් විරිත් ද ධන ධාන්‍යය පමණක් නොව අධ්‍යාපන හා කලා ශිල්ප ඥානය ද මෙරටට ලබා දීමෙන් උතුම් ථේරවාද ධර්මය සුරක්ෂිත කිරීමට කටයුතු සම්පාදනය කළහ. මේ නිසා ලෝකයේ විශේෂ අවධානයක් ලංකාව කෙරෙහි ඇතිවිය.





# මිහිඳු මහ රහතන් වහන්සේගේ ලංකාගමනය

**ශ්‍රී ලාංකික සම්බුද්ධ ශාසන වංශ කතාවේ ශ්‍රේෂ්ටතම නාමය මිහිඳු මහ රහතන් වහන්සේ ය. උන්වහන්සේ සකල ජම්බුද්වීපයට අධිපති වූ ධර්මාශෝක මහ නිරිඳුන්ගේ අතිජාත පුත්‍ර රත්නය සේ ම මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේ වෙතින් ශාසනික දයාදය ලබා ගත් ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයෙකි.**

ධර්මාශෝක රාජ්‍ය සමය සම්බුද්ධ ශාසන ඉතිහාසයෙහි නවමු පරිච්ඡේදයක ආරම්භය විය. ධර්මාශෝක මහා නිරිඳුන්ගේ දායකත්වයත්, මොග්ගලීපුත්ත මහා රහතන් වහන්සේගේ මූලිකත්වයත් ඇතිව දහසක් මහා රහතන් වහන්සේගේ සහභාගිත්වයෙන් පැළලුප් නුවර අශෝකරාමයේ දී තෙවැනි ධර්ම සංගායනාව පවත්වා සසුන සුරක්ෂිත කිරීම උදෙසා පියවර රාශියක් ගත් අතර, ඉන් ප්‍රමුඛතම කාර්යයක් වූයේ නවරට ධර්ම ප්‍රචාරයයි.

මෙම නවරට ධර්ම ප්‍රචාරයේ දී තම්බපන්නි දේශය හෙවත් වත්මන් ශ්‍රී ලංකාවට ධර්මදූතයන් වශයෙන් වැඩම කළ කණ්ඩායමේ මූලිකත්වය දරන ලද්දේ මිහිඳු මහ රහතන් වහන්සේ ය. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල, යන මහා රහත් ස්ථවිරයන් වහන්සේලා හා සුමන සාමණේරයන් වහන්සේත්, භණ්ඩුක උපාසකත් ඊට අන්තර්ගත වූහ.

සමහර මූලාශ්‍රවලට අනුව භණ්ඩුක මෙම ගමනට එක් වන්නේ වෙදිසගිරියේ දී ය. සුමන සාමණේරයන් වහන්සේ ධර්මාශෝක මහා නිරිඳුන්ගේ දියණිය වූ සංඝමිත්තාවන්ගේ පුත්‍රයායි. භණ්ඩුක උපාසක මිහිඳු මාහිමියන්ගේ මෑණියන් වූ වේදිස දේවියගේ නැඟෙණියගේ දුවගේ පුත්‍රයායි. මේ අනුව රාජකීය පවුලට අයත් වූ කිහිප දෙනකු ගේ ම දායකත්වය මෙම ධර්මදූත ගමනට ලැබීම සුවිශේෂ ය.

ධර්ම ප්‍රචාරයට ලංකාව බලා වැඩමවීමට පෙර තොරතුරු බැලීමේ දී නිරීක්ෂණය වූවේ එවකට ලංකාවේ රජ කළ මුටසීව රජු වයෝවෘද්ධත්වයෙන් පසුවන හෙයින් ඔහුගේ රාජ්‍ය දායකත්වය ධර්මප්‍රචාරය සඳහා යොදාගත නොහැකි බවයි. එබැවින් ඔහුගේ පුත් තිස්ස කුමරු රාජ්‍යත්වයට පත්වන තුරු ධර්මදූත ගමන කල් දැමීමට තීරණය කළ මිහිඳු මාහිමියෝ අවශේෂ ධර්මදූතයන් සමඟ ස්වකීය මෑණියන්ගේ ගම් ප්‍රදේශය වන වෙදිසගිරියට වැඩම කළහ.

ඒ අශෝක රජුගේ අභිශේකයෙන් දාහත්වැනි වර්ෂයේ නොවැම්බර් මාසයේ දී ය. එහි වැඩම කිරීම හේතු දෙකක් ඇතිව සිදු වූවකි. ඉන් පළමුවැන්න ඥතීන් දැකීම ය. වෙනත් රාජ්‍යයකට වැඩම කළායින් පසු නැවත මවුබිමට පැමිණීම හා ඥතීන් දැකීම සිදුවීමටත්, නොවීමටත් හැකියාව ඇති හෙයින් ඥතීන් දැකීම ඒ අවස්ථාවේ කළ යුතු කාර්යයක් හැටියට උන්වහන්සේ සැලකූහ. එය සුමන සාමණේරයන් වහන්සේට මෙන් ම භණ්ඩුකට ද සිය ඥතීන් දැක කල්ගත කිරීමට අවස්ථාවක් විය.

අනෙක තිස්ස කුමරු රජවීම හා ධර්මාශෝක මහා රජුගෙන් ලංකා රාජ්‍යයට දහම් පඬුරු පිළිගන්වා අනතුරුව තිස්ස රජුගේ දෙවැනි අභිශේකය සිදු වන තෙක් රැඳී සිටීම අනෙක් හේතුව විය. මේ අනුව පෙනීයන්නේ මිහිඳු මාහිමියන් වහන්සේ ස්වකීය ධර්මදූත කාර්යය වඩාත් ඵලදායි අන්දමින් සිදු කිරීමට ගත් උත්සාහයයි.

මේ අතර මුටසීව රජු මිය යෑමෙන් තිස්ස කුමරු ලංකා රාජ්‍යත්වයට පත්විය. ඒ අශෝක රජුගේ අභිෂේකයෙන් දාහත්වැනි වර්ෂයේ දෙසැම්බරයේ දී ය. එනම් මිහිඳු මාහිමියන් වෙදිසගිරියට වැඩමවා මසකිනි.

තිස්ස රජු ස්වකීය නොදුටු මිත්‍ර ධර්මාශෝක මහා රජුට තමන් ලංකා රාජ්‍යත්වයට පත් වූ බව දන්වා තුටු පඬුරු හා හසුන්පත් සහිතව අරිට්ඨ ඇමති ප්‍රමුඛ දූතයන් යැවූ අතර, ඉන් ප්‍රීතියට පත් අශෝක රජු ද පැමිණි දූතයන්ට විවිධ වරප්‍රසාද ලබා දී තිස්ස රජුට දෙවැනි අභිෂේකය සඳහා අවශ්‍ය භාණ්ඩ සමඟ තුටු පඬුරු ද සමඟ තමන් බුද්ධ, ධම්ම, සංඝ තෙරුවන් සරණ ගිය උපාසකත්වයට පත් වූ බවත්, ඔබතුමන් ද තෙරුවන් සරණ යන ලෙසත් සඳහන් කරමින් හසුන් පත් ද එවීය.

අසෝක මහා රජු එවූ තුටු පඬුරු හා දෙවන අභිෂේකයට අවශ්‍ය භාණ්ඩ ද සතුටින් භාර ගත් තිස්ස රජු දෙවැනි වරටත් අභිෂේක කරමින් දේවානම්පියතිස්ස රජු බවට පත්විය.

මෙලෙස මාස පහක පමණ කාලයක් සිය ධර්මදූත සේවාවට සුදුසු කාලය එළඹෙන තෙක් බලා සිටි මිහිඳු මාහිමියන් වහන්සේ සිය කාර්යභාරය ආරම්භ  කිරීමට සුදුසු කාලය එළඹ ඇති හෙයින් ඒ සඳහා සූදානම් වන්නට විය. ඒ අනුව පොසොන් පුර පසළොස්වක පොහොය දින ඉහත නම් දැක්වූ ධර්මදූතයන් වහන්සේලා සමඟ උන්වහන්සේ ලංකාවට වැඩම කළහ.

උන්වහන්සේලා ලංකාගමනය ආරම්භ කළේ වෙදිසගිරියෙන් බවත්, උන්වහන්සේලාගේ ගමනාන්තය වූයේ මිස්සක පර්වතය හෙවත් මිහින්තලය බවත් අවිවාදිත ය.

එහෙත් උන්වහන්සේලා වැඩම කළේ කෙසේද යන්න පිළිබඳ ඒකමතිකත්වයක් නැත. මිහින්තලයේ දී මිහිඳු මාහිමියන් ප්‍රමුඛ ධර්මදූතයන් වහන්සේ හමු වූ දේවානම්පියතිස්ස රජු අසන ලද ඔබවහන්සේලා වැඩම කළේ කෙසේ ද යන ප්‍රශ්නයට මිහිඳු මාහිමියන්ගේ පිළිතුර වූවේ න ථලෙන න වාරිතා’ යන්නයි. එනම් ගොඩබිමිනුත්, මුහුදිනුත්, නොවන බවයි.

මේ පිළිබඳ විවිධ මත පවතී. මිහිඳු මාහිමියන්ගේ පිළිතුරට අනුව එය මතුපිටින් බලා උන්වහන්සේ අහසින් වැඩිය බව රජතුමා කල්පනා කිරීමෙන් එය සම්ප්‍රදාය බවට පත් වී එම මතය පිළිගැනීම වී ඇතැයි යන්න එක මතයකි.

අනෙක් අතට උන්වහන්සේ ඍජුව ම වැඩිය ආකාරය නොපවසා එසේ ප්‍රකාශ කිරීමෙන් එහි ගූඪ අර්ථයක් පවතින බවට ද මතයක් පවතී. බෞද්ධ තර්ක ක්‍රමය උපයෝගී කර ගෙන එම ප්‍රකාශය කරන්නට ඇතැයි එම මතයයි.

එනම් මුහුදිනුත්, ගොඩබිමිනුත් යන මාර්ග දෙකින් ම වැඩම කළ බව ද යන්න විමසිය යුතු වෙයි. එහි දී වෙදිසගිරියේ සිට ශ්‍රී ලංකාවට පැමිණීමට ඇති මාර්ග මොනවාදැයි විමසීම වැදගත් වෙයි. ඒ සඳහා මාර්ග දෙකක් භාවිත වී ඇත. ඉන් එකක් වන්නේ වේදිසගිරියේ සිට ගොඩබිමින් බටහිර වෙරළේ සුප්පාරක, භාරකච්ච වැනි තොටුපලකට පැමිණ එතැන් සිට මුහුදු මාර්ගයෙන් ශ්‍රී ලංකාවට පැමිණීමයි.

අනෙක වෙදිසගිරියේ සිට දකුණු ඉන්දියාව හරහා පැවති මාර්ගයයි. ආර්යයන් දකුණු ඉන්දියාවට පැමිණි නර්මදා ගං ඉවුරේ පිහිටි මාහිස්මති හෝ මාන්ධාත නම් ස්ථානයට අවුත් එතැන් සිට වින්ධ්‍යා කඳුකරය තරණය කොට විදර්භ පතිට්ඨාන සහ අස්මක දේශය පසු කොට රායිචූර් සහ චිතල්දාග් දිස්ත්‍රික්ක හරහා දකුණු ඉන්දියාවේ කෙළවර දක්වා පැමිණ, එතැන් සිට මුහුදු මාර්ගයෙන් ශ්‍රී ලංකාවට පැමිණීමයි.

මින් පළමු මාර්ගයේ වැඩි දුරක් මුහුදින් ගමන් කරන හෙයින් එය මුහුදු මාර්ගය ලෙසත්, දෙවැන්න වැඩි දුරක් ගොඩබිමින් ගමන් කරන හෙයින් එය ගොඩබිම් මාර්ගය ලෙසත් සැලකේ. අනෙක මිහිඳු මාහිමියන් ඉහත කළ ප්‍රකාශයෙන් ඍජුව ම මුහුදු මාර්ගය හෝ ගොඩබිම් මාර්ගය යන එක මඟකින් නොවැඩි බවත්, ඉහත මාර්ග දෙකෙන් කවරකින් පැමිණියත් මුහුදින් හා ගොඩබිමින් යන මාර්ග දෙකෙන් ම පැමිණිය යුතු හෙයින් තර්කානුකූල අදහසකින් කළ ප්‍රකාශයක් බවත් සඳහන් කළ හැකි ය.

එසේම දකුණු ඉන්දියාවේ මලකූට ප්‍රදේශය මිහිඳු මාහිමියන්ගේ වැඩමවීමෙන් පූජනීයත්වයට පත්වූ බවට විශ්වාසයක් ප්‍රචලිතව පැවතීමත්, හියුංසාත් පවසන ආකාරයට මලකූට නම් කඳුකර ප්‍රදේශයේ පිහිටි නගරයකට නැඟෙනහිරින් මිහිඳු මාහිමියන් සංඝාරාමයක් කරවන ලදී. යන වාර්තාවත් මිහිඳු මාහිමි ප්‍රමුඛ ධර්මදූතයන් වහන්සේලා ස්වභාවික මාර්ග ඔස්සේ වැඩම කරන්නට ඇතැයි යන මතයට අනුබල දෙයි.

එමෙන්ම උන්වහන්සේ අහසට පැන නැඟී මිස්සක පව්වට වැඩම කළහ යන ඓතිහාසික පුවත ද මෙහිලා සිහිපත් කළ යුතු ය.

මේ ආකාරයට උන්වහන්සේ ලංකාට වැඩම කළ ආකාරය පිළිබඳ විවිධ මත පැවතුණත් සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය තිස් හත්වැනි වර්ෂයේ දී උන්වහන්සේගේ ලංකාගමනය සිදු වූ බව පිළිගැනීම වී පවතී. එය සැබෑ ලෙස ම සිදු වූ ඓතිහාසික සිද්ධියක්  බව ලේඛනගත තොරතුරුවලින් මෙන්ම මිහින්තලේ හා අම්පාර රජගල සෙල්ලිපි ඇසුරෙන් ද සනාත වී පවතී. උන්වහන්සේ ප්‍රධාන ධර්මදූතයන් වහන්සේගේ ලංකාගමනය ශ්‍රී ලංකාව තුළ නව ආගමික, අධ්‍යාපනික, සංස්කෘතික දේශපාලනික හා සමාජයීය සුවිශිෂ්ට පරිවර්තනයක ආරම්භය සනිටුහන් කළ බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.





කෝට්ටේ ශ්‍රී නාග
විහාරාධිපති
කෝට්ටේ ශ්‍රී කල්‍යාණී
සාමග්‍රීධර්ම මහා සංඝ
සභාවේ කර්මවාගාචාර්ය
කෝට්ටේ සිරි පැරකුම්බා
පරිවේණාධිපති
**මහියංගණයේ පඤ්ඤානන්ද හිමි**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## පොසොන් පුර පසළොස්වක 2022-06-14

# අභිමානවත් දේශයක ඇරඹුම

මිහිඳු මහරහතන් වහන්සේ හෙළදිවට වැඩම කළ උතුම් පොසොන්පුර පසළොස්වක පොහොය දිනය අදයි. බුද්ධ වර්ෂයෙන් දෙසිය තිස්හය වැනි වර්ෂයේ දී දඹදිව වේදිසාවේ සිට මිහිඳු මහරහතන් වහන්සේ හෙළදිව මිස්සක පව්වට හෙවත් මිහින්තලයට වැඩම කළහ.

මිහිඳු මහරහතන් වහන්සේ වැඩම කිරීමට පෙර පොසොන් පොහොය දිනය යනු හෙළදිවි වැසියන්ට සැනකෙළි දිනයකි. තිස්ස රජතුමා සේනා පිරිවරා මුවදඩයමේ ගියේ එබැවිනි. රජතුමාගේ පටන් සමස්ත රටවැසියාගේ ආහාර රටාවත්, සමාජ සංස්කෘතික පරිසරයත් ප්‍රාථමික විය. විනෝදකාමී ජීවිතයක් ගත කළහ. පෙර කිසිදු දිනක නොදුටු පිරිසක් දුටු රජතුමා ඔවුන් අමතා කවුරුන්දැයි ප්‍රශ්න කරයි. එහි දී මිහිඳු මහ රහතන් වහන්සේ

"සමණාමයං මහාරාජ - ධම්ම රාජස්ස සාවකා, තවේව අනුකම්පාය - ජම්බුදීපා ඉදාගතා" යන ගාථාවෙන් පිළිතුරු සපයති. රජතුමාගේ බුද්ධියත්, දැනුමත් පරීක්ෂා කිරීමට ඥාති ප්‍රශ්නය සහ අඹ ප්‍රශ්නය විමසති.

රජතුමාගේ බාහිර පෙනුම හෝ ඔහු කරමින් සිටි ක්‍රියාව හෝ නො සලකා මිහිඳු මහරහතන් වහන්සේ පළමුවෙන් ම පරීක්ෂා කරන්නේ බුද්ධියයි. මෙය බුදුරජාණන් වහන්සේගේ දේශනාවකි. රජතුමාගේ ප්‍රඥාවෙන් වැඩ ගැනීමේ කාර්යය ආරම්භ කරන්නේ අනතුරුවයි. එය නායකයකුගේ ප්‍රමුඛ ලක්ෂණයකි.

යම් ක්‍රියාවක් කිරීමට පෙර ඔහුගේ හෝ ඇයගේ ප්‍රඥාව සහ දැනුම විමසා බැලිය යුතු ය. රජතුමාත්, රටවැසියාත් පුරුදු වී සිටියේ ගස්, ගල්, පර්වත, නාග ඇදහිලි ආදිය විශ්වාස කිරීමටයි. ඒවා සම්පූර්ණයෙන් ම බැහැර කර ත්‍රිවිධ චෛත්‍ය වන්දනයට හුරු කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේත්, දළදා වහන්සේත්, පාත්‍රා ධාතූන් වහන්සේත් හෙළදිවට ලැබුණි. හෙළ රාජ්‍ය වංශය හෙබවූ රජවරු බුදු දහමට අපමණ භක්තියක් දැක්වූහ. සද්ධාතිස්ස, ධාතුසේන, මුගලන්, බුද්ධදාස, සිරිසඟබෝ වැනි උදාර නම් පවා තමන්ගේ නාමයන් සඳහා යොදා ගත්හ. ඔවුන්ගේ ජීවිතය සරල සහ දැහැමි විය. රටවැසියාත් ඒ මඟ යොමු කළහ. මුහුද පරදන මහ වැව්, අහස සිඹින දාගැබ් ඉදිවූයේ බෞද්ධාගම කෙරෙහි පැවැති ශ්‍රද්ධාව නිසා ය. මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට සම්බුදු දහම හඳුන්වාදීමත් සමඟ ගමයි, පන්සලයි, වැවයි, දාගැබයි සංකල්පය මුල්කර ගනිමින් හෙළදිව අපූර්ව සංස්කෘතියක් නිර්මාණය විය.

රටවැසියාගේ විනෝදය පිණිස අටළොස් කලාවක් හඳුන්වා දී බුද්ධි වර්ධනය සහ රසඥතාව වර්ධනය කළහ. අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය වැනි සාහිත්‍ය නිර්මාණත්, සඳකඩපහණ, සමාධි පිළිමය, ලෝවාමහාපාය, අවුකන පිළිමය වැනි විශ්මිත නිර්මාණත් බිහි වන්නේ ඒ හේතුවෙනි. හෙළ කලාවේ නූතන දියුණුවට සෘජුව සහ වක්‍රව මිහිඳු මහරහතන් වහන්සේගේ දේශනා බලපා තිබේ.

අරිට්ඨ කුමරුගේ සහ අනුලා දේවියගේ පැවිද්දත් සමඟ භික්ෂු සහ භික්ෂුණී ශාසනය ඇති විය. සමස්ත රටවැසියා ම උපාසක සහ උපාසිකා නාමයට අයත් වූහ. කුලයෙන් හෝ ධනයෙන් හෝ තනතුරින් හෝ උසස් යැයි හෝ පහත් යැයි හෝ නො සැලකූහ. ඔවුන්ගේ ක්‍රියාව ම අගය කළහ. පංචසීලය රටේ නීතිය බවට පත් කළහ. සමූහිකව වැඩ කිරීමේ සාර්ථකත්වය මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රායෝගිකව පෙන්වා වදාළහ. නූතනය තාක්ෂණයෙන් ඉතා ඉහළ ය. කාර්මීකරණය, නාගරීකරණය පෙරට වඩා දියුණු ය. භෞතික දියුණුව කොතරම් සාර්ථක මට්ටමක පැවතියත් ආධ්‍යාත්මික දියුණුව පහළ ස්ථරයක පවතින්නේ නම් එම සමාජය දිනෙන් දින පිරිහෙන බවත්, ලැබූ භෞතික දියුණුව නිෂ්ඵල බවත් මිහිඳු මහරහතන් වහන්සේ තථාගත ධර්මය ප්‍රායෝගික කරමින් පෙන්වා වදාළහ. මිහිඳු මා හිමියන් මේ ලක්දිව ධර්මද්වීපයක් කරන්නට මුල පිරූ අදවන් දිනෙක ඒ ප්‍රායෝගික ධර්මය අපගේ ජීවිතවලට ද පුරුදු පුහුණු කිරීමට අධිටන් කර ගනිමු.

# විමසිලිමත් බව පසුතැවිලි නැති කරයි

*නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස*

*න තං කම්මං කතං සාධු - යං කත්වා නානු තප්පති*
*යස්ස අස්සුමුඛො රොදං - විපාකං පටිසෙවති*



**"සු පින්වත්නි, සුගත තථාගත අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි සීසාන ගොවියකු අරභයා මෙම ගාථා ධර්මය දේශනාකොට වදාළ සේක.**

සැවැත්නුවර වාසී ගොවියෙක් නුවරට නුදුරු කුඹුරක් සානා පිණිස අලුයම කුඹුරට ගොස් ඉර අව්වෙන් වන පීඩාව නිසා හැකි ඉක්මනින් සී සාන්නට විය. රාත්‍රි භාගයේ සොරු කණ්ඩායමක් ඉසුරුමතකුගේ ගෙයක් බිඳ ධනය රැසක් සොරාගෙන මෙම කුඹුර මතින් ගොස් බෙදා ගන්නා විට එක් සොරකුගේ දහසින් බැඳි පියල්ලක් වැටී, ගෙන යන්නට අමතක විය.

අප බුදුරජාණන් වහන්සේ අලුයම මහා කරුණාවෙන් ලොව බලා වදාරණ සේක් මෙම ගොවියාට වන යහපත බලා වදාරා ආනන්ද හිමියන් සමඟ මෙම කුඹුර සමීපයට වැඩි සේක. මසුපියල්ල වැටී ඇති තැනින් වඩිනවිට බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන් අමතමින්

'ආනන්ද, විස සර්පයා දුටුවේ දැයි විචාළ සේක.

ආනන්ද හිමි පිළිතුරු දෙමින්"ස්වාමීනි විස සර්පයා දුටුවෙමි'යි කීය.

ගොවියා ද බුදුරදුන් වැඩිය පසු එ තැන පරීක්ෂා කරනුයේ සර්පයකු නොව මසු පියල්ලක් දැක එය වළලා සුරක්ෂිත කොට සීසාන්ට පටන් ගත්තේ ය. සොරු ගිය පා සටහන් අනුව රාජ පුරුෂයෝ ධන හිමියා සමඟ අවුත් පරීක්ෂා කොට මසු පියල්ල තිබූ තැනින් ගෙන ගොවියාට අවලාද කියා තලා පෙළා රාජ දඬුවමට ගෙන ගියහ.

ගොවියා ද අසරණ ව

"ආනන්ද විස සර්පයා දුටුවේදැයි" කීප විටක් ම කීවේ ය. රාජ පුරුෂයෝ එම ප්‍රකාශයේ අර්ථය කුමක්දැයි ඇසූ විට ගොවියා සියලු සිද්ධීන් රාජපුරුෂ යන්ට විස්තර කිරීමෙන් අනතුරුව ගොවියා රාජ දඬුවමින් නිදහස් විය.

අප බුදුරජාණන් වහන්සේ මේ සිද්ධිය නිමිති කර ගෙන මෙම ගාථා ධර්මය දේශනා කළ සේක.

යමෙක් යමක් කිරීමෙන් පසුතැවිලි වන්නේ ද, තැවෙන්නේ ද, කඳුළු සළන්නේ ද එවැනි කර්ම නොකිරීම යහපත් ය. එවැනි කර්ම කිරීමෙන් විපාක විඳින්නේ ය.

මෙම ගාථා ධර්මයෙන් ප්‍රධාන කාරණා කීපයක් ගම්‍ය වේ.

යමක් කිරීමට පෙර සිහිබුද්ධියෙන් කල්පනා කිරීම, සෑම කර්මයක ම විපාකයක් ලැබීම , පාප කර්මවලට අනිටු විපාක ලැබීම හා පින්කම්වලට ඉෂ්ට විපාක ලැබීමය.

නවීන විද්‍යාත්මක උපයෝගීතාවන් ඉතා සාහසික ලෙස තමන්ගේ ආත්මය සඳහා භාවිත කිරීමෙන් පාප ක්‍රියාවන් බහුල වශයෙන් සිදු වන්නේ ය. ශිෂ'ටාචාර ධර්මයන් ඉතා සුලුකොට සලකා ප්‍රාණඝාතා දී පස්පව් ක්‍රියාත්මකවීමෙන් මානව සමාජයට ම පසුතැවිලි වන්නට සිදුවීම ලෝකයේ උදාර ශිෂ්ටාචාරයන්ට මහත් අභියෝගයකි.

> **සමාජයෙන් පුද්ගලයාටත්, පුද්ගලයාගෙන් සමාජයටත් චින්තනය සම්ප්‍රේෂණය වන බැවින් අන්‍යොන්‍ය වශයෙන් වරද ආරෝපණය කිරීම තමාගේ යුතුකම පැහැර හැරීමේ වංචාවකි.**



අස්ගිරි මහා සංඝ සභාවේ මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත ත්‍රිපිටකාචාර්ය විනයකීර්ති ශ්‍රී සුමංගල

**අමුණුපුර පියරතන නා හිමි**

දැනට ක්‍රියාත්මක වන පස් පව්, දස අකුසල් නිසා සමස්ත ලෝකය ම ත්‍රාසයෙන්, භීතියෙන්, සැකයෙන් වෙළී පැටලී සිටී. එබැවින් ආගමික නායකයන්, රාජ්‍ය පාලකයන්, බුද්ධිමතුන්, එක්සත්ව එක්සිත්ව වර්තමාන ලෝක ජනතාවට ශාන්තියක් ලබා දීමට යෝග්‍යවන ක්‍රියාමාර්ගයක් ගත යුතු වන්නේ ය.

සත්වයාගේ ක්‍රියාකාරිත්වය ම කර්මය වශයෙන් හඳුන්වන අතර පරිසරය අනුව, කෙනකු පවට හෝ පිනට යොමුවන බැවින් සමාජයක් දූෂණය වන්නේ සමාජයේ ම වරදින් බව අප බුද්ධිමත් ව සිතා ක්‍රියා කළ යුතු ය.

විශේෂයෙන් සමාජයෙන් පුද්ගලයාටත්, පුද්ගලයාගෙන් සමාජයටත් චින්තනය සම්ප්‍රේෂණය වන බැවින් අන්‍යොන්‍ය වශයෙන් වරද ආරෝපණය කිරීම තමාගේ යුතුකම පැහැර හැරීමේ වංචාවකි.

අප බුදුරජාණන් වහන්සේ විසින් ඉතා කරුණාවෙන් පෙන්වා වදාළ උතුම් ධර්ම මාර්ගය පිළිබඳ අවබෝධයක් ලබා ගෙන පෙරමඟ හොඳින් සකස් කර ගන්නේ නම්, තම තමන් කරන කියන කර්මයන් ගැන පසුතැවිලි වන්නට අවශ්‍ය නැත.

මෙම ධර්ම දේශනාව කියවා ධාරණය කර ගැනීමෙන් පසුවට පසුතැවිලි වන ලෙස ක්‍රියා නොකරන්නට අදිටන් කර ගන්න.



# ආධ්‍යාත්මික ප්‍රබෝධයකට මඟ හෙළිකළ පින්බිම



ඓතිහාසික මිහින්තලාව අනුරාධපුර නගරයේ සිට ඊසාන දිසාවෙන් කිලෝමීටර 11ක් පමණ දුර ප්‍රමාණයක් ගිය කල මුහුදු මට්ටමින් මීටර් 309.27ක් උසින් යුක්ත වේ. ඓතිහාසික ශේෂ කන්ද ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් පැවති ඉතිහාසයක් පවතින්නා වූ පූජනීය ස්ථානයකි.

ශ්‍රී ලංකාවේ සොළොස්මස්ථානවලින් එකක් සේ සැලකෙන මිස්සකපව්ව පූජනීය ස්ථානයකි. මෙය අක්කර 450ක පමණ භූමි ප්‍රදේශයක ව්‍යාප්තව පවතින බව හඳුනාගත හැකි ය.

වංශකතා සාහිත්‍ය සාධකවලට අනුව මෙම ශුද්ධ භූමියේ සිංහ පොකුණ, නාග පොකුණ, කණ්ඨක චේතිය, මිහිඳු සෑය, අම්බස්තල දාගැබ, ආරාධනා ගල, ඉඳිකටු සෑය, කළුදිය පොකුණ, දාන ශාලාව, මහා සෑය, සන්නිපාත ශාලාව, ඇත් වෙහෙර මෙන්ම ඒ හා තදාසන්නව පිහිටි ආරාමික නටබුන් විශාල ප්‍රමාණයක් ද, සංඝයා වහන්සේ සඳහා දේවානම්පියතිස්ස රජතුමා විසින් පූජා කරන ලද ලෙන් 68ක නටඹුන් වර්තමානයේ වුව ද දැකගත හැකිවීම විශේෂයකි.

වර්තමානයේ ද දැකගත හැකි මිහිඳු ගුහාව මිහිඳු හිමියන්ගේ වාසය පිණිස පිළියෙළ කොට පූජාකර ඇති බව ජනවහරේ අතිශය ප්‍රචලිත ය.

මිහිඳු මහරහතන් වහන්සේ ලංකා ද්වීපයට වැඩම කරවීම ඓතිහාසික වශයෙන් ශ්‍රී ලාංකික ජනයාගේ සිතුම්, පැතුම් සාරධර්ම මෙන්ම අධ්‍යාපනික තත්ත්වය වැඩිදියුණු කිරීමට බලපෑ ප්‍රධාන හේතු සාධකයක් බවට පත්වූ බව පැහැදිලි තත්ත්වයකි.

මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස ලක්දිවට ආගමනය වූ අවස්ථාවේ දී ලක්දිව රාජ්‍ය පාලකයා ලෙස කටයුතු කරන ලද්දේ දේවානම්පියතිස්ස රජතුමා ය.

ඉන් අනතුරුව සංඝමිත්තා මෙහෙණිය ඇතුළු අවශේෂ පිරිස ලක්දිවට පැමිණීම, අරිට්ඨ කුමරු පැවිදිභාවයට පත්වීමත් සමඟ සංඝමිත්තා මෙහෙණියගේ මෙහෙයවීමෙන් අනුලා දේවිය පැවිදි බවට පත්වීමත් සමඟ මෙරට භික්ෂුණී ශාසනය ආරම්භ වූ අතර, උන්වහන්සේගේ වාසස්ථානය ලෙස මිහින්තලාව පත්වීමෙන් පසුව දේවානම්පියතිස්ස රජු විසින් ලෙන් 68ක් පූජා කළ බව ඓතිහාසික සාධක පෙන්වා දෙයි.

එම අවධියේ දී වාස්තු විද්‍යාත්මක වශයෙන් දියුණුව පැවති තත්ත්වයක් නොවන අතර එම ලෙන් පූජා කරන ලද්දේ උන්වහන්සේගේ දෛනික පාරිභෝජනය පිණිස බව අවබෝධ කොටගත හැක.

හිරු, සඳු, මහා පර්වත, මහා වෘක්ෂ මෙන්ම ගස් ගල් අදහමින් සිටි මිනිසුන් මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකා ගමනයත් සමඟ සසර කෙටි කර ගැනීමේ අරමුණු



අස්ගිරි මහා විහාරවාසී
ගෞරව ශාස්ත්‍රවේදී
**වල්පොල ධම්මානන්ද හිමි**

ඇතිව පැවිදි භාවයට පත්වන්නට වීම ද අතිශයින් වැදගත් ය.

එම අවධිය වන විට ඉතා දියුණු මට්ටමේ වාස්තු විද්‍යාත්මක ගොඩනැඟීම් නොපැවති අතර, මූලාරම්භක වකවානුවේ ස්වභාවික ගල්ලෙන් පිරිසුදු කර කටාරම් කොටා එමඟින් ඇතුළතට ජලය ගලා ඒම වළක්වා භික්ෂූන් වහන්සේට වාසය සඳහා එම ස්ථාන පූජාකොට ඇති බව සුවිශේෂී කරුණක් සේ සැලකිය හැක.

අම්බස්තලය දාගැබේ සිට නැගෙනහිර දිශාවට පහළට යන විට දැකගත හැකි පටු මාර්ගයක් ඔස්සේ ශිලාමය පියගැට පෙළක් පවතින අතර එහි මද දුරක් ගියවිට මිහිඳු මාහිමියන් වැඩ විසුවා යැයි සැලකෙන මිහිඳු ගුහාව දර්ශනය වේ.

එය මිහිඳු හිමියන් වැඩ සිටි ලෙන වශයෙන් දැනුදු හඳුන්වා දෙයි. ඒ බව සනාථ වන සාධක ඒ හාත්පස ස්වභාවික මෙන්ම සුන්දර දර්ශනයන්ගෙන් ප්‍රත්‍යක්ෂ කර ගත හැකි වේ.

මෙම පරිසරය සිත් සනහාලන, එමෙන්ම ඉතා සුව ජනක ස්ථානයක් වීම ද, රහතුන් වහන්සේ නමකට  සිත එකඟ කොට ගත හැකි ආකාරයේ මනරම් පරිසරයක් පැවතීම ද ඉතා සිත්ගන්නා සුළු ය.

මිහින්තලා කඳුකරය ආශ්‍රිත ප්‍රදේශයේ පවත්නා අනිකුත් ලෙන් අතුරෙන් මනරම් සුවිශේෂී පිහිටීමක් පවතින, ඉහළින් එකට ඒකාබද්ධ ව පවතින ගල් දෙකින් සෙවණ දුන් මෙම ස්ථානය දෙපසින් ම ස්වාභාවික පරිසරය විවෘතව පැවතීමත්, නිරතුරුව හමන සිසිල් සුළං ධාරාවන්ගෙන් යුක්ත වීම ද අතිශය වැදගත් වේ.

මෙම සුවිශේෂී ගල්ලෙන තුළම පවත්නා ස්වභාවික ගලෙහිම මනාව ඔපදැමූ ගල් ආසනයක් ද සකස් කර ඇති අතර, අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේට භාවනානුයෝගීව වැඩ විසීමට මෙන්ම සයනය කිරීමට ද, එම ස්ථානය මහෝපකාරී වී ඇතැයි ජනප්‍රවාදයේ පවතින්නකි.

ථූපවංශයේ සඳහන් කරන පරිදි බොහෝ දෙනාට අවවාද අනුශාසනා කරමින් මිහින්තලා පරිශ්‍රයේ ම වැඩ සිටි මිහිඳු මහරහතන් වහන්සේ පොසොන් මාසයෙන් පසු එළඹි වස්සමයේ එහි වස් වසන්නට ඇති බවත්, අසූ වසක් ආයු වළඳා උන්වහන්සේ මිහින්තලා පරිශ්‍රයේ චේතියගිරි පර්වතයේ දී පිරිනිවන් පෑ බව මහාවංශයේ සඳහන් කරයි.

මිහිඳු මහරහතන් වහන්සේ වාසය කළා යැයි සැලකෙන මිහිඳු ගුහාව මෙන්ම උන්වහන්සේට ම වෙන් වූ ලෙනක් ද මෙම ආරාම සංකීර්ණයේ පැවතුණේ යැයි ජනප්‍රවාදයක් පැවතිණ.

ලොව සියලු බැතිමතුන් මෙම පෞරාණික ඉදිකිරීම් මෙන්ම මිහින්තලා භූමියේ පවත්නා අතිශය වැදගත් සියලූම ස්ථාන නැරඹීමටත් ඒ හරහා සැදැහැවතුන් සිත් සතන් ආලෝක කර ගනිමින් පහන් සිත් පෙරදැරිව අති උතුම් නිර්වාණය ම ප්‍රාර්ථනා කළ යුතු අතිශය වැදගත් සුවිශේෂී ස්ථානයක් ලෙස  වැදගත් වන බව පැවසිය හැකි ය.

මහින්දාගමනය ශ්‍රී ලංකාවේ ප්‍රබුද්ධ සමාජ දර්ශනයකට මඟ උදා කළ අති උතුම් ඓතිහාසික දිනයක් වශයෙන් ඉතිහාස ගතවෙයි. මහින්දාගමනයේ මූලිකම අරමුණ වූයේ බුදු දහම නම් වූ සත්‍ය දර්ශනය ලාංකිකයන්ට අවබෝධ කරවීම ය.

එම සත්‍ය දර්ශනයේ අග්‍ර ඵලය නිර්වාණබෝධය යි. නිවන කරා ගමන් ගන්නා ප්‍රඥා මාර්ගය මහින්දාගමනයෙන් විවෘත වූ ආකාරය ලක්දිව වංශකථා සාහිත්‍යයේ විවරණය කෙරෙයි.

පුද්ගලයාගේ ආධ්‍යාත්මික දියුණුව මෙන් ම බාහිර දියුණුව ද සලසා ගන්නා ආකාරය පිළිබඳ ක්‍රමවේද හඳුන්වා දුන් මහින්දාගමනය මේ රටේ නව චින්තනයක් උදා කළ දිනයක් වශයෙන් ද අගය කළ හැකි ය.





# සදහම් දායාදයෙන් ලක්දිව ඒකාලෝක වූ වගයි

**ධර්මාශෝක නරේන්ද්‍රයාගේ පුත්‍ර මහින්ද කුමාරයාගේත්, රාජ දියණිය වන සංඝමිත්තා කුමරියගේත් නිවන් අවබෝධයට සුදුසු වූ පුණ්‍ය වාසනා සම්පත් අඳුරු ගුහාවක දිලෙන පහන් එළියක් සෙයින් දැක වදාළ අප මොග්ගලිපුත්ත තිස්ස මුනිදුන් ඔවුන් විසින් අනාගතයේ ගෞතම බුද්ධ ශාසනය බබළන බව ද නුවණින් දුටු සේක. නිරිඳුන් ඇමතූ මහතෙරුන් වහන්සේ මෙලෙසින් වදාළහ.**

"මහරජුනි, ඔබ ඉතා ත්‍යාගවන්තයෙක් වුණත් බුද්ධ ශාසනයෙහි දායාද ලැබුවෙක් නොවේ. ඔබ සිව්පසය පුදන දායකයෙක් පමණි. මහරජුනි යමෙක් තමන්ගේ පුත්‍රයකු හෝ දියණියක හෝ බුදු සසුනෙහි පැවිදි කරවනවා නම් ශාසන දායාදය ලැබුවෙක් වන්නේ ඔහු ය."

බබළන නුවණින් යුතුව තෙරුන් වහන්සේ වදාළ මේ වදන් පෙළ.... මතු දිනෙක ලංකා ධරණිතලයේ සම්බුද්ධ ශාසනය බබළවන මූල බීජය විය.

පිය සෙනෙහස හදේ දරාගත් ධර්මාශෝක නිරිඳුන් විසින් ශාසන දායාදය පතා බුද්ධි බලයෙනුත් - රූප බලයෙනුත් බබළන මිහිඳු නැමැති ප්‍රිය පුත්‍රයාත්, සංඝමිත්තා නැමැති රාජ දියණියත් මහත් ගරු සත්කාර සහිතව ගෞතම බුද්ධ ශාසනයෙහි පැවිදි කරවීය. පිය රජුගේ මනදොළ සපුරා දුන් මිහිඳු කුමරු ඒ වන විට විසිවැනි වියේ පසු වූ අතර සංඝ මිත්තා රාජ දියණිය දහඅට වැනි වියේ පසු වූවා ය.

අපගේ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ මිහිඳු කුමරුගේ උපාධ්‍යායන් වහන්සේ වූ අතර, මහාදේව තෙරුන් වහන්සේ කුමාරයා පැවිදි කරවූ සේක. උපසම්පදාවේ දී කර්ම වාක්‍ය පැවසුවේ මජ්ඣන්තික තෙරුන් වහන්සේ විසිනි. පැවිදි වූ දිනම උපසම්පදාව ලද මිහිඳු හිමියන් උපසම්පදා මාලකයේ දී ම සතර පටිසම්භිදා සහිතව උතුම් අරහත් ඵලයට පත් වී වදාළහ.

මිහිඳු මහරහතන් වහන්සේ පැවිදි උපසම්පදාව ලබා තුන් අවුරුද්දක් ඇතුළත දී සිය උපාධ්‍යායන් වහන්සේ වූ මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ වෙතින් තුන්පිටකය ම මැනවින් ඉගෙන, ශ්‍රී සම්බුද්ධ ශාසන ගගන තලය ශෝභමාන කළ හිරුමඬල සේ මිහිඳු මහ රහතන් වහන්සේ සුපතළ ව ගිය සේක.

සුගත තථාගත ශාසනය බබුළුවා ලූ අපගේ මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ තුන්වැනි ධර්ම සංගායනාව සමාප්ත කොට මහා මහින්ද මහ රහතන් වහන්සේ ඇතුළු තම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ වන ඉත්ථිය, උත්තිය, සම්බල, භද්දසාල නැමති රහතන් වහන්සේට "ඔබ වහන්සේ ඉතා රම්‍ය වූ ලංකාද්වීපයට වැඩම කොට ඉතා සොඳුරු වූ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනය පිහිටුවව්" යි පැවසූ සේක.

උන්වහන්සේ ගෞතම සම්මා සම්බුදු සසුන කෙරෙහි ලංකාද්වීපවාසීන් පහදවනු පිණිස ඊට සුදුසු කාලය බලාපොරොත්තුවෙන් වැඩ සිටි සේක. එවකට ලක්දිව රජ කළ මුටසිව රජු ඉතා මහලු බැවින් ඔහුගේ පුත් දේවානම්පියතිස්ස කුමරු රජ බවට පත් වූ පසු ලංකාද්වීපයට වැඩම කිරීමට අදිටන් කර ගත් අප මහරහතන් වහන්සේ ලංකා රාජ්‍යයේ අලුත් රජෙක් බිහි වන කාලය අතරතුර තමන් වහන්සේගේ ඥාතීන්ට අනුග්‍රහ පිණිස දක්ෂිණා ගිරි ජනපදයට වැඩිසේක.

සුදුසු කල් දන්නා අපගේ මිහිදු මහ රහතන් වහන්සේ මෙසේ අධිෂ්ඨාන කොට වදාළ සේක.

"මාගේ පිය රජුගේ මෙහෙයවීමෙන් සිදු කෙරෙන දෙවැනි අභිෂේකෝත්සවය දේවානම්පියතිස්ස මහ රජු අනුභව කරත්වා!

පියරජු විසින් යවනු ලබන දූතයන්ගෙන් තුනුරුවන් ගුණ අසා දැන ගනිත්වා!

ඒ දෙවැනි පෑතිස් රජු ලබන පොසොන් පොහෝ දිනයේ දී මිස්සක නැමැති පර්වතයට නඟීවා! ඒ දවසෙ ම අපි උත්තම ලංකාද්වීපයට යන්නෙමු."

උතුම් පොසොන් පොහෝ දිනය උදා විය. ඒ අප භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පා දෙසිය තිස්හය වැනි වර්ෂය යි. ලංකාද්වීප ප්‍රසාදක ගුණයෙන් යුතු, ලංකාවට ශාස්තෘන් වහන්සේ බඳු අපගේ මිහිදු මහ රහතන් වහන්සේ ලක්වැසි දෙවියන්ගෙන් පිදුම් ලබමින් ලංකාවේ යහපත උදෙසා ගුවන් ගැබෙන් වැඩම කොට වදාළ සේක. ඉත්ථිය, උත්තිය, සම්බල, භද්දසාල රහතන් වහන්සේත්, සුමන සාමණේර රහතන් වහන්සේත්, භණ්ඩුක නැමැති අනාගාමී උපාසකතුමා සමඟින් රම්‍ය වූ මිස්සක පර්වතයේ ඉතා සිත්කලු වූ උතුම් අම්බස්තල ගල්කුල මත වැඩ සිටියහ.



පොල්ගහවෙල මහමෙව්නා භාවනා අසපු සංචිතයේ නිර්මාතෘ සහ අනුශාසක

**කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි**

හතළිස් දහසක් පිරිස පිරිවරා ගත් අපගේ දේවානම්පියතිස්ස රජු පොසොන් පුන් පොහෝ දිනයේ ම මුව දඩයම පිණිස මිස්සක පර්වතය දෙසට දිවයන්නට විය.

ගෝන මුව වෙස් ගත් පර්වතවාසී දේවතාවකුගේ මෙහෙයවීමෙන් දේවානම්පියතිස්ස රජු දහම් දායාදය දරා වැඩ සිටි මිහිඳු මහරහතන් වහන්සේ අබියසට ම පැමිණියේ ය. දුටු දසුනෙන් රජු තැති ගත් බව දැනගත් රහතන් වහන්සේ "මහ රජුනි, අපි ධර්මරාජයාණන් වහන්සේගේ ශ්‍රාවක වූ ශ්‍රමණයෝ වෙමු. ඔබ කෙරෙහි අනුකම්පාවෙන් ම දඹදිව සිට මෙහි ආවෙමු." යි වදාළහ.

මහා නුවණැති තෙරුන් වහන්සේ අඹ පැනය විමසා රජු නුවණැතියකු බව වටහාගෙන අප මුනි රජුන් වදාළ චූල්ල හත්ථිපදෝපම සූත්‍රය මුල් කොට රජුට දහම් දෙසූ සේක. පුණ්‍ය සෘද්ධි ඇති අප මහ රජ්ජුරුවන් වහන්සේ, සතළිස් දහසක් වූ පිරිවර මිනිසුන් සමගින් තෙරුවන් සරණෙහි පිහිටියාහු ය. දහම් මෙහෙවරෙහි බර දරා ගත් අප මහරහතන් වහන්සේ පසුදින රාජ මාලිගයට වැඩම කොට පේත වත්ථු, විමාන වත්ථු ඇසුරෙන් දහම් දෙසද්දී අනුලා දේවිය ප්‍රධාන පරිවාර ස්ත්‍රීන් සෝතාපන්න ඵලයට පත් වූහ.

එදින රැස්වූ නුවර වැසියන්ට දේවදූත සූත්‍රය මුල් කොට දහම් දෙසද්දී ඔවුන් අතරින් දහසක් දෙනා දහම් ඇස උපදවා ගත්තාහු ය.

ෂඩ්අභිඥලාභී, චතුපටිසම්භිදාලාභී අපගේ මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවාසීන් කතා කරන දීප භාෂාවෙන් ම ධර්මය වදාළ සේක.

සුළු කලක දී ම ලංකාද්වීපය ද, දඹදිව් තලය සේ කසාවතින් බැබළී ගියේ ය. මගඵලලාභී උතුමන්ගේ ගුණ තේජසින් ලක් දිවයින ශෝභමාන විය. සුදුවත් දරන ගිහි උපාසක උපාසිකාවන්ගෙන් ගැවැසී ගත්තක් විය. අනුකම්පා ඇති ලංකාද්වීපප්ප්‍රසාදක මහ රහතන් වහන්සේ අතීත බුද්ධශාසන ලක්දිව පිහිටි ආකාරයත්, ගෞතම සම්බුදුරජාණන් වහන්සේ තෙවරක් මෙහි වැඩම කොට බුදු පහසින් පාරිශුද්ධත්වයට පත් කළ පූජනීය ස්ථානත්, දඹදිව මුදුන් මල්කඩ බඳු වූ ද්‍රෝණයක් මුනි ධාතූන් වහන්සේ වඩා හිඳුවමින් ඉදිවන ස්වර්ණමාලී මහා සෑරජුන් පිහිටන ස්ථානයත් ඇතුළු සියලු තොරතුරු මැනවින් පෙන්වා දුන් සේක.

තථාගතයන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේත්, බොහෝ සර්වඥ ධාතූන් වහන්සේත් ලබාදී මේ ලංකාද්වීපය දිවමන් මුනි රජුන් වැඩ සිටින සුගන්ධ කුටියක් බවට පත් කරවූ සේක.

රන්කොත්වලින් පැන නඟින රන් රැසින් අහස්කුස බබළවන, කිරි සුදෙන් බබළන සෑ රජාණන් වහන්සේගෙන් ශෝභමාන පින්බිමක් බවට හෙළදිව පත් කරවූ සේක.

අපට ශාස්තෘන් වහන්සේ නමක් බඳු වූ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ මහරහතන් වහන්සේ බිහි කොට, ඒ උතුමන් මුව මුව අමා දම් පද රැඳවූ සේක. ඒ දහම් සරින් දෙව් මිනිස් ලොව ඒක නින්නාද කරවූ සේක. සිල් රකින, ගුණ පුරන, දන් පුදන උවසු උවැසියන් බිහි කළ සේක. ලක්වැසි දනන් හට ධර්ම විනය මැනවින් පහදා දුන් සේක.

උත්තම ශ්‍රී මහා බෝධි දක්ඛිණ ශාඛාව ලංකා දීපයට වැඩම කරවා දුන් සේක. සිරිමා බෝ සමිඳුන්ගේ ආශීර්වාදය ලක්වැසි දනන් හට සලසා දුන් සේක. සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ ලංකාද්වීපයට වැඩම කරවා ලක්වැසි කතුන්ට ගෞතම බුදු සසුනේ පැවිදි උපසම්පදාවට මං විවර කර දුන් සේක.

අපගේ මිහිඳු මහරහතන් වහන්සේ පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන උතුම් සම්බුද්ධ ශාසනය මෙහි පිහිටුවා ඉතා යහපත් ලෙස ත්‍රිපිටක ධර්මය කටපාඩම් කරවීම් ආදියෙන් භාණක පරම්පරා බිහිකොට ලංකාද්වීපය බැබළවූහ. ලංකාවට මහත් පිහිටක් ලබා දුන්හ. මහා සංඝ පිරිවරකින් යුක්ත වූහ. මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට ශාස්තෘන් වහන්සේ හා සමානව සත්වගට සෙත සදමින් නිවන් පුරට මං දෙසූ සේක.

තිස් දෙහැවිරිදි වියේ දී ලංකාද්වීපයට වැඩම කොට වදාළ අපගේ මිහිඳු මහරහතන් වහන්සේ අසූ වෙනි වියතෙක් කෙදිනකවත් නැවත දඹදිව් තලයට නොවැඩි සේක. අප කෙරෙහි අනුකම්පාවෙන් අපට සෙත සලසමින් මෙහි ම වැඩහුන් සේක. උපසම්පදාවෙන් සැට වසරක් ගත වූ අපගේ මිහිඳු මහරහතන් වහන්සේ මිහින්තලා සෑ ගිරි විහාරයෙහි වැඩ වාසය කළහ. ලොව එළිය කළ හිරු මඬල බැස යන සෙයින් වප් මස පුර අටවක දිනෙහි අපගේ මිහිඳු මහ රහතන් වහන්සේ පිරිනිවන් පා වදාළ සේක.








මඟුල්දමන සුමංගල දහම්පාසලට අඩුපාඩුවක්ව පැවැති ඩෙස් බංකු පරිත්‍යාග කිරීමක් පසුගිය දිනෙක සිදුවිය. දරුවන් තුන්සියයක් පමණ අධ්‍යාපනය හදාරන එම දහම් පාසලට මෙසේ පරිත්‍යාග කිරීම පිළිබඳ මව්පියන්ගේ ප්‍රසාදය හිමි විය.


**විහාරස්ථානයකට අවුරුදු 18 - 25 අතර රියදුරෙකු අවශ්‍යයි.**

අමතන්න.
072-2124542

**කාරුණික දැන්වීමකි**

සියලුම දුසිරිත්වලින්ද පවුල් බරින්ද තොර උකස් අවංක නිරෝගී ධාර්මික බෞද්ධාගමික වැඩිහිටියකු හවනා අසපුවක ආරණ්‍යයක කැපකරු කළමනාකරු වශයෙන් රැකියාවක් පතයි. ජීවත්වීමට ප්‍රමාණවත් දීමනාවක් අපේක්ෂිතයි.
070-3605140

**වස්කාලයට ආරාධනා !**

එළඹෙන වස් තුන්මාසය ප්‍රතිපත්ති පුරමින් වැඩ සිටීමට ස්වාමීන් වහන්සේලා අමතන්න. නිදහස් කුටි සේනාසන ඇත.

**සුද්දැල්ලාව ආරණ්‍ය සේනාසනය**
ඉහළ හෙවෙස්ස, පිටිගල.
071-4447028 / 071-7301334

**විශ්‍රාමික මාතාවක් සමඟ බණ භාවනා කරමින්**

ගෙදර ඉවුම් පිහුම්, පිරිසිදු කිරීමේ කටයුතු කළහැකි නිරෝගී බුද්ධිමත් කාර්යක්ෂම

**කාන්තාවකට ඇරයුම් කරමි.**

කොරෝනා හා ID සහතික ගෙනෙන්න වැටුපක් ගෙවමි.
0112-843254

A හෝ O වර්ගයේ
**වකුගඩුවක් ඉතා ඉක්මනින් අවශ්‍යයි.**



වේල්ස් කුමර විද්‍යාලයීය ආදිශිෂ්‍යයෙකු, අවුරුදු 11 සහ 13 වයසේ දරු දෙදෙනෙකුගේ පියෙකු වන
**දශික පීරිස්**
සොහොයුරා හට A(+/-) හෝ O(+/-) වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මනින් අවශ්‍ය කර ඇත.
MediGain (Pvt) Ltd ආයතනයේ කලින් සේවය කර ඇති ඔහු දැනට HealthReconConnect (Pvt) Ltd ආයතනයේ සේවය කරනු ලබයි
ජීවිතයක් බේරා ගන්න සහය වන්න.
වැඩිදුර විස්තර සඳහා පහත දුරකථන අංක අමතන්න
නිලුකා මල්කාන්ති : 075 3 344 570
දශික පීරිස් : 077 2 106 317



## පින සහ කුසලය එකක්ද? දෙකක්ද?

- පින යනු කය හා වචනින් කරන කියන යහපත් ක්‍රියා පින්.
- පව යනු කය හා වචනින් කරන ක්‍රියා නරක අයහපත් ක්‍රියා.
- කුසල් යනු සිතේ ඇතිවන දයාව, මෛත්‍රිය, කරුණාව වැනි සිතේ ඇති වන යහපත් සිතිවිලි.
- අකුසල් යනු සිතේ ඇතිවන ලෝභ, තණ්හා, ක්‍රෝධ, ඊර්ෂ්‍යා, වෛර නිසා සිතේ ඇතිවන නරක සිතිවිලි.

බුදුරජාණන් වහන්සේ පින් හතක් සහ පව් හතක් ගැන දේශනා කර ඇත. එනම් වචනින් කරන සම්මා වාචා පින් හතර, බොරු නොකීම, කේළම් නොකීම, පරුෂ වචන නොකීම, හිස් වචන නොකීමයි. කයෙන් කරන පින් තුන නම් සතුන් නොමැරීම, සොරකම් නොකිරීම, කාමයෙහි වරදවා නොහැසිරීමයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ තුන්වන ප්‍රතිපදාවේ ඇති සම්මා වාචා, වචනින් කරන පින් හතර සහ හතරවන ප්‍රතිපදාවේ ඇති සම්මා කම්මන්ත කයෙන් කරන පින් තුනත් සමඟ පින් හතකි.

වචනයෙන් කරන පව් හතර එනම්, මිථ්‍යා වාචා බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීමයි. කයෙන් කරන පව් තුන නම් සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීමයි. වචනින් පව් හතරත්, කයෙන් පව් තුනත් සමඟ පව් හතකි.

- කයට හා වචනයට කරුණාව, මෛත්‍රිය, දයාව, පරාර්ථකාමී වැනි සිතිවිලි ඇති කර ගැනීමට නොහැකි බැවින් කයට හා වචනයට කුසල් කිරීමට නොහැකිය.
- කයට හා වචනයට තණ්හා, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛර, ආත්මාර්ථකාමී වැනි සිතිවිලි ඇතිකර ගැනීමට නොහැකි බැවින් කයට හා වචනයට අකුසල් කිරීමට නොහැකිය.
- සිතින් සතෙකුට කන්න දෙන්න හෝ කෙනෙකුට යහපත් වචනයකින් උපදෙසක් වැනි යහපත් දෙයක් සිතින් කරන්න බැරි බැවින් සිතට පින් කිරීමට නොහැකිය.
- සිතින් කෙනෙකුට ගහන්න බණින්න වැනි නරක අයහපත් දෙයක් සිතින් කරන්න බැරි බැවින් සිතින් පව් කිරීමට නොහැකිය.
- සිතට තනියෙන් කුසල් අකුසල් කිරීමට හැකියාව ඇතත් කයට හා වචනයට සිතේ ආධාර නැතුව පින් පව් කිරීමට නොහැකිය.
- කෙනෙකුට යමක් දෙන්න හෝ බණින්න හෝ පළමුව සිතින් සිතිය යුතුය.
- සිතින් සිතන විට චේතනාවක් ඇති වේ. එම චේතනාව ක්‍රියාත්මක කළ යුත්තේ කය හෝ වචනයෙනි යමක් දීම, කයින් ක්‍රියාත්මක කරන විට පිනකුත් බණින විට පවකුත් සිදුවේ.
- එසේම යමක් දීමට සිතීමේ දී සිතේ ඇතිවන යහපත් සිතිවිලි නිසා කුසලයකුත් ඇති වේ.
- බැණීම සිතීම නිසා සිතේ ඇතිවන නරක සිතිවිලි නිසා අකුසලයකුත් ඇති වේ.


පහත සඳහන් පොත්වලින් පින් පව් කුසල් අකුසල් ගැන විස්තරත් කුසල් අකුසල්වල විපාක එකෙණෙහිම අත් විඳින බවත් දැනගත හැකිය.

- පින් සහ පව් - කුසල් සහ අකුසල් 120/-
- චිත්ත නියාම ධර්මය 125/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දූනුම 125/-
- සිත මනස සහ ආගම් 80/-
- හොඳ - නරක, පින් - පව්, කුසල් අකුසල් 100/-
- පින සහ කුසලය එකක්ද දෙකක්ද 200/-
- සිතෙහි සතුට ඇති කරගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න 125/-
- දූ දරුවන්ගේ සාරධර්ම අත්පොත 100/-
- පංච උපාදානස්කන්ධය 250/-
- සිත සහ මනසින් කුසල් අකුසල් කය හා වචනින් පින් පව් - 100/-
- ත්‍රිපිටකය හැදෑරීමට ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සරල බසින් සිංහල බසට නගන ලද කාණ්ඩ 48කින් යුත් ත්‍රිපිටකය සියලුම පොත් 25% වට්ටමකට ලබාගත හැකිය.

**සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම**

661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකථනඃ (011) 2685369, 2686925 ෆැක්ස්ඃ 2674187





# දුෂ්කරතා පැමිණියත්

# මෙවර පොසොන් පුණ්‍ය මහෝත්සවය අඩුපාඩුවකින් තොරව පවත්වනවා



**ආචාර්ය වළවාහැංගුණවැවේ ධම්මරතන නා හිමි**

**මිහිඳු මහරහතන් වහන්සේගේ ශ්‍රී ලංකා ගමනය ශ්‍රී ලංකාවාසී අප හැමදෙනාගේ ම ගත සිත සුවයට මහත් අස්වැසිල්ලක් ලෙස අදත් අපට දැනේ. එදු මේ රටේ විසූ බොහෝ ජන කොටස්වලට ද එය එසේම වන්නට ඇති.**

එසේ කියන්නේ උන්වහන්සේ දේශනා කළ නවතම දහම ඕනෑම ජන සමාජයක නිවීම සැනසීම පිණිස හේතු වූ දයාව, කරුණාව, මෛත්‍රිය, කළගුණ සැලකීම වැනි මානුෂික ගුණාංග මිනිස් හදවත් තුළ තහවුරු වන ආකාරයේ දහමක් වූ නිසා ය.

එදා පොසොන් පුර පසළොස්වක පෝදා අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට ථෙරවාදී බුදුදහම හඳුන්වා දුන්හ. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේ සතර නමත්, ෂඩ් අභිඥලාභී සුමන සාමණේරයන් වහන්සේත්, භණ්ඩුක නම් අනාගාමි උපාසකතුමාත් මිහිඳු මහ රහතන් වහන්සේ සමඟ මෙහි සැපත් වූහ.

ශ්‍රී ලංකාවට නිර්මල බුදු දහම බෙදා දුන් ඓතිහාසික පුණ්‍ය භූමිය මිහින්තලා පුදබිමයි. එදා අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ මේ පුණ්‍ය භූමියට වැඩම කර ලංකාවේ සම්බුද්ධ ශාසනය ප්‍රතිෂ්ඨාපනය කළේ මේ පුණ්‍ය භූමියේ දී යි. ඒ ලෝකයේ පළමු වාචික බුද්ධි පරීක්ෂණය සිදු වූ පුණ්‍යවන්ත දිනයයි.

මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස රජුගේ බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න දෙකක් අසන ලදී. ඒ අප කවුරුත් දන්නා අඹ ප්‍රශ්නය සහ ඥාති ප්‍රශ්නය යි. එදා එම සංවාදය වූ ස්ථානයේ අද සේල චෛත්‍ය රාජයාණන් වහන්සේ වැඩ සිටිති.

ඒ සෑ රජාණන් වහන්සේගේ ගර්භයේ අපගේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ඌර්ණ රෝම ධාතූන් වහන්සේ වැඩ සිටිති. ඒ වගේම අපගේ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු උන්වහන්සේගේ ආදාහනය සඳහා සුදුහඳුන් දර යොදාගත් අතර, ඒ දැවී ගිය සුදුහඳුන් දරවලින් ඉතිරි වූ අඟුරු හෙවත් අංගාරික ධාතූන් වහන්සේ සහ උන්වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේත්, අපගේ බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේ තැන්පත් කර ඉදි වූ සෑ රජාණන් වහන්සේ නමක් වැඩ සිටිති.

සුමන සාමණේරයන් වහන්සේ දෙවියන්ට ධර්මය ඇසීමට ආරාධනාවක් සිදු කළ ස්ථානයේ පිහිටි ආරාධනා ගල වගේම අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ විවේකීව වැඩ සිටි මිහිඳු ගුහාව මේ පුණ්‍ය භූමියේ පිහිටා තිබේ.

ඒ වගේම මෙම පුණ්‍ය භූමියේ ඇති තවත් සුවිශේෂී අංගයක් වන්නේ දේවානම්පියතිස්ස රජු විසින් අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ අනුදැනුම මත ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් වැඩමවා සිටුවා රෝපණය කළ අෂ්ඨඵල බෝධීන් වහන්සේ නමක් ද වැඩ සිටීමයි.

මෙවන් අසිරිමත් පුණ්‍ය භූමියක, අපරිමිත ගුණයන්ගෙන් කැටි වූ ඓතිහාසික උරුමයන්ට උරුමකම් කියන පින්බර බිමක 2022 පොසොන් උත්සවය සමරන්නේ කිනම් අයුරින් ද කියා අපි මිහින්තලා රාජමහා විහාරාධිපති භාරකාර ආචාර්ය වළවාහැංගුණවැවේ ධම්මරතන නා හිමිපාණන් වහන්සේ සමඟ කතාබහ කළෙමු. මේ උන්වහන්සේ මෙවර පොසොන් උත්සවය පිළිබඳ පළ කළ අදහස් ය.

මෙම වර්ෂයේ දී ඓතිහාසික මිහින්තලා පුණ්‍ය භූමිය කේන්ද්‍ර කරගෙන සිදු කරන්නේ 2330 වැනි ජාතික පොසොන් පින්කමයි. ජාතික පොසොන් පින්කමට සමගාමී ව අප විහාරස්ථානයේ සෑම වර්ෂයක දී ම පොසොන් පින්කම ආරම්භ කරන්නේ සති පිරිත් දේශනාවකින්. එම සති පිරිත් දේශනාව මෙවර සිදුවූයේ ජුනි මාසයේ 05 වැනි දා සිට 12 වැනි දා දක්වායි. ඉන් අනතුරුවයි ජාතික පොසොන් පින්කම ආරම්භ කරන්නේ.

මුළු මහත් ලෝකයම කොරෝනා වසංගතයෙන් දැඩි සේ පීඩාවට පත්වෙලා වර්තමානය වන විට එහි යම් සුවදායක තත්ත්වයක් අප රට වගේ ම ලෝකයාත් භුක්ති විඳින අවස්ථාවක. නමුත් මෙම වසරේ දී ශ්‍රී ලාංකිකයන් ලෙස අප දැඩි ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් සිටින්නේ. එනිසා වෙසක් පින්කම වගේම මේ උතුම් පොසොන් පින්කමත් නිසියාකාරයෙන් සැලසුම් කර ගත් ආකාරයෙන් ම සිදු කිරීමේ දී යම් යම් බාධාවන්ට මුහුණ දීමට සිදුව තිබෙනවා.

සමස්ත ශ්‍රී ලාංකීය ජනතාව ම දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටිනවා. මෙවර පොසොන් උත්සවයට අපට සෘජුව ම එය බාධාවක් වී තිබෙනවා.

කෙසේ වුවත් අපි සරණ ගිය භාග්‍යවතුන් වහන්සේ වදාළ ඒ ශ්‍රී සද්ධර්මය මෙම ධරණී තලයේ පිහිටුවා අවුරුදු 2330 ගත වෙන මොහොතේ මෙවර පොසොන් පින්කම අප සුපුරුදු පරිදි සිදු කිරීමට අපේක්ෂිතයි. ජාතික පොසොන් පින්කම සඳහා ජනතාවට අවශ්‍ය කරනු ලබන පහසුකම් ලබා දීමේ දී ද විශාල ගැටලුවක් ඇති වී තිබුණත්, ඒ සියලු දේ කළමනාකරණය කරගෙන අත්හැර දැමිය නොහැකි මෙම පින්කම අප විහාරස්ථානය මුල්කරගෙන බොහෝ දෙනාගේ සහයෝගයෙන් සිදුකරනු ලබනවා.

ඒ වගේම මේ මස 13, 14, 15 යන දින තුන තුළදී ශ්‍රී ලංකාවාසී මෙන්ම, ලෝකවාසී ඕනෑම කෙනකුට ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සර්වඥ ධාතූන් වහන්සේ සහ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ ධාතුන් වහන්සේ මෙන්ම අංගාරික ධාතූන් වහන්සේ වැඳ පුදා මහත්ඵල පින් රැස්කර ගන්නට පුළුවන්.

එනිසා අපි සැදැහැවතුන්ගෙන් කරුණාවෙන් යුතුව ඉල්ලා සිටින්නේ අවම පහසුකම් යටතේ වුව ද මිහින්තලා පුදබිමට පැමිණ සිත් සේ ධාතුන් වහන්සේ දැක වන්දනාමාන කර ගන්නා ලෙසයි. එලෙස අපගේ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේට අපි කෘතගුණ දක්වමු.

**නයනා නිල්මිණී**



# නොනැමෙන සිතෙන් ඇද නැති වැඩ



මහනුවර අස්ගිරි මහා විහාරයේ
කාරක සංඝසභික
හා උපාධ්‍යාය ධුරන්ධර
වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක
මහාචාර්ය

**තුඹුල්ලේ
ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**

**තැවෙන, ලතැවෙන, ගිනිගෙන, කකියවන මේ සසර ගින්නෙන් මිදීමට උත්සාහවත් වන අය වෙනුවෙන් කරණීයමෙත්ත සූත්‍රයෙන් ඉදිරිපත් කෙරෙන තවත් චරිත ලක්ෂණ දෙකක් අද දවසේ අපගේ මාතෘකාව බවට පත්වෙනවා.**

ඒ ලක්ෂණ දෙක ලෙස .. උජු හා සූජු " යන්න පෙන්වා දෙන්නට පුළුවනි. කායික, වාචසික හා මානසික වශයෙන් අප විසින් ඇති කර ගත යුතු නොනැමෙන, ඇද නැති සෘජු ගතිය උජු යන්නෙනුත්, ඒ කියන උසස් ගුණදහම වඩාත් ස්ථිරසාර ලෙස පවත්වා ගැනීම සූජු ලෙසත් පෙන්වා දෙන්නට හැකියාව පවතිනවා.

සමාජ සම්මත ගුණධර්ම, සාධාරණ පැවැත්ම, යුක්තිගරුක බව වැනි ගුණධර්ම ක්‍රියාත්මක වන සමාජයක ජීවත්වන පුද්ගලයන් විසින් මඳ මඳ වශයෙන් ජනිතව ක්‍රමයෙන් දියුණු කර ගතයුතු චරිත ලක්ෂණ දෙකක් ලෙස මෙය පෙන්වා දෙන්නට හැකියාව තිබෙනවා.

හැම විටම සෘජු ගුණයෙන් යුත් අය වැනෙන ,චපල සිතිවිලිවලින් බැහැරව අයුක්තියට, අසාධාරණයට විරුද්ධ,නො නැමෙන සිතෙන් ,ඇද නැති කථා කරනවා වගේ ම නිරතුරුව ම කිසිදු බියක් සැකක් නැතිව ජීවත්වීමේ ශක්තිය ඇති කර ගන්නවා.

අපි දවස ගතකරනවා කියන්නේ පැය විසිහතරක් ගතකරනවා කියන එකයි. මේ පැය විසිහතරෙන් අප නොනිදා ජීවත්වන කාලය අඩුම වශයෙන් පැය 16 හෝ ඊට ඉතා ස්වල්පයක් අඩුවෙන් විය හැකි යි. ඉතින් ඉතිරි පැය 08 ක පමණ කාලය අප නින්ද වෙනුවෙන් වෙන් කරනවා. මේ අවදිව සිටින කාලය ගත කරන්නේ අපේ සිතට විවිධාකාර සිතිවිලි රැසක් එකතු කරමිනු යි. මේ සිතිවිලි නිර්මාණය වන්නේ අපේ ඇස, කන, නාසය, දිව හා ශරීරය යන ඉන්ද්‍රියයන් මඟින් ලබා ගන්නා අරමුණු හා අපේ සිත ස්පර්ශ වීමෙනු යි. ඉතින් එසේ අප ලබන අරමුණු කොයි තරම් දුරට යුක්තිගරුක ද? යන්න තීරණය වන්නේ ඒ වෙලාවට අපේ සිතේ ඇති වන ක්‍රියාකාරිත්වය අනුව යි. කෙටියෙන් ම කියනවා නම් ලෝභ, දෝස හා මෝහ යන මේ ප්‍රබල කෙලෙස් තුන එකී අරමුණුවලට පාදක වන ස්වභාවය අනුව යි.

මේ තත්වය පිළිබඳ අපේ බුදුරජාණන් වහන්සේ වම්මික සූත්‍රයේ දී හොඳ පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරනවා. උන්වහන්සේ පෙන්වා දෙනවා වම්මික යන වචනයෙන් කියන්නේ තුඹස කියලා. ඒ තුඹස තමා අප දරා සිටින මේ ශරීරය. මෙහි ස්වභාවය තමා මේ ශරීරය රාත්‍රී කාලයේ දුම් දානවා. එයින් කියන්නේ දිවා කාලයේ කළ යුතු කටයුතු සම්බන්ධයෙන් තර්ක විතර්ක කරමින් ඒ පිළිබඳ විවිධ සිතිවිලි ඇති කර ගෙන ක්‍රියා කිරීම යි.

දවල් කාලයෙහි දිලිසෙනවා. ඒ මොකද? විවිධ කර්මාන්ත රැකියා හා වෙනත් කරුණු කාරණා ඉෂ්ට කර ගැනීම පිණිස දහදිය වගුරවමින් වෙහෙසනවා. ඉතින් අපි ජීවත්වන හැම තත්පරයක් ම එක්කෝ දුම්දාමින් ද ,නැතිනම් ඇවිළෙමින් තමයි ගත කරන්නේ. ඒ රාත්‍රී දුම් දැමීම යන්නෙන් අපේ මේ චිත්තසන්තානයෙහි ඇති වන රාග, ද්වේෂ, මෝහ, මාන, ඊර්ෂ්‍යා ආදි විවිධ අකුසල මූලයන් ඔස්සේ අපේ සිත ක්‍රියාත්මක වීම

**හැම විටම සෘජු ගුණයෙන් යුත් අය වැනෙන ,චපල සිතිවිලිවලින් බැහැරව අයුක්තියට, අසාධාරණයට විරුද්ධ,නො නැමෙන සිතෙන් ,ඇද නැති කථා කරනවා වගේ ම නිරතුරුව ම කිසිදු බියක් සැකක් නැතිව ජීවත්වීමේ ශක්තිය ඇති කර ගන්නවා.**

රත්වීමක්. ඒ රත්වීම වේගවත් වී ඇතුළේ ගිනිජාලා හට ගන්න තත්ත්වයට පත්වෙන කොට දුම් දැමීමක් හා සමාන වෙනවා.

ඉතින් ඒ රාත්‍රී කාලයේ පුද්ගල අභ්‍යන්තරය තුළ රත්වෙච්ච, ගිනි පිටවන්නට තරම් මෝරපු විවිධ සිතිවිලි උත්සන්ත වී ක්‍රියාත්මක වෙනවා. ඒ කියන්නේ ඒ ඇති කරගත් සිතිවිලි ක්‍රියාත්මක බවට පත් කරලීම යි. හැම විටම අපේ දවස ගත වන්නේ මේ කියන පිළිවෙල අනුව යි.

ඉතින් එහි දී පුද්ගලයාගේ මේ සන්තානගත හෙවත් මානසික ක්‍රියාවලිය පළමුවෙන් ම සන්සුන් කර ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු වෙනවා. එම කාර්යය වඩාත් හිතකර ආකාරයෙන් ක්‍රියාත්මක කර ගැනීමට නම් එහි දී අප විසින් ලබා තිබෙන මානසික හැදියාව අතිශයින් වැදගත් වනවා.

ඒ අනුව බලන කොට බහුල වශයෙන් දකින්නට ලැබෙන්නේ එවැනි පුද්ගලයා එළිපිට පෙන්වන චරිත ලක්ෂණයන්ට වඩා වෙනස් චරිත ලක්ෂණවලින් ඔහුගේ අභ්‍යන්තරය ක්‍රියාත්මක වන ආකාරය යි. එහිදී කිසි ලෙසකින් වත් එවැන්නකුගෙන් සෘජු බවක් අපේක්ෂා කරන්නට හැකියාවක් ලැබෙන්නේ නැහැ.

බුදුරජාණන් වහන්සේ වරක් කොසොල් මහරජතුමා හමුවේ දී ප්‍රකාශ කළේ පිටට පේන වර්ණවත්, රූමත්, දැකුම්කළු බවෙන් කිසියම් පුද්ගලයකු පිළිබඳ තීරණයකට පැමිණීමට නොහැකි බව. කෙනකුගේ යථා ස්වභාවය හඳුනා ගතහැකි වන්නේ දීර්ඝ කාලයක් ඇසුරු නිසුරු කිරීමෙන්, සාකච්ඡාවෙන්, මැනවින් විමසා බැලීමෙන් බවයි. මේ නිසා අපට මෙහි දී පැහැදිලිව පෙන්වා දෙන්නට හැකි වන්නේ උජු ගති ඇත්තන් සෙවීමේ කාර්යය දුෂ්කර වන බවයි.

සූජු යන චරිත ලක්ෂණයෙන් අර්ථ දක්වන්නේ මෙතෙක් ප්‍රකාශ කෙරුණු සෘජු ගුණය වඩාත් ස්ථිර සාර ලෙස ක්‍රියාත්මක කිරීම යි. බොහොම සාර්ථක චිත්ත ධෛර්යයෙන් ඇති කර ගත් අවංක බව හෙවත් සෘජු ගුණය කිසිදු බාධකයකින් තොරව ස්ථිර වශයෙන් පවත්වා ගෙන යාමයි. සැබවින්ම අප සමාජයේ ජීවත්වන විට එවැනි ස්ථිරසාර ලෙස ගොඩ නඟාගත් සෘජු ගුණය මොනම ආකාරයකින්වත් යටපත් වන්නට ඉඩ නොදී ක්‍රියාත්මක කිරීම යි අපට මෙහිදී වැදගත් වන්නේ.

මේ සෘජුගුණය ඉවත්වීමට ඇති වන ප්‍රධාන හේතුව වන්නේ බලවතුන්ට කීකරු වීමත්, නොයෙක් ලාභ ප්‍රයෝජන කෙරෙහි ගිජු වීමත් බව පැහැදිලි කරුණක්. ඡන්ද, දෝස, භය හා මෝහ යන සතර අගතියෙන් පෙළෙන තැනැත්තා මේ විදිහට ඇත්තට පිටුපා ක්‍රියා කරනවා. මේවා පුද්ගල සිතේ ඇති වන චිත්තවේග යි.

මිතුරුබව, බල තණ්හාව, නෑදැහිතවත්කම ආදි කරුණුවලට පමණට වඩා ගැති වුවහම ඕනැම කෙනෙක් මේ සෘජුගුණයෙන් පිරිහෙනවා. ඒකට හොඳම උදාහරණය තමා දේශපාලන පක්ෂපාති බව. කුමන පක්ෂයක හෝ ගැතිවීම තුළ සිදුවන්නේ සත්‍යය වසන් වීමට මඟ සලසා ගැනීම යි.

මේ අතර අප සන්තානයේ කාලාන්තරයක් තිස්සේ පැසවමින් පවත්නා ද්වේෂය ද පුද්ගලයා අන්දමන්ද කර සත්‍යයෙන් වළ කාලනවා. ද්වේෂයෙන් අගතියට පත් පුද්ගලයා අර්ථ අනර්ථය තේරුම් නොගෙන ක්‍රියාකිරීම මහත් අනර්ථයක් ලබා දෙන බේදවාචකයකට මඟ පාදනවා. කෙසේ වුවත් මෙය ද හේතු වීමෙන් සෘජු බව ගිලිහෙනවා.

සහජයෙන් ම අප තුළ පවත්නා තවත් මානසික තත්වයක් වන භය ද සත්‍ය වසන් කරන තවත් ආවේගයක් බව පෙන්වා දෙන්නට පුළුවනි.

ඒ වගේම තමා මෝහයෙන් වෙළුණු තැනැත්තාගේ ස්වභාවය. මෝහය කියන වචනයේ අර්ථය වන්නේ මුළාව යන්න යි. අප තේරුම් ගත යුත්තේ සත්‍යය වසාලන මේ අගති ආවේගයන්ගෙන් අපේ මනස ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම යි. මේ උජු කියන සෘජු ගතිය ඇති කර ගෙන, සූජු කියන එහි ඇද නැති, වැනෙන්නේ නැති ස්ථිරසාර සෘජු ගතිය තහවුරු කර ගැනීමටත් අවශ්‍ය කරන කරුණු හතරක් බුදුරජාණන් වහන්සේ අපට පැහැදිලි කර දී තිබෙනවා.


*ඉතිරිය 15 පිටුවට ...*



# සාඩම්බර අතීතයේ පාඩම්

# වර්තමානයට ප්‍රායෝගික කර ගනිමු





බළංගොඩ ශ්‍රී ධර්මානන්ද
පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහා නා හිමි**

**මහින්දගමනය මෙරට ඉතිහාසයෙහි සුවිශේෂී සන්ධිස්ථානයකි. ලාංකික සමාජය තුළ ආගමික, සාමාජික, ආර්ථික හා සංස්කෘතික වශයෙන් සිදු වූ වෙනස අවිවාදාත්මක ය.**

ගසට පොත්තත්, පොත්තට ගසත් මෙන් සිංහල ජාතිය හා බුදුදහම එකට වෙළාගත් අයුරු ඉතිහාසය තුළින් දැකගත හැකි ය. මේ ආකාරයෙන් ශ්‍රී ලංකා ජනතාව තම අනන්‍යතාව ලොවට පෙන්නුම් කළ අදීන ජාතියක් බවට පත්විය.

මිහිඳු හිමියෝ ශ්‍රී ලාංකික ජනතාවගේ ඇවැතුම් පැවැතුම් හා සිත් සතන් නිවැරැදි ව හඳුනාගෙන ධර්ම දේශනා කළ උත්තමයෙකි. උන්වහන්සේ දේශනා කළ ධර්මය අනුගමනය කිරීම ශ්‍රී ලාංකිකයන්ට දුෂ්කර කාර්යයක් නොවීය.

ගැඹුරු දර්ශනයක් ඉදිරිපත් කිරීමට වඩා උන්වහන්සේගේ අවධානය යොමු වූයේ මිනිසාගේ දෛනික ජීවිතය හැඩගැස්වීමටයි.

අකුසල් පැත්තෙන් ඉවත්කර කුසල් පැත්තට යොමුකරලීමත්, ඒ තුළින් අන්‍යයන්ට හිරිහැරයක්, කරදරයක් නොවන ආකාරයට තම ජීවිතය නිවැරැදි මගකට යොමුකර සැනසිලිදායක. සුවදායක ප්‍රජාවක් බිහිකරලීමත් තමන්වහන්සේ දේශිත, ධර්මයෙහි අරමුණ විය.

රටක් නිවැරැදි මඟට යොමුකරලීමට නම් ඒ රටේ පාලකයා ආදර්ශ සම්පන්න විය යුතු ය.

මිහිඳු හිමියන් මුලින්ම කළේ රටේ පාලකයා නිවැරැදි පුද්ගලයකු බවට පත්කරලීමට අවශ්‍ය මඟ පෙන්වා දීමයි. එනම් පන්සිල් සුරකින පාලකයකු රට තුළ ඇතිකර ලීමයි.

යක්ෂ, නාග වශයෙන් මෙරට පැවැති ගෝත්‍ර බේද මිහිඳු හිමියන්ගේ ආගමනයත් සමඟ වෙන්වී සමගි සම්පන්න සමාජයකට මඟ පෑදිණි.

දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව වැනි වටිනා උතුම් ගුණධර්මයන් තුළින් සමාජය තුළ තිබිය යුතු සමානාත්මතාවය තවතවත් වර්ධනය වූ අතර මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා ගුණයන් ක්‍රියාත්මක කිරීම තුළින් ගැටුම්වලින් තොරව අන්‍යෝන්‍ය ප්‍රියශීලි සබඳතාව ගොඩනංවන සමාජයක් ඇතිවූ බව පෙන්වා දෙන්නට පුළුවන.

මිහිඳු හිමියන් වැඩම වීමෙන් සිදුවූ උදාරම මෙහෙය නම් මිනිසාගේ පිබිදීමේ සිට රාත්‍රී නින්දට යන තෙක් මුළු දවසම බෞද්ධ දින චරියාවකට අනුව සැකසෙමින් තමන් ගැන මෙන් ම අනුන් ගැනත් සිතන සහනශීලි දිනයක් ගත කිරීමට මඟ පාදා දීමයි.

උපතේ සිට මරණය දක්වා වූ සෑම කාර්යයක දී ම බුදුදහම පදනම් වූ සමාජයක අඩිතාලම වැටුණේ මහින්දාගමනයත් සමඟ ය. ගමත්, පන්සලත් වැවත්, දාගැබත් මෙරට ප්‍රෞඪත්වයේ සංකේතයන් ය.

මිහිඳු හිමියන් දේවානම්පියතිස්ස රජුට දුන් උපදෙස් අතර "මහරජ, ඔබ මේ පොළොවේ අයිතිකරුවා නොව ආරක්ෂකයා ය." යන්න යි. හැම පැතිකඩකින් ම රට ආරක්ෂා කිරීම මෙයින් අදහස් කරයි. මිනිසා හා සත්වයා. ආරක්ෂා කරන අතර, රටේ සම්පත් ද ආරක්ෂා කළ යුතු ය. මේ උතුම් පාඨය අපේ සියලු ක්‍රියාකාරකම් හි දී සිහිතබා ගත යුත්තකි.

හිංසාවකින් තොරව ජීවත් විය යුතුය යන්න මහින්දා ගමනයත් සමඟම අපට ලැබුණු මූලිකම පාඩමකි.

හිංසාකාරී ක්‍රියාකාරිත්වයෙන් වෙන් ව අවිහිංසා සිතිවිලි හා හැඟීම් කුඩා කල සිට ම අපේ ළමා ලෝකයට ප්‍රවිෂ්ට කිරීම ගැන වැඩිහිටි ඔබ සැම විශේෂයෙන් සැලකිලිමත්වීම යුග අවශ්‍යතාවයක් වනු ඇත.

මේවායේ ඇති දුර්විපාක වේදනාත්මක ප්‍රතිඵල ගැන සිතා මෙවැනි හිංසක ක්‍රියාකාරකම් වලින් ඉවත්වීමට සිතයි නම් එය එක්තරා අතකින් මිහිඳු හිමියන් වෙත පුදකරන සුවිශේෂී ගෞරවයක් ලෙස අපි දකිමු.

අනුරාධපුරය, මිහින්තලය ආදී පෞරාණික ස්ථාන නැරඹීමට යන බොහෝ දෙනා එය විනෝද චාරිකාවක ලෙස යොදාගෙන ඇති බව පෙනේ.

මත්පැන් පානය කරමින්, විවිධ සංගීත භාණ්ඩ වාදනය කරමින්, කාමුක හැඟීම් අවුස්සන ගීත ගායනා කරමින් සිදුවන අශෝභන, අසංවර ගමන් විලාසය මිහිඳු හිමියන් මහත් කැපවීමෙන් අප වෙත ලබා දුන්, ඒ ශ්‍රේෂ්ඨ දායාදයට අවමානයක් කරනවානේ දැයි සිතිය යුතු ය.

අප අතින් සිදුවන වැරැදි අවබෝධ කරගෙන ඒවායින් දුරස් වීමට අධිෂ්ඨාන කරගත යුතු ය. මිහිඳු හිමියන් ලබා දුන් පණිවිඩය අපගේ සිතුම් පැතුම් හා ක්‍රියාකාරකම් තුළ නොමැතිනම් මිහිඳු හිමි සැමරීමේ ඇති ප්‍රතිඵලය කුමක් ද?

මිහිඳු හිමියන් ලක්දිවට වැඩමවීමෙන් පසුව අප රට තුළ සිදුවූ ගෘහ නිර්මාණ ශිල්පය හා කලා කෘති ගැන ද අප කල්පනා කළ යුතු ය. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම වීමේ දී පැමිණි අටලොස් කුලයක ශිල්පීන් නිසා මෙරට කැටයම්, මූර්ති, චිත්‍ර. ගෘහ නිර්මාණය, වාරිකර්මාන්ත ආදි විවිධ ක්ෂේත්‍රවල ශිල්පීය දැනුම වර්ධනය වූ අයුරු දැක ගන්නට පුළුවන.

හැඩි දැඩි කළු ගලෙන් කරුණාව, දයාව, මූර්තිමත් කරන බුද්ධ ප්‍රතිමා මෙන්ම, සියුම් කැටයමෙන් අලංකෘත බෞද්ධ දර්ශනය ප්‍රකට කරන සඳකඩපහණ, කලානිර්මාණවලින් ඔපවත් වූ පොකුණුවැනි නිර්මාණ ද බිහිවිය.

මහා සමුද්‍ර වැනි විශාල වැව්, ඇල දොල, ගංගා මේ සියල්ල ශ්‍රී ලාංකිකයාගේ ශක්තිමත් දෑතින් නිර්මාණය වූ ඒවාය. එදා ඉදිකරනු ලැබූ චෛත්‍යයන් ද, ලෝවාමහා ප්‍රාසාදය වැනි විශිෂ්ට නිර්මාණයන් ද සීගිරි සිතුවම් වැනි නිර්මාණයන් ද අපට මහත් ආඩම්බරයකි.

බොහෝ රටවල ඒ රටේ අනන්‍යතාව සුරකිමින් නිර්මාණ කටයුතු කරන බව දැකගත හැකියි. නමුත් අපේ රටේ ගෘහ නිර්මාණ ශිල්පීන් කී දෙනෙක් ඒ පැරැණි අද්විතීය නිර්මාණවලින් ආදර්ශයක් ලබා ගන්නවා ද? මේ ගැනත් සිතිය යුතුව ඇත.

කෘෂිකර්මාන්තය දෙස බැලුවත් ඊට අදාළ වාරිකර්මාන්ත දෙස බැලුවත් දියුණු මට්ටමකට මේවා පත්ව ඇත්තේ මහින්දාගමනයෙන් පසුව ය.

උට්ඨාන වීර්යයෙන් යුක්තව ඉර උදාවීමට පෙරම කුඹුරට බසින ගොවියා ඇළ – දොළ, ගංගා වැව් අමුණු ආශ්‍රිතව කටයුතු කළ නිසාම රට ආහාරයෙන් ස්වයංපෝෂිත විය. එදා සිටියේ දහඩිය වගුරවමින් වැඩකරන ජනතාවකි. අද බොහෝ දෙනා කම්මැලිය. අලස ය. නිකරුණේ කාලය කා දමති.

සංඝමිත්තා මෙහෙණින් වහන්සේ දඹදිවින් වැඩම කළ බෝධි වෘක්ෂය තුළින් මෙරටට මොනතරම් මෙහෙයක් ඉටුවී ඇත්ද? වෘක්ෂ වන්දනාවට හුරු පුරුදු වූ ශ්‍රී ලාංකිකයා ඉතා ඉක්මණින් බෝධිය වටා එක් රොක් වූහ.

අනුරාධපුර පුණ්‍ය භූමිය මුල් කර ගෙන එදා සිදුකළ සියලු නිර්මාණ පරිසරය සංරක්ෂණය වන අයුරින් සිදුකළ බව ඉතා පැහැදිලිය. මිහිඳු මාහිමියන් සිහිපත් කිරීම යනු එදා සාඩම්බර අතීතය දෙස නැවත හැරී බැලීම ලෙස අපි දකිමු.



# අවබෝධයෙන් පිවිසිය යුතු ආර්ය මාවත

**අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩසිටිය කාලයේ ජානුස්සෝණි කියලා බ්‍රාහ්මණයෙක් සිටියා. මේ ජානුස්සෝණි බමුණාට මුණ ගැහුණා පිලෝතික කියන පරිබ්‍රාජකයා.**

එතැන දී මේ දෙන්නා සතුටු සාමීචියේ කතා කළා. "පින්වත් පිලෝතික පරිබ්‍රාජකය, ඔබ මේ මධ්‍යාහ්න වේලාවේ කොහේ ඉඳලද එන්නේ." 'මම බුදුරජාණන් වහන්සේ බැහැ දැකලා එන ගමන්" " පරිබ්‍රාජකය, ශ්‍රමණ භවත් ගෞතමයන් පාණ්ඩිත්‍යය කෙනෙක්ද?" පින්වත් බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේගේ නුවණ ගැන මම කොහොම දැනගන්න ද? හැබැයි යම්කිසි කෙනෙක් උන්වහන්සේගේ නුවණ ගැන දැන ගන්නවා නම් ඒ තැනැත්තාත් ඒ වගේම නුවණ ඇති කෙනෙක් වෙන්ට ඕනෑ"

එවිට ජානුස්සෝණි අහනවා ඔබ"ශ්‍රමණ භවත් ගෞතමයන්ට බොහොම ප්‍රශංසා කරනවා. හේතුව කුමක්ද?" කියා

පිලෝතික මෙසේ කිව්වා. "ඒ බුදුරජාණන් වහන්සේට මම කොහොම ප්‍රශංසා කරන්න ද? මම ඒ සඳහා කොයි ආකාරයෙන් සමර්ථයෙක් වෙන්න ද? දෙවි මිනිසුන් සහිත සියලු ලෝකවාසීන්ට උතුම් වූ උන්වහන්සේ සර්වලෝක ප්‍රශස්ත යි. ඒවගේම අනන්ත ගුණ මහිමයෙන් යුක්ත යි.

පින්වත් ජානුස්සෝණි බ්‍රාහ්මණය, ඇතුන් වාසය කරන වනාන්තරයක හැසිරෙන කෙනෙක් දිග, පළල ඇත් පාදයක සටහනක් දැකලා මේ පියවර සටහන අයිති හස්තියා මහා හස්තියෙක් ය කියා දැන ගන්නවා ද? අන්න ඒ වගේ මමත් බුදුරජාණන් වහන්සේ පිළිබඳ පවතින කාරණා හතරක් දැන ගත්තා. ඒ අනුව මම තේරුම් ගත්තා. බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍යය ධර්මයන් තමන්ගේ ම ඥාණයෙන් අවබෝධ කළ බව, තමන් වහන්සේ ම නුවණින් ප්‍රත්‍යක්ෂ කරපු බව.

එසේ පරිබ්‍රාජකයා බුදු ගුණ වර්නා කරන කොට ජානුස්සෝණි බමුණා ප්‍රීතියෙන් අතිශයින් ප්‍රබෝධවත් වුණා. තමන් එතෙක් වාඩිවෙලා හිටපු රථයෙන් බැස්සා. උතුරු සලුව සකස් කර පොරවා ගෙන බුදුරජාණන් වහන්සේ වැඩ සිටින දෙව්රම් විහාරය දෙසට හැරී ඇදිලි බැඳ නමස්කාර කළා. ප්‍රීති වාක්‍ය පළ කළා.

එක දවසක් මේ ජානුස්සෝණි බමුණා බුදුරජාණන් වහන්සේ වැඩ සිටින දෙව්රම් විහාරයට ගොස් වන්දනා කොට පිලෝතික පරිබ්‍රාජකයාත්, තමන් අතර වූ සාකච්ඡාව කියා හිටියා. ඒ වේලාවේ ලොව්තුරු බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළා.

"බ්‍රාහ්මණය ,හස්ති ශිල්පය ඉතාමත් හොඳට දන්න දක්ෂ වූ ඇතුන් හික්මවන්නෙක් ඇතුන් වාසය කරන වනාන්තරයකට යනවා. ඒ අවස්ථාවේ දී දික්වූ ද, පළල්වූ ද, ඇත් පියවරයක් දකිනවා. ඒ ඇත් පාද සටහන දැක ඒ දක්ෂ ඇතුන් හික්මවන්නා මේ ඇත් පියවර මහා ඇතකුගේ කියා. නිගමනයකට, තීරණයකට පැමිණෙන්නේ නෑ. එයට හේතුව මේකයි. වනාන්තරයේ ඉන්නවා. ඊට වඩා විශාල පාද තියෙන වාමනිකා කියන ඇතින්නියන් කොටසක්.

ඊළඟට බ්‍රාහ්මණය, නියම විශාල හස්තියා ගැන දැනගන්න, ඔහු පියවර බල බලා තවත් ඉදිරියට යනවා මෙහෙම යන දක්ෂ ඇතුන් හික්මවන්නාට හමුවනවා උච්චාකාලාරික කියන හස්තියා. තවත් ඉදිරියට යන විට හමුවනවා උස ගස්වල ඇඟ මැදපු අතුවලට දළ වලින් ඇන තිබෙන සළකුණු. මේ මහා අතෙකු කළ සළකුණක් ය කියා සිතනවා.

පිලෝතික පරිබ්බ්‍රාජක බුදුරජාණන් වහන්සේ තුළ පිහිටි ඔහු හඳුනාගත් ඥාන පද සතර පමණි, ජානුස්සෝණි බ්‍රාහ්මණයා හට පැවසුවේ.


පිලෝතික පරිබ්බ්‍රාජක පැවසූ ඇත් පියවර උපමාව අසම්පූර්ණ බව දේශනා කළ බුදුරජාණන් වහන්සේ එය සම්පූර්ණ කොට ජානුස්සෝණි බ්‍රාහ්මණයාට දේශනා කළ සේක. චතුපාරිශුද්ධ ශීලය පිරීම, නීවරණ ප්‍රාහණය. ධ්‍යාන අභිඥා උපදවා ගැනීම, පුබ්බේනිවාසානුස්සති, චුතූපපාත ,ආසවක්ඛය ඥාන ලැබීම, චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගැනීම අරහත් භාවයට පැමිණීම, යන ලෝකෝත්තර ආර්ය මාර්ගයෙහි එක් එක් පියවර බුදුරජාණන් වහන්සේ විසින් සවිස්තරව දේශනා කරන ලදී. මෙම තත්ත්වයට පත් උත්තමයා හඳුනා ගැනීම පරිපූර්ණ නිෂ්ඨාව ලෙස අවසාන වශයෙන් ප්‍රකට කරන ලදී.

ඒ වගේම බ්‍රාහ්මණය, ඒ ශ්‍රමණ තෙම ආර්ය සීලක්ඛන්ධයෙන් යුක්ත යි. තමාගේ ජීවිතය නිවැරැදි ප්‍රතිපත්තියෙන් යුතුව ගෙන යන නිසා නිවරද්‍ය වූ සැපයක් අනුභව කරනවා. චක්ඛු, සොත, ඝාන, ජිව්හා , කාය කියන පංච ඉන්ද්‍රියයන් සංවර කරගෙන ඒ ඉන්ද්‍රියයන්ට ගොදුරුවන, රූප ශබ්ද, ගන්ධ , රස, ස්පර්ශ කියන අරමුණුවලට ලොල් නොවී නිරාමිස සැපයක් විඳිනවා.

බුදුරජාණන් වහන්සේ තවදුරටත් ඒ භික්ෂුවගේ සම්‍යග් ප්‍රතිපදාවන් ගැන බමුණාට ප්‍රකාශ කර වදාරනවා. බ්‍රාහ්මණය, ඒ භික්ෂුව යාම් ඊම්, ඉඳීම්, සිටීම් ආදී ඒ ඒ ඉරියව් වලදී සිහියෙන් යුක්තව නුවණින් යුක්තව ක්‍රියා කරනවා. සීල විසුද්ධිය ඇති කර ගන්නවා. ජන සම්බාධයෙන් හෙවත් ජනයා ගැවසීමෙන් තොර විවේක සේනාසනයක් ම යි. ඒ භික්ෂුව සොයා ගන්නේ. එසේ වාසය කරන්නා වූ මේ ශ්‍රමණ තෙමේ උපන්නා වූ කෙලෙස් දුරු කරල සිත පිරිසුදු කරගන්න උත්සාහ ගන්නවා.

බ්‍රාහ්මණය, මාගේ ධර්මානුධර්ම ප්‍රතිපත්ති පිළිගත් ඒ භික්ෂුව කෙලෙස් දුරු කර ගන්නේ මේ විදියට යි. කියා බුදුහාමුදුරුවෝ විස්තර කර වදාළා. චූල්ලහත්ථිපදෝපම සූත්‍ර දේශනාව.

එය ඇසීමෙන් පසු දේවානම්පියතිස්ස රජතුමන් ප්‍රමුඛ, පිරිසට ගමන් කළ යුතු ආර්ය මාර්ගය කුමක් ද? එම මාර්ගයෙහි ගමන් කරන නියම ශ්‍රමණ ජීවිතය කෙබඳු විය යුතු ද යනු මැනවින් වටහා ගැනීමට හැකිවිය. මෙම ධර්ම දේශනාව අවසානයේ රජතුමන් ප්‍රමුඛ සතළිස් දහසක් පිරිස තිසරණ සරණ ගිය උපාසක පිරිසක් බවට පත් වුණා.



කනත්තේවැව
ගල්වැව
ශ්‍රී සුගතාරාම රාජමහා
විහාරවාසී
**හිදව සෝභිත හිමි**

## නොනැමෙන සිතෙන් ...

*13 පිටුවෙන් ...*

ඉන් පළමුවැන්න සත්පුරුෂ හෙවත් කල්‍යාණ මිත්‍රයාගේ ඇසුර යි. ඒ නිසාම ශ්‍රද්ධාව හෙවත් තුනුරුවන් විෂයයෙහි ඇති ශ්‍රද්ධාව වැඩි දියුණු කර ගන්නවා. ඒ ශ්‍රද්ධාව දියුණු කර ගත් තැනැත්තා සැම අරමුණක්, ක්‍රියාවලියක් සම්බන්ධයෙන් තැන්පත්ව නුවණින් මෙනෙහි කර තම සිහිය මැනවින් පහිටුවා ගෙන මනා සිහියෙන් යුක්තව කල් යවනවා. ඒ තුළින් මනා ඉන්ද්‍රිය සංවරයක් ඇති කර ගෙන සිත, කය, වචනය යන තිදොර සංවර බවට පත් කර ගන්නවා. තවත් විදියකින් කියනවා නම් සුචරිතවත් අයකු බවට පත් වෙනවා. ඇද නැති, වැනෙන්නේ නැති,කිසිවකට කම්පා නොවන ගති, ඍජුගති ඇති ඒ ඇති කරගත් ඍජු ගුණය සුස්ථිර කර ගත්, සූජු ගුණය සඵල කර ගත් ආර්ය ශ්‍රාවකයකු බවට ද පත්වෙනවා.

කරණීයමෙත්ත සූත්‍රයේ එන උජු හා සූජු යන ගුණ හෙවත් චරිත ලක්ෂණ දෙකින් අපට පෙන්වා දෙන්නේ මේ තත්වයන් ඇති කර ගැනීමට අවශ්‍ය පිළිවෙතෙහි පිහිටීමේ වටිනාකම යි.



# නිරෝගී බවට සැහැල්ලු පැවතුම්






කොළඹ කොටුව ශ්‍රී සම්බුද්ධාලෝක විහාරාධිපති ආචාර්ය

**ඉත්තදෙමලියේ ඉන්දසර නාහිමි**


**මිහිඳු මාහිමියන් හඳුන්වා දුන් අභිනව සංස්කෘතිය පාදක කොට ගෙන ලංකාවේ විශාලතම සමාජ විපර්යාශයක්, ආධ්‍යාත්මික විප්ලවයක්, චින්තන ප්‍රබෝධයක් ඇති විය. භික්ෂු ජීවිතය ආදර්ශ කොට ගෙන චාම් දිවිපෙවෙතකට ජනතාව හුරු විය.**

අධර්මයෙන් වෙළී, දුසිරිතෙන් බර වී, අවිද්‍යාවෙන් මං මුළා වී සිටි ජනතාවට සද්ධර්මාලෝකයෙන් නුවණැස පහළ වී ඔවුහු උත්තරීතර ජීවිත ගත කරන්නන් බවට පත්වූහ.

දෛනික ජීවිතය ගත කිරීමේ දී බොහෝ දුරට බුදු දහමෙහි ඉගැන්වෙන ජීවන ප්‍රතිපදාවන් තම ජීවිතයට ළං කර ගෙන, ඒ අනුව ජීවිත සකස් කර ගැනීමට උත්සාහ කළහ.

සමාජ සාරධර්ම කථා කෙරෙන සිඟාලෝවාද , පරාභව, වසල වැනි සූත්‍රවල සහ මංගල, කරණීයමෙත්ත වැනි බොහෝ සූත්‍ර ධර්මවල ඉගැන්වීම්වලින් පැහැදිලි කෙරෙන ගුණ ධර්ම ප්‍රායෝගික ව තම ජීවිතවලට ඈඳා ගැනීමට උත්සාහ කළහ.

සමාජයේ බොහෝ ගැටුම් නිර්මාණය වනුයේ “සතුට” සංතෘප්ත කරණයෙහි විෂමචාරී තරගකාරීත්වයේ ප්‍රතිඵලයක් වශයෙනි. බුදු දහමෙහි ද සතුට මහ ඉහළින් වර්ණනා කර ඇත. “සන්තුට්ඨී පරමං ධනං”, “සන්තුස්සකෝ ච සුභරෝච”, “ සන්තුට්ඨී ච කතඤ්ඤුතා” ආදී දේශනා පාඨවලින් ඒ බව ස්ඵුට වෙයි. මෙහි දී අවධාරණය කර ඇත්තේ ලද දෙයින් සතුටුවීමයි.

උත්සාහවත් ව ජීවන වෘත්තියෙක යෙදී, ලැබෙන පමණින් සතුටුවීමයි.

වුවමනාවට වඩා බලාපොරොත්තු සිත තුළ පුරවාගෙන ජීවත්වෙන පුද්ගලයා අත්‍රිච්ඡතා, මහිච්ඡතා, පාපිච්ඡතා යන ක්ලේශ ධර්ම සමඟ ජීවත්වෙන කෙනකු වශයෙන් බුදුදහමෙහි හඳුනා ගෙන ඇත. අතිච්ඡතා මානසිකත්වය ඇති පුද්ගලයා තමන් ළඟ ඇති දෙයින් සතුටු නොවී අනුන් ළඟ ඇති දෙයට ආශා කරන පුද්ගලයා යි. අත්‍රිච්ඡතා පුද්ගලයා තමන් කරන රැකියා හොඳමදි.

සමාජ පිළිගැනීමක් නැහැ. ගෞරවයක් ඇත්තේ නැහැ. ප්‍රමාණවත් පඩියක් ලැබෙන්නේ නැහැ. අරයා කරන රැකියාව නම් හොඳයි, කවුරුත් සලකනව, හොඳ පඩියකුත් තියෙනව ආදි වශයෙන් සිතමින් ශෝක වෙයි. පසුතැවිලි වෙයි. සමහර විට තිබෙන රැකියාව අතහැර හොඳ රැකියාවක් සොයා ගැනීමට ගොස් දෙකම නැති කර ගනී.

ඒ ලද දෙයින් සතුටුවීමේ ගුණය නැති නිසයි. සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමේ දී මෙම ලද දෙයින් සතුටුවීම අත්‍යවශ්‍යම ගුණාංගයකි. ආශාවන් පසුපස බිරිඳ හෝ ස්වාමිපුරුෂයා හඹා යන්නේ නම් සමාජයේ තිත එහිම තැබෙයි.

සතුට නැති කරන තවත් දුර්ගුණයකි, මහිච්ඡතාව. කොපමණ තිබුණත් සෑහීමකට පත් නොවී තව තවත් එකතු කිරීමට දුක් විඳීමයි. “න කහාපණ වස්සේන තිත්ථි කාමේසු විජ්ජති”

කහවණු වැස්සක් වැස්ස ද ආශාවන් ඇති තැනැත්තා තෘප්තිමත් නොවෙයි. සෑහීමකට පත් නෙවෙයි. යම් පවුලක බිරිඳ ආශා කරන දේ ස්වාමිපුරුෂයා විසින් කෙතරම් ගෙනත් දුන්න ද, සෑහීමකට පත් නොවන්නේ නම්, එම පවුල් ජීවිතය දෙදරා යාමේ දිනය ඈතක නොවේ.

ස්වාමියා උපයන දෙය බිරිඳ තම ආශාවන් මුදුන් පමුණුවා ගැනීමට යොදවන්නේ නම්, ස්වාමියා කෙතෙක් ඉපයුව ද ඒ සියල්ල විනාශ වෙයි. ඇවිලෙන ගින්නට කොපමණ දර දැම්මත් ගින්නට සෑහීමක් නැත. මහා සාගරයට ගංගාවලින් කොපමණ ජලය ගලා ආවත් සාගරයට සෑහීමක් නැත.

එලෙසම මහිච්ඡතාවයෙන් යුත් පුද්ගලයාට කොපමණ ලැබුණත් සෑහීමකට පත් නොවේ.

අනෙක් අතට මහිච්ඡතාව ඇති පුද්ගලයා පරිත්‍යාගයට පසු බසී. දෙන දෙයින් ඉමහත් අඩුවක් ඇති වේ යැයි ඔහු කල්පනා කරයි. පාපිච්ඡතා පුද්ගලයා ද ලද දෙයින් සතුටු නොවී තමන් ළඟ නැති ගුණ මවා පෙන්වමින් බොරුවෙන් වංචාවෙන් ලෝකය රවටා ලාභ සත්කාර ,ගෞරව සම්මාන, ගරු බුහුමන් ලබා ගැනීමට උත්සාහ කෙරෙයි.

එබැවින් මේ සමාජයේ සැපෙන් සතුටෙන් ජීවත්වනුයේ අත්‍රිච්ඡතා මහිච්ඡතා හෝ පාපිච්ඡතා පුද්ගලයා නොව ලද දෙයින් සතුටු වන පුද්ගලයායි.

මාගේ උත්සාහයට මෙපණ සෑහේ ය. මගේ දැනුමට, මගේ හැකියාවට මෙය ප්‍රමාණවත් වේ ය යනුවෙන් සිතා ලද පමණින් සතුටු විය හැකි තැනැත්තා සුව සේ වෙසෙයි.

ලැබෙන දෙයින් සතුටට පත් නොවී, අධික ලැබීමක් පතන අයට ලැබෙන දෙය පවා නොලැබ දුකට පත්වන බවට කදිම උදාහරණයකි, ස්වර්ණ හංස ජාතකය. ස්වර්ණ හංසයා අනුන්ට බැලමෙහෙවර කරමින් ජීවත්වන ස්ත්‍රියකට අනුකම්පා කර වරින් වර එහි ගොස් ඇයගේ යැපීමට එක් එක් පිහාටුව බැගින් දමා පැමිණියේ ය.

> **“ලෝභී ස්ත්‍රිය වරෙක හංසයා අල්ලා සියලු පිහාටු සිඳ ගත්තා ය. නමුත් සිඳ ගත් පසු එම පිහාටු නොරන් විය. අධික තණ්හාව නිසා ලැබෙන්නට තිබෙන දෙය ද නොලැබී ගියේ ය. අධික තණ්හාව නැතිව ලද දෙයින් සතුටු ව සිටියේ නම් ස්වර්ණ හංසයා මැරෙන තුරු ම ස්ත්‍රියට ද සතුටෙන් ජීවත්විය හැකි ව තිබිණ.”**

ලෝභී ස්ත්‍රිය වරෙක හංසයා අල්ලා සියලු පිහාටු සිඳ ගත්තා ය. නමුත් සිඳ ගත් පසු එම පිහාටු නොරන් විය. අධික තණ්හාව නිසා ලැබෙන්නට තිබෙන දෙය ද නොලැබී ගියේ ය. අධික තණ්හාව නැතිව ලද දෙයින් සතුටු ව සිටියේ නම් ස්වර්ණ හංසයා මැරෙන තුරු ම ස්ත්‍රියට ද සතුටෙන් ජීවත්විය හැකි ව තිබිණ.

ලද දෙයින් සතුටු ව ජීවිත සකස් කර ගත් අය පහසුවෙන් පෝෂණය කළ හැකි වෙයි. කරණීයමෙත්ත සූත්‍රයට අනුව කෙනකුගේ ජීවිතය සුභර ජීවිතයක් විය යුතුයි. ස්වාමි පුරුෂයාට භාර්යාව බරක් නොවිය යුතු ය. මව්පියන්ට දරුවන් බරක් නොවිය යුතුයි. ඇතැම් භාර්යාවරුන්ට වස්ත්‍රාභරණ ලබා දී සතුටු කළ නොහැකි වෙයි.

කෙතරම් වටිනා අඳුමක්, පැළඳුමක් ලබා දුන්නත් අඩුපාඩුවක් ම දකියි. දීමනාව අගය නොකරයි. නො ගැලපෙන එකක් සේ සලකා පැත්තකට දමයි. ස්වාමිපුරුෂයා දුක් මහන්සි ව ගෙන එන දේ එලෙස නොසලකා හැරීමෙන් කෙතරම් වේදනාවකට ස්වාමිපුරුෂයා පත්වෙයි ද යන්න නොසිතන භාර්යාවෝ සිටිති.

සමහර දරුවන් කුඩා කල සිට ම පුරුදු වනුයේ මව්පියන්ට වධ වේදනා දෙන ජීවිත ගත කරන්නට ය. එම දරුවන්ගේ අවශ්‍යතා ඉටු කර නිම කරන්නට මව්පියන්ට නොහැකි වෙයි. කාලය, ආදායම, ප්‍රදේශය, සමාජ පරිසරය ආදිය තේරුම් ගෙන ඒ අනුව ජීවිත ගත කිරීමට උත්සාහ කළ යුතු ය. එලෙස සුභර ජීවිතවලට හුරුවීම බුදුදහමට අනුව ජීවිත ගත කිරීමකි.

එසේම කරණීයමෙත්ත සූත්‍රයේ සඳහන් තවත් වචනයකි. “සල්ලහුකවුත්ති” – (සැහැල්ලු දිවිපැවැත්ම) බොහෝ විට සැහැල්ලු දිවිපැවැත්ම කඩා වැටෙනුයේ අනුකරණය කිරීමට යාමෙනි.සමහර අය මෙම තරගකාරී අනුකරණයට මැදිහත් වනුයේ අනුන්ට ණය තුරස්වීමෙනි. “ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ’ යන ආප්තෝපදේශ සැකසී ඇත්තේ මෙබඳු අය පිළිබඳව යි.

ලද දෙයින් සතුටුව, සුභර ජීවන රටාවකට හුරුව සැහැල්ලු දිවිපැවැත්මක් ඇත්තේ ද ඔහුගේ මනස ද නීරෝගි වෙයි. බොහෝ බලාපොරොත්තු, බොහෝ ප්‍රාර්ථනා ඔහුට ඇත්තේ නැත. අනවශ්‍ය බලාපොරොත්තු ඇතිව සිටීමෙන් සිත රෝගී වෙයි. කායිකව දුර්වල වෙයි. ලද දෙයින් සතුටුව ජීවිත ගත කරන්නන් නීරෝගී බවට කදිම උදාහරණයකි. මූගපක්ඛ ජාතකයේ කැලයේ තපස් රකින තේමිය කුමරු කැඳවාගෙන ඒමට ගිය කසී රජු ලුණුත් නැති, කරකොළ ආහාරයට ගෙන තපස් රකින ඔබගේ ශරීර වර්ණය මෙතරම් ප්‍රසන්න වූයේ කවර හේතුවකින් දැයි විචාළේ ය. එවිට තේමිය කුමරු,

“මම අතීතයේ මෙබඳු දේ නොලැබුණේ යැයි කියා හෝ ,අනාගතයෙහි මෙබඳු සම්පත්ති ලබමි’යි කියා හෝ අධික ප්‍රාර්ථනා තබා නො ගෙන වර්තමානයෙහි ලැබුණු දෙයින් තෘප්තියට පැමිණ වාසය කරමි’යි දක්වමින් තම ශරීර වර්ණය ද ඇතිව සිතේ සතුටෙන් ජීවත්වන බව ප්‍රකාශ කළේ ය.

ලෝකයේ බොහෝ අය නැසුණු වස්තුවට ශෝක කරති. නොලැබුණ වස්තුව ප්‍රාර්ථනා කරති. එබැවින් තෘෂ්ණා ශෝක දෙකෙන් තැවී දුර්වර්ණ වන්නා වූ දේහ ඇති පුද්ගලයන් මුලින් කපා අව්වට දමන ලද නළ දඬක් මෙන් වන්නේ යැයි සඳහන් වේ.

මිහිඳු මාහිමිපාණන් වහන්සේ හඳුන්වා දෙන ලද සැහැල්ලු දිවි පැවැත්මේ වටිනාකම මුළු මහත් සමාජයට ම ප්‍රායෝගික ව අවබෝධ වන කාලයකි. මේ එබැවින් නැවතත් එම දේශනා පිළිබඳ  අවධානය යොමු කොට සැපවත් ජීවිත ගත කිරීමට උත්සාහවත් ව ක්‍රියා කළ යුතු බව පෙන්වාදීමට කැමැත්තෙමි.



**දානමාන හිඟ දුෂ්කර විහාරස්ථානයට උදව් කරන්න.**
0778325775

විහාරස්ථානවල පේන්ට්, පොටි ඇදීම, දොර ජනෙල් පොලිෂ් කිරීම, වයරින්, මේසන් වැඩ සාධාරණ මිලට කරනු ලැබේ.
0778077317

## ජීවත් වීමට මිස රජවීමට නොව

බුදු පිළිම, දේව ප්‍රතිමා, විහාර සිතුවම්, වාහල්කඩ මකර තොරන් හා වෙහෙර විහාර සියලුම කලා නිර්මාණ ඉතාම සාධාරණ මිලට තිම කර දෙමි.
**බණ්ඩාරවෙල - 0763195173**

### වැඩිහිටියන්හට නවාතැන්

**අලුතින් ආරම්භ වූ වැඩිහිටි නිවහන සඳහා නේවාසික වැඩිහිටියන් බඳවා ගනු ලැබේ.**
ප්‍රනීත ආහාර පාන, කාරුණික සාත්තු සේවය, මාසික වෛද්‍ය සායන, ශීල ව්‍යාපාර, මනෝචිකිත්සා වැඩසටහන් ඇතුලුව ජීවිතාන්තය දක්වා සුවසේ සිටිය හැකි නිදහස් ස්ථානයකි.
**0710903803**

අප වැඩ වසන
**ආවාසය දිරාපත්ව ඇති හෙයින් නව ආවාසයක් ඉදිකර ගැනීම සඳහා උදව් කරන්න.**
අත්තිවාරම දමා ඇත. ද්‍රව්‍යමය උපකාර කරන මෙන් දනපති ඔබට පුණ්‍යානුමෝදනා සහිත ආරාධනා.
ගිණුම් අංකය : 054200120036197.
දු.අ. 0710564748

**දුෂ්කර විහාරස්ථානයක 2022 වර්ෂයේ කඨින මහාපිංකම සිදු කිරීමට අනුග්‍රහක පිංවතුන් අවශ්‍යයි.**
077-8325775

## විවේකීව සිටීමට ස්ථානයක් සොයයි

**නිසන්සල ස්ථානයක සිට භාවනායෝගීව සිටීමට සුදුසු ඉඩමක් හෝ ගෙයක් හිමිනමකට පරිත්‍යාග කළ හැකි පිංවතකු ඇත්නම් දැනුම් දෙන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.**
**077-1626000**

භික්ෂූන් වහන්සේ නමකට බණ භාවනා සිදුකරගෙන ආරණ්‍ය සේනාසනයක් ලෙස පවත්වාගෙන යැමට සුදුසු නිස්කලංක පරිසරයක භූමියක් හෝ භූමියක් සහිත සුදුසු ස්ථානයක් පූජා කිරීමට කැමැත්තක් දක්වන පින්වත්තයන් මෙම අංකයට මා දුනුවත් කරන්න.
**0775199913**

## නොමිලේ

**මිහිඳු මහ රහතන්වහන්සේ නිර්මල අවිහිංසා ධර්මය ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද්දේ අද වැනි පොසොන් පොහෝ දිනකය. නිර්මාංශිකව සඳහම් මග වැඩීමේ නිර්මල අවිහිංසා ධර්මය හා සීඩී තැටි සැමදා නොමිලේ ලබාගන්න.**
071-7679254

මාගේ පුද්ගලික ඉඩමක
පර්චස් 80 ඉදිකරමින් පවතින
**අටවිසි බෝ සම්දුන් සමග පන්සල**
රටේ පවතින දුෂ්කරතා නිසා ඉතිරි වැඩකර ගැනීමට අපහසු බැවින්
**මේ පන්සල පූජා කිරීමට හෝ හවුල් කරගැනීමට සංඝ / ගිහි දහමට ලැදි අවංක කෙනෙකු සොයමි.**
දහම් 076-7330030

## 50000 කට වැඩි හොඳ ආදායමක්

**ජ්‍යොතිෂයට කැමති ආධුනිකයෙක් නම් තම නිවසේ සිට ජ්‍යොතිෂ කාර්යාලයක් ආරම්භ කර මසකට 50,000 ක වැඩි ඉහළ ආදායමක් උපයන්න. වයස බේදයක් නැත. සැම ගමකින්ම බඳවා ගැනේ. ඔබේ නම, ලිපිනය හා දුරකථන අංකය එවා පමා නොවී ලියාපදිංචි වන්න.**
**හෙළදිව ජ්‍යොතිෂ ඒකකය**
**118, සිගේරා පාර, මාදිවෙල කෝට්ටේ**

## දෙමව්පියෝ සොයති

**මොරටුව, මෝල්පේ, ද සොයිසා පාරේ පදිංචිව සිටි ප්‍රියංක බුද්ධික පෙරේරා යන අය ආගියඅතක් නැත. ඔහු පිළිබඳව තොරතුරක් දන්නා අයෙක් වෙතොත්**



0705 962393
0701 709198
0777 609262
077 8007000
0775 232688
අමතන්න

මොහු පිළිබඳව සත්‍ය තොරතුරක් ලබාදෙන අයෙකුට විශේෂ ත්‍යාගයක් පිරිනමයි.

## කවිබණ ධර්මදේශණා විරිදු

Video අඩුම මිලට Recording කරවා YouTube, FaceBook හරහා හැමෝටම නැරඹීමට හැක.
**ස්වර්ණා මධුරාගි**
0773253010

**සියම් - මල්වතු පාර්ශ්වයේ හිමි නමක් පවරා දිය හැකි ආරණ්‍ය සෙනසුනක් හෝ භාවනා මධ්‍යස්ථානයක් සොයයි.**
**එවැනි ස්ථානයක් ආරම්භ කිරීමට සුදුසු ස්ථානයක් හෝ වේ නම් දන්වන්න.**
0778681700

**මාතර කඹුරුපිටිය ප්‍රදේශයේ අවු. 58 වයසැති අයෙකුට අක්මාවක කොටසක් බද්ධ කිරීමට අවශ්‍ය බැවින් එයට දායකවීමට අවු. 45 ට අඩු O වර්ගයේ ලේ ඇති පින් කැමති අයකුට දායකවීමට පුළුවනි.**
**මහඟු පුණ්‍ය කර්මයකි. හැකි ඉක්මනට අමතන්න.**
077-5249017, 076-9288606, 071-7518087

**අගනුවර පූර්ණ පහසුකම් සහිත විහාරස්ථානයකට භික්ෂූන් කිහිපනමකට අධ්‍යාපන කටයුතු සඳහා ඉඩකඩ ඇත**
අධ්‍යාපනයෙන් පසුව විදේශ ගතවීමේ වරප්‍රසාදයද තිබේ.
පැවිද්ද සඳහාද කුඩා ළමයින්ට ඉඩ ඇත.
**දුරකථනයෙන් සවස්භාගයේ අමතන්න**
**2930342**

## හතර පෝයටම

සිල් ගැනීමට කැමති
**විශ්‍රාමික මාතාවන්ට**
විශ්‍රාමික මාගේ නිවසේ
**ජීවිතාන්තය දක්වා**
නවාතැන් පහසුකම් ඇත.
**බී. පුංචි මැණිකේ**
**සුනාමි ගම්මානය**
**පාළුගම්පල - සන්නස්ගම**
**ලෙල්ලොපිටිය**
**0710-586430**

## පාරම්පරික ශාන්ති කර්ම

### අධ්‍යයන පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීම

සුරසරණ ගුරුකුලය මගින් පවත්වන මෙය ගුප්ත ශාස්ත්‍ර ඉගෙනීමට කැමැත්තක් දක්වන සියලු දෙනාට වැදගත් පාඨමාලාවකි. නැති වී යන ශිල්ප රැක ගැනීම මූලික අරමුණයි. මෙහිදී මන්ත්‍ර ශාස්ත්‍ර මූලධර්ම විග්‍රහය සහ මන්ත්‍ර භාවිතය, අංග සම්පූර්ණ දේව පූජා, බහිරව පූජා, ගෙවල් ආරක්ෂා කිරීම, දෙහි කැපීම, යන්ත්‍ර නූල් දැමීම, අමනුෂ්‍ය දෝෂ දුරලීම, කොඩිවිණ, සූනියම් බන්ධන දුරු කිරීම, ශරීර ගත වූ වස විෂ ඉනා බේත් ඉවත් කිරීම, මල්වර හා තනිකම් දෝෂ, කළුකුමාර දෝෂ හරණය, ඇස්වහ කටවහ ග්‍රහ දොස් නිවාරණය, යන්ත්‍ර ඇඳීම, කුඩා දරුවන්ගේ රෝග නිවාරණය ආදී වූ ශාන්ති කර්ම රැසක් එහි නීති රීති සිද්ධාන්ත වලට අනුව ප්‍රායෝගික වැඩමුළු සහිතව උගන්වනු ලැබේ. ගැහැණු/ පිරිමි වයස් භේදයක් නොමැත. මසකට එක් දිනකි. අවුරුදු එකකි. මසකට පන්ති ගාස්තුව රු.3000/-කි. පහත සඳහන් නගර ආශ්‍රිත සිසුන්ගෙන් ඉගෙනීමට බලාපොරොත්තු වන අය පමණක් අමතා දුරකථන අංකය ලබා දී ලියාපදිංචි වන්න. ජූලිමස පහත දිනයන්හි දී ඇරඹෙන පන්ති පහත පරිදි වේ.

| දිනය | දවස | නගරය | දිනය | දවස | නගරය | දිනය | දවස | නගරය |
|---|---|---|---|---|---|---|---|---|
| 01) | සිකු. | කුරුණෑගල | 06) | බදාදා | අවිස්සාවේල්ල | 13) | බදාදා | ගාල්ල |
| 02) | සෙන. | පානදුර | 08) | සිකු. | ගම්පහ | 15) | සිකු. | හලාවත |
| 03) | ඉරිදා | රත්නපුර | 09) | සෙන | අම්බලන්ගොඩ | 23) | සෙන. | මහරගම |
| 04) | සඳුදා | දඹුල්ල | 10 ) | ඉරිදා | කඩවත | 24) | ඉරිදා | මහනුවර |
| 05) | අඟ | කුලියාපිටිය | 11) | සඳුදා | කෑගල්ල | 27) | බදාදා | අනුරාධපුර |

## මංගල පෝරුවේ චාරිත්‍ර විධි

### පැවැත්වීම පිළිබඳ එක් දින වැඩමුළුවට සිසුන් ලියාපදිංචි කිරීම.

මෙහිදී, මංගල පෝරුවේ චාරිත්‍ර විධි ආරම්භයේ පටන් අවසානය දක්වාම සියලු චාරිත්‍රවිධි පිළිබඳ ඉතා සරලව විග්‍රහ කෙරේ. එයට අදාල සියලුම කවි, ස්තෝත්‍ර, යාදිනි/සැහැලි, අෂ්ඨක, ගාථා සියල්ල ඔබට පැවරෙනු ඇත. මෙයට සහභාගී වීමෙන් පසු ඉතා දක්ෂ ලෙස එම කටයුතු මෙහෙයවා එම චාරිත්‍ර විධි සේවයක් ලෙසත් වෘත්තියක් ලෙසද සමාජයට සිදුකල හැකිය. සේවයක් මෙන්ම වෘත්තියක් වන බැවින් ඇතුලත්වීමේ ගාස්තුව රු. 15000/- ක මුදලක් අය කෙරේ. ගුරුකුලයෙන් දෙන සහතික පත්‍රයක්ද හිමි වේ. පහත නගර ආශ්‍රිත සිසුන් අමතා දුරකතන අංකය ලබාදී ලියාපදිංචි වන්න. අගෝස්තු මසදී පැවැත්වේ.

කුරුණෑගල | කඩවත | අවිස්සාවේල්ල | ගාල්ල

විමසීම් - **සුරංග සිරිමෙවන් 0776378184**

## ලුම්බිණි

රෙ:නො: W5510



වෙනත් ශාඛා නොමැත.

**විශ්වාසවත්, පිරිසිදුවත්, විනයානුකූලවත්, අටපිරිකරක් ලබා ගැනීමට ලුම්බිණි වෙළඳසැල වෙතම යන්න.**
අටපිරිකර සහ පූජා භාණ්ඩ ප්‍රමුඛයෝ

**ලුම්බිණි ස්ටෝර්ස්**
65, ඕල්කට් මාවත, පිටකොටුව
දුරකථනය: 2324814

## සියම් නිකායේ මල්වතු පාර්ශවයේ

අවු. 51 පැවිදි වී වසර 44 උපසම්පදා වී වසර 27 කි.
විහාරාධිපති ධුරය අවශ්‍ය නැත,
**තමන්ගේ මෙන් වැඩ කටයුතු සිදුකරමින් වැඩ සිටීමට දුෂ්කර පළාතක විහාරස්ථානයක් සොයමි.**
**072 4284994**

## තමන්ගේම අවබෝධයක් ලබන්න දුර්ලභ අවස්ථාවක්

සත්ව ලෝකයේ ඇතිවීම, පැවතීම, පැවැත්ම හා නැතිවීම පිළිබඳ පවතින ස්වභාවික දහම තමන්ටම අවබෝධයක් ලබන්න වයස අවුරුදු හැටක් හැත්තෑවක් අතර හුදෙකලා ජීවිතයක් ගත කිරීමේ හැකියාවක් තිබෙන සමාජයට කෙරෙන ආරාධනාවයි.
**වැවගම පේමරත්න - 071-1483145**





# මිහිඳු මාහිමි දෙසා වදහළ



## උතුම් සදහම් දේශනා

**මිහිඳු මහ රහතන් වහන්සේගේ වැඩම වීම ලංකාද්වීපයෙහි ආර්ථික, සමාජික, සාමයික සෑම ක්ෂේත්‍රයක් තුළම සුවිශාල පෙරළියක් ඇතිකළ උදාර දූත මෙහෙවරකි. උන්වහන්සේගේ වැඩමවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශත වර්ෂ විසිතුනකට ආසන්න කාලයක් නිර්මල බුදුදහමත් ඒ හා බැඳුණු බෞද්ධ සංස්කෘතික ලක්ෂණත් මේ දක්වා ම ස්ථාපිතව පවතින්නේ ය.**

### චූලහත්ථිපදෝපම සූත්‍රය

මිහිඳු මහ රහතන් වහන්සේ දේවානම්පියතිස්ස මහරජතුමාගෙන් ප්‍රශ්න කිහිපයක් අසා ඒවාට රජතුමා ලබා දුන් පිළිතුරුවලින් එතුමා ප්‍රඥාවන්තයකු බවත්, බුදුදහම වැනි උතුම් ගැඹුරු දහමක් තේරුම් ගැනීමට තරම් නුවණක් ඇති බවත් දැන ගත්හ. පසුව එම අවස්ථාවේ දී ම රජතුමා ඇතුලු විශාල පිරිසකට චූලහත්ථිපදෝපම සූත්‍ර දේශනාව දේශනා කළහ.

එය තෙරුවන්ගේ අගය, භික්ෂුවකගේ උතුම් පැවත්ම, සීලය, සමාධිය හා ප්‍රඥාව උපදවා ගන්නා අන්දම, චතුස්සත්‍යාවබෝධය ලබා ගැනීම, අර්හත්වය දක්වාම යන ගමන් මඟ විස්තර කෙරෙන අපූර්ව සූත්‍ර දේශනාවකි. එය අසා රජතුමා ඇතුලු විශාල පිරිසක් බුදු දහම වැළඳ ගත්හ. පංචසීලය සමාදන් කිරීම, එහි ඇති වටිනාකම පිළිබඳව කියැවෙන සූත්‍රයක් වශයෙන් ද මෙම චූලහත්ථිපදෝපම සූත්‍රය පෙන්වා දිය හැකි ය.

හොඳ බෞද්ධයකු වන්නේ කෙසේද? තෙරුවන් සරණ යාමෙන් බෞද්ධයකු වන අයුරු, පාපයෙන් වැළකී ක්‍රමයෙන් නිවන කරා යන ගමන් මඟ මෙහි මැනවින් පෙන්වා දෙයි.

අලි ඇතුන්ගෙන් ගහන, රටේ පරිසරය පිළිබඳ මනා අවබෝධයකින්, ඇතුන්ගේ පා සටහන් උපමා කර ගෙන මිනිසුන්ට දහම වටහා ගත හැකි අයුරින් විමුක්තිය ලබා ගන්නා අයුරු විග්‍රහ කරයි.

### විමාන වත්ථු හා පේත වත්ථු දේශනාව

පළමු දවසේ මිහිඳු හිමියන් අම්බස්ථල පර්වතයේ ම වාසය කළහ. පසුවදා රජතුමාගේ ආරාධනයෙන් අනුරපුරයට වැඩමවා රජමාළිගාවේ දී දන් පිළිගැන්වූහ. උන්වහන්සේ රජමාලිගාවේ සිටි කාන්තාවන් ඇතුලු බොහෝ දෙනකුට විමාන වත්ථුව හා පේත වත්ථුව මුල් කරගෙන ධර්ම දේශනා කළහ.

පින්කම් කිරීමෙන් ලැබෙන සැප විපාක විමාන වත්ථුවෙනුත්, පව්කම් කිරීමෙන් ලැබෙන දුක් විපාක පේත වත්ථුවෙන් පැහැදිලි කරයි.

පින් පව්, හොඳ නරක, කර්මය හා කර්ම විපාකය කියා දීමෙන් පෘතග්ජන මිනිසා පාපයට බියක් ඇති කර ගනියි, පින්කම්වල යෙදවීමට, හොඳ දේ කිරීමෙන් ලැබෙන හොඳ විපාක පෙන්වා දීමෙන් පුද්ගලයා පවින් වළක්වාගෙන හොඳ දේ කිරීමට පුරුදු කළ හැකි ය.

විමාන වත්ථුවෙහි පින්කම් කළවුන් ඒ ඒ දිව්‍ය විමානවල විඳින සැප සම්පත් පෙන්වා දෙයි.



**ලංකාද්වීපය තුළ සම්බුද්ධ ශාසනයත්, තදනුබද්ධ හර පද්ධතීන් සහ බෞද්ධ සංස්කෘතියත් ඒකාබද්ධව වසර දහස් ගණනක් පුරා මේ දක්වා ම පවතින්නේ මිහිඳු මහරහතන් වහන්සේ විසින් සිදු කරන ලද දූරදර්ශී වැඩ පිළිවෙළ නිසා බව පෙන්වා දිය හැකි ය.**

දිව්‍ය විමානවල වර්ණනා මෙහි සඳහන් වේ. පේත වත්ථුවේ කථා වත්ථු පණස් එකක් සඳහන් වේ. මළගිය ඥාතීන් උදෙසා පින් අනුමෝදන් කරවීම ද මෙහි ඉගැන්වෙයි. තමා විසින් සිදු කළ පාපයේ ස්වභාවයට අනුව මිනිසුන් මිය ගොස් ප්‍රේත ලෝකවල විඳින දුක් පෙන්වා දෙයි.

### සච්ච සංයුක්තය

උන් වහන්සේ එම ධර්ම දේශනාවන්ගේ අවසානයට සංයුක්ත නිකායේ එන චතුරාර්ය සත්‍ය ධර්මය දේශනා කරන සච්ච සංයුක්තය ද දේශනා කර චතුරාර්ය සත්‍යය ද දේශනා කළහ.

නරක දේ කිරීමෙන්, පාපකාරීව ජීවත්වීමේ ප්‍රතිඵලය වන්නේ දුගතියෙහි ඉපදීමයි. පින් කිරීමෙන් සසර සැපවත් කර ගැනීමටත් සුගතියෙහි ඉපදීමටත්, දිව්‍ය ලෝකවල සැප සම්පත් ලබා ගැනීමටත් හැකි වේ. පින් පව් දෙකම සසර දික් කිරීමටත් සසර පැවැත්මටත් හේතුවෙයි. එම නිසා උන් වහන්සේ මෙම විමාන වත්ථු පේත වත්ථු දේශනා අවසන් කළේ සච්ච සංයුක්තයේ චතුරාර්ය සත්‍යය පිළිබඳ දේශනා පැවැත්වීමෙන් ය. එයින් නිවන පාදක වේ. එම සූත්‍රාවසානයේ දී බොහෝ දෙනා ධර්මාවබෝධය ලබා ගත් බව සඳහන් කර ඇත.

### සමචිත්ත පරියාය සූත්‍රය

අදටත් භික්ෂූන් වහන්සේ නමක් ධර්ම දේශනාවට පළමුව දේවතාරාධනාවක් සිදු කරනු ලබයි. එවැනි දේවතාරාධනාවකින් දෙවියන්ට ආරාධනා කොට විශාල දේවතා සමූහයක් මැද විශාල පිරිසකට සමචිත්ත පරියාය සූත්‍ර දේශනාව උන් වහන්සේ විසින් සිදු කළහ. මෙය අංගුත්තර නිකායට අයිති සූත්‍ර දේශනාවකි.

මෙම සූත්‍රයෙහි මුල් කොටස සැරියුත් හිමියන් විසින් ද, අග කොටස බුදුරජාණන් වහන්සේ විසින් ද දේශනා කළහ. භික්ෂුවකගේ සිල්වත් බව හා ධම්ම අනුධම්ම පටිපදාව මෙම සූත්‍රයෙන් උගන්වයි.

භික්ෂුව අල්ප මාත්‍ර වූ වරදෙහි භය දක්නා සුලු කෙනෙක් වෙති. සීලයෙන් යුක්ත වූ පුද්ගලයා ක්‍රමයෙන් රාග ද්වේශ සහ මෝහවලින් හටගත් සංයෝජන ධර්ම ප්‍රහාණය කර ගනියි. මෙම සූත්‍ර දේශනාව අවසානයේ දෙව් මිනිසුන් බොහෝ දෙනෙක් මාර්ගඵල කෙළවර නිවන් අවබෝධ කර ගත් බව විස්තර වෙයි.

### දේවදූත සූත්‍රය

මහින්දාගමනය සිදු වී හතරවන දිනයේ දී රජතුමාගේ මඟුල් ඇත්හල පිරිසිදු කරවා එහිදී මජ්ඣිම නිකායේ සඳහන් වන දේවදූත සූත්‍රය උන්වහන්සේ විසින් දේශනා කළහ. නිරාදුක් පිළිබඳව සිහිපත් කොට මිනිසුන් එයින් මුදවාගෙන කුසලයෙහි පිහිටුවා නිවන් මඟ පෙන්වා දීම මෙම සූත්‍ර දේශනාව තුළින් පෙන්වා දී ඇත.

යම රජතුමා විසින් මිනිස් ලොවට වරින් වර එවන දේවදූතයන් පිළිබඳ අවබෝධයක් ලබා දී නිරයෙහි උපදින සත්වයන් මහා නිරයෙහි ඉපදී විඳින දුක් එකින් එක මෙහි විස්තර කරයි. ලෝක පාලක යම රජු අකුසල කරන්නවුන්ට දෙන දඬුවම් ඉතාමත් භයානක අයුරින් මෙහි දේශනා කර ඇත. අනිත්‍ය, දුක්ඛ, අනත්ත යන ධර්මතාවන්වල යෙදී අකුසලයෙන් වැළකී කුසලය තුළින් සංසාර විමුක්තිය පෙන්වා දීම මෙම සූත්‍ර දේශනාවෙන් ප්‍රකට කරයි.

### බාල පණ්ඩිත සූත්‍රය

උන්වහන්සේ මුල් දින කිහිපය තුළ දේශනා කළ හත්වන සූත්‍ර දේශනාව වන්නේ මජ්ඣිම නිකායේ සඳහන් වන බාල පණ්ඩිත සූත්‍රයයි. මහමෙවුනාවේ නන්දන වන උයනේ විශාල පිරිසක් මධ්‍යයේ මෙම ධර්ම දේශනාව සිදු කළහ. මෙම සූත්‍ර දේශනාවෙන් අවිද්‍යාවෙන් මුලාවට පත් වූ පුද්ගලයා බොහෝ අකුසල කර්මයන් සිදු කර ගෙන සසර ගමනේ දුක් විඳින අයුරුත්, ඥාණවන්ත පුද්ගලයා හෙවත් සත්පුරුෂ පණ්ඩිත පුද්ගලයා ප්‍රඥාවෙන් කටයුතු කොට පාපයෙන් වැළකී අප්‍රමාදී ව කුසල කර්මයෙහි යෙදී මෙලොව පරලොව ජයගන්නා අයුරුත් පෙන්වා දෙයි. මෙම බාල පණ්ඩිත සූත්‍ර දේශනාව ශ්‍රවණය කොට බොහෝ දෙනා ධර්මාවබෝධය ලබා ගත් බවත් සඳහන් වෙයි.

### අනමතග්ග සංයුක්තය

ඊළඟට උන්වහන්සේ දේශනා කළේ අනමතග්ග සංයුක්තය යි. බියකරු සසර ගමන දිනිය යුත්තේ කෙසේදැයි මෙම සූත්‍ර දේශනාවන් තුළින් අවධාරණය කොට ඇත.සියලු දිනීම් පරදවා සසර ගමන දිනීම ශ්‍රේෂ්ඨ බව උගන්වන සූත්‍ර කිහිපයක් ම මෙම අනමතග්ග සංයුක්තයට ඇතුළත් වේ. අනමතග්ග සංයුක්තය සංයුක්ත නිකායට අයිති කොටසකි.

පුද්ගලයා ඉපදෙමින් මැරෙමින් පැමිණි වාර ගණන ගණන් කළ නොහැකි බවත්, අති දීර්ඝ සසර ගමනකට නෑකම් කියන පිරිසක් බවත් මෙම වග්ගයෙන් කියැවෙයි. ජීවිතය පිළිබඳ ගැඹුරක් නොදත් සත්වයන් සහ පුද්ගලයන් සසර මැරෙමින් උපදිමින් කාලය විනාශ කර දමන අයුරු පැහැදිලි කරයි. මෙම සූත්‍ර විස්සෙන් ම මනුස්ස ආත්මයක් ලබා ගැනීමේ අතිදුෂ්කර බවත්, බුද්ධ ශාසනයේ පිහිට ලබා ගත හැකි මොහොතක ඉපිදී සිටියදී චතුරාර්ය සත්‍යය ධර්ම අවබෝධය සඳහා උත්සාහවන්ත විය යුතු බවත් මෙහි අවධාරණය කරයි. මෙම සූත්‍ර දේශනාව අසා දහසක් දෙනා මාර්ග ඵල ලබාගත් බව සඳහන් වෙයි.

### අග්ගික්ඛන්ධෝපම සූත්‍රය

අනතුරුව මිහිඳු මහ රහතන් වහන්සේ දේශනා කරනු ලැබුවේ අග්ගික්ඛන්ධෝපම සූත්‍ර දේශනාවයි. පිරිසිදු සිල්වත් පැවිදි ජීවිතයක අගය මෙම සූත්‍ර දේශනාවෙන් පෙන්වා දෙයි. මෙම සූත්‍ර දේශනාව ද අංගුත්තර නිකායේ සුත්ත නිපාතයේ සඳහන් වෙයි.

මහා ගිනි කන්දක් උපමා කරගෙන බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට පෙන්වා දී ඇත්තේ පංච කාමයන්හි ඇලී ගැලී ජීවත් වීමෙන් එය අපාය ගාමී වීමට හේතුවක් වන බවයි. පස්කම් සැප වැළඳ ගැනීමත්, ලැව් ගින්නේ පිළිස්සීමත් යන දෙකින් වඩාත් බලවත් වනුයේ පස්කම් සැප සේවනය බවත්, ලැව් ගින්නෙන් පිළිස්සී මිය යාම ඊට වඩා සැපවත් වන බවයි.

ප්‍රත්‍ය වේක්ෂාවකින් තොරව සිව්පසය පරිභෝජනය කිරීමෙන් නිම කළ නොහැකි අකුසල රැස් වන බවත් මෙහිදී පෙන්වා දුන්හ. බුදුරජාණන් වහන්සේ මෙම සූත්‍ර දේශනාව දේශනා කිරීමෙන් අනතුරුව බොහෝ භික්ෂූන් වහන්සේ සිවුරු අතහැර ගිය බවත්, පසුව අසුරු සැනක් පමණවත් අන් අයට මෛත්‍රිය කොට සිව්පසය පරිභෝග කරන ලෙස උන්වහන්සේ පෙන්වා දුන්හ.

### ආසිවිසෝපම සූත්‍රය

අනතුරුව මිහිඳු මහ රහතන් වහන්සේ නන්දන වන උද්‍යානයේ දී ආසිවිසෝපම සූත්‍ර දේශනාව දේශනා කළහ. මෙම සූතය ද සංයුක්ත නිකායේ මාතුගාම සංයුක්තයට අයිති සූත්‍රයකි. උපමා මඟින් පඤ්චස්ඛන්ධයේ අනිත්‍ය පෙන්වා දෙමින් බුදුදහමේ එන වැදගත් ධර්ම කරුණු විවිධ උපමාවන් ගෙන පෙන්වා දෙමින් කරන ලද පැහැදිලි කිරීම් මෙම සූත්‍ර දේශනාවෙන් සිදුකර ඇත.

කාෂ්ඨමුඛ, ප්‍රතිමුඛ, අග්ගිමුඛ සහ ශස්ත්‍රමුඛ නම් විෂඝෝර සර්පයින් හතර දෙනෙක් තම ශරීරය වෙළාගෙන සිටියි. ඔවුන්ගෙන් එකෙක් හෝ දෂ්ඨ කළොත් මරණය හෝ ඒ හා සමාන මහත් වූ විනාශයක් ම වන්නේ ය. පඨවි, ආපෝ තේජෝ සහ වායෝ යන ධර්ම නයින් හතර දෙනා බවත්, ඔවුන් පෝෂණය කිරීම මහත් අපහසු බවත් එයින් එකක් හෝ කිපීමක් සිදුවුවහොත් එය වේදනාවක් වන අයුරු පෙන්වා දී ඇත.

### ඛජ්ජනීය සූත්‍රය

මිහිඳු මහරහතන් වහන්සේ නන්දන වන උයනෙහි දී අනතුරුව දේශනා කොට වදාළේ ඛජ්ජනීය සූත්‍රයයි. සත්ත්වයා, පුද්ගලයා සකස් වී ඇති පංච උපාදානස්ඛන්ධයෙහි යථා ස්වරූපය පිළිබඳ මනා විග්‍රහයක් මෙම සූත්‍ර දේශනාවෙන් පෙන්වා දෙයි. මෙම සූත්‍රය ද සංයුක්ත නිකායේ ඛජ්ජනීය වර්ගයට අයත් දේශනාවකි. රූප. වේදනා සංඥා, සංඛාර සහ විඤ්ඤාණ යන උපාදානස්ඛන්ධ සහ ඒවායෙහි යථාර්ථය පිළිබඳ විවරණයක් මෙම දේශනාවෙන් පෙන්වා දෙයි.

අනිච්ච, දුක්ඛ. අනාත්ම බව මෙනෙහි කිරීම ජීවිතයේ යථාවබෝධය සඳහා හේතු වෙයි. පංච උපාදානස්ඛන්ධය පිළිබඳව මනසින් ප්‍රත්‍යවේක්ෂා සහගතව සිතීමෙන් ජීවිතය පිළිබඳ ව යථාවබෝධය ලබා ගන්නා අයුරු පෙන්වා දෙන සූත්‍ර ධර්මයකි. යමෙක් මෙලොව සත්‍යාවබෝධය කළේ නම් ඒ හැම දෙනාම පංච උපාදානය පිළිබඳ නුවණින් සලකා බලා සියලු සංස්කාර ධර්මයන්ගේ අනියත බව පසක් කර ගත්හ.

### ගෝමය පිණ්ඩූපම සූත්‍රය

පංච උපාදානස්ඛන්ධය ගොම පිඩුවක් සේ දැක ඒවායෙහි මම ය මාගේ ය යැයි කරගත හැකි අන්තභාවයෙන් ගත හැකි කිසිවක් නොමැති බව දැන දැක පසක් කර ගැනීමට උපකාර වන මහඟු සූත්‍ර ධර්මයකි මෙය. මිහිඳු මහරහතන් වහන්සේ හයවන දිනයේ දී නන්දන වන උයනේ දී මෙම ගෝමය පිණ්ඩූපම සූත්‍ර දේශනාව දේශනා කළහ. මෙම සූත්‍ර ධර්මය ද සංයුක්ත නිකායේ පුෂ්ප වග්ගයේ අන්තර්ගත වූවකි. පංච උපාදානස්ඛන්ධය ගොම පිඩකට උපමා කරගෙන දේශනා කළ දේශනාව ගෝමය පිණ්ඩූපම වශයෙන් නම් කර ඇත.

ගොමපිඩුව පිළිකුල් දෙයක් සේ දැක පංච උපාදානස්ඛන්ධය ද මම ය මාගේ ය කර නොගෙන ආර්ය මාර්ගය තුළ ගමන් කරන අයුරු මෙයින් පෙන්වා දී ඇත.

### ධම්මචක්කපවත්තන සූත්‍රය

මිහිඳු මහරහතන් වහන්සේ මහමෙවුනාවේ නන්දන වන උයනේ දී සත් වැනි දින මෙම සූත්‍ර දේශනාව දේශනා කළහ. බුදුසසුනේ ඉර හඳ සේ පවතින්නේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවයි. ධම්මානුධම්ම ප්‍රතිපදාවේ දී අන්ත අතහැර මධ්‍යම ප්‍රතිපදාව තුළ කටයුතු කිරීමෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගත හැකි බව ප්‍රකට කරන බුදුරජාණන් වහන්සේ විසින් බරණැස ඉසිපතනාරාමයේ දී පස්වග තවුසන්ට දේශනා කරන ලද පළ මු ධර්ම දේශනාවයි දම්සක් පැවතුම් සූත්‍රය.

### මහා අප්පමාද සූත්‍රය

මිහිඳු මහරහතන් වහන්සේ දින විසි හයකට පසුව ඇසළ මස තෙළෙස්වක දිනයෙහි දේවානම්පියතිස්ස මහරජතුමා ඇතුලු පිරිසට මෙම සූත්‍ර දේශනාව සිදු කළහ. අංගුත්තර නිකායේ දසක නිපාතයට අඩංගු සූත්‍ර දේශනාවකි. අපා, දෙපා, චතුෂ්පා, බහුපා යන කකුල් නොමැති , පා දෙකේ , සතර පා ඇති, බොහෝ පාද ඇති අය අතුරෙන් බුදුරජාණන් වහන්සේ ම ශ්‍රේෂ්ඨ බව පෙන්වමින් යම් කුසලයක් ඇත්නම් ඒ හැම කුසලයකට ම අප්‍රමාදය මුල්වන බව මෙහි දී පෙන්වා දෙයි.



පීඨාධිපති,
බෞද්ධ අධ්‍යයන පීඨය,
ශ්‍රී ලංකා භික්ෂු
විශ්වවිද්‍යාලය
අනුරාධපුරය
ආචාර්ය
**කඩවත්ගම
පියරතන නාහිමි**

### වස්සූපනායිකක්ඛන්ධකය

මිහිඳු මහරහතන් වහන්සේ ඇසළ පුර පසළොස්වක වන දිනට පසු දින මිස්සක පව්වේ වස් වාසය කළහ. දේවානම් පියතිස්ස මහරජතුමාට තමන් වහන්සේ ඇතුලු මහා සංඝයා වහන්සේ මිස්සක පව්වට වැඩම කළේ වස් වැසීමට බව ප්‍රකාශ කළහ.

එතැන දී මහරජතුමා ඇතුලු පිරිසට මෙම වස්සූපනායක ධර්ම දේශනාව දේශනා කළහ.

මෙම දේශනාවේ දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂුවට වැසි කාලයේ දී වස් විසීමට අනුදැන වදාළ බවත්, එම වස් එළඹීම සිදුකරන අයුරුත්, ඒ හා සම්බන්ධ විනය ප්‍රඥප්ති මෙම ඛන්ධකයට ඇතුළත් වෙයි.

මෙම වස්සූපනායිකක්ඛන්ධයකය විනය පිටකයේ මහාවග්ගපාලියේ සඳහන් වන ඛන්ධක දහයෙන් තුන්වන ඛන්ධකය වස්සූපනායිකක්ඛන්ධකයයි.

මෙම ධර්මය ශ්‍රවණය කළ දේවානම් පියතිස්ස මහරජතුමාගේ බෑනා වූ මහා අරිට්ට ඇමතිවරයා පනස්පස් දෙනකුගෙන් යුක්ත පිරිසක් සමඟ පැවිදිවී අරහත් භාවයට පත් වූ බව සඳහන් වේ. භික්ෂූන් වහන්සේගේ විනය හා සම්බන්ධ ප්‍රඥප්තීන්ගෙන් මෙම ධර්ම විස්තරය සම්පූර්ණ වේ.

සසුනේ අනාගත චිරස්ථිතිය සඳහා ධර්මයෙන් අංග සම්පූර්ණ, නොසැලෙන, ශක්තිමත්, පදනමක් දමා ඇති ආකාරය මිහිඳු හිමි ධර්ම දේශනා දෙස බලන කළ පසක් කරගත හැකි ය.

ලංකාද්වීපය තුළ සම්බුද්ධ ශාසනයත්, තදනුබද්ධ හර පද්ධතීන් සහ බෞද්ධ සංස්කෘතියත් ඒකාබද්ධව වසර දහස් ගණනක් පුරා මේ දක්වා ම පවතින්නේ මිහිඳු මහරහතන් වහන්සේ විසින් සිදු කරන ලද දූරදර්ශී වැඩ පිළිවෙළ නිසා බව පෙන්වා දිය හැකි ය.

## උතුම් අනුබුදු මිහිඳු සමිඳුනි

සම්බුදුන් පිරිනිවීමෙන් පසු
දෙසීය තිස් හය වස් ඇවෑමෙන්
සුපුන් සඳ මඬලක් ලෙසින් පෑ
මගේ අනුබුදු සමිඳු අඹතල

රන් රුවක විලසේ
එකලු කළෙ ලක්දිව මගේ


අඹ පැනෙන් ලක් නර නිඳුන් තිස්
සුරත දැරූ අවි පතිත විය බිම
එතැන් සිට මගෙ මව් බිමේ ඝන
අඳුර ගිලිහී දහම් පුර සඳ

නැඟී සත පිබිදී
කෙලෙස් මල සැම සන්සිඳී

අසූවස් කල් දම් සිසිල දී
මගේ සිරිලක් බිමෙහි පිරිනිවි
උතුම් අනුබුදු මිහිඳු නාමය
දනන් තුඩ තුඩ රැව් නැඟෙන්නේ

අඹ තලා මුදුනේ
පොසොන් සඳ රැස් සිසිල දේ

**ආචාර්ය රත්නපාල වික්‍රමසිංහ**





# හෙළ බොදු උරුමය අනාගතයට සුරකිමු

**අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන දූත පිරිස ලංකාවට හඳුන්වා දෙන ලද සංස්කෘතිය ලොව කිසිදු ආගමක නැති බව සඳහන් කළ හැකි ය.**

බෞද්ධ දර්ශනය තුළින් ජන ජීවිතය අර්ථවත් කළේ ය.

භාෂාව, සාහිත්‍ය, කලා ශිල්ප, සිරිත් විරිත්, පුද පූජා ක්‍රම, උත්සව ආදි මෙරට සංස්කෘතියේ සෑම අංගයක් ම පෝෂණය විය. මෙරට ආර්ථිකය ද, දේශපාලනය ද බුදුදහමට අනුව පෙළ ගැසුණු අතර එමඟින් ඉහත කී සංස්කෘතිකාංග පෝෂණය කිරීමට අනුග්‍රහය ලැබුණි.

පොදු ජනතාවගේ ජීවිතය සමඟ එක්වූ සිරිත් විරිත් මෙන්ම බෝධි පූජා, බුද්ධ පූජා, ධාතු පූජා, ස්තූප පූජා ආදී විවිධ උත්සව ද බෞද්ධ සංස්කෘතිය තුළින් ගොඩනැඟුණි. විශේෂයෙන් බෞද්ධයන්ගේ ශ්‍රද්ධාව වැඩි දියුණු කළ හැකි, හැකියාව ඔපවත් කළ හැකි එම බෞද්ධ පුද සිරිත් සහ උත්සව ඔවුන්ට අහිංසක සතුටක් ලැබීමට සහ සාමූහිකත්වය වර්ධනය කර ගැනීමට ද උපකාරි වූ බව පෙනේ.

විහාරස්ථානය කේන්ද්‍රස්ථානය කර ගනිමින් ජීවිතයේ උපතේ සිට මරණය දක්වා සිදුකරන සියලු වැදගත් කාර්යයන් සිදුකළේ ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලබා ගනිමිනි. ගැබිණි මවට අංගුලිමාල පිරිත තුන් වරක් දේශනා කරවීම, මෙලොවට බිහි වූ දරුවා පළමුව දළදා මැදුර, ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් හෝ ගමේ විහාරස්ථානයට රැගෙන ගොස් තෙරුවන් සරණ ලබාදීම විශේෂිත ය. උපත විපත සිහිකරමින්, දන් පින්කම් පිරිත් දේශනා කරමින් පින් අනුමෝදනා කිරීම සිදුකරයි.

දිනපතා පන්සිල් සමාදන් වීම, තෙරුවන් නැමදීම, සතර පෝයට අටසිල් සමාදන්වීම, පෝය දින තෙල් මල් රැගෙන විහාරස්ථානයට දරුවන් හා අසල්වාසීන් සමඟ එකට එකතු වී ගොස් බුද්ධ පූජා පැවැත්වීම, ධර්මය ශ්‍රවණය කිරීම, මහා සංඝරත්නයේ අනුශාසනා ලබා ගැනීම තුළින් ජීවිතයේ අඩුපාඩු සකස් කර ගනිමින් විනය ගරුක පුද්ගලයෙක් වීම, හිරි ඔතප්ප දෙක අවබෝධ කර ගනිමින් පවට බියව, පිනට ලැදිව ක්‍රියා කළහ. මිහිඳු හිමියන්ගේ ආගමනයෙන් පසු පන්සිල් රකින සමාජයක් බිහි විය.

පළමුව රටේ පාලකයා වන රජු පන්සිල් පිළිගත් අතර අනතුරුව රටේ ජනතාව පන්සිල් රැකීමට පෙළ ඹුණහ. මෙහිදී ආදර්ශය ලැබුණේ ඉහළිනි. ජනතාවට යම් ප්‍රතිපත්තියක් ලැබුණේ රාජ රාජ මහාමාත්‍යාදී වැනි ඉහළ පෙළේ පාලකයන් ඒ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමේ ආදර්ශයත් සමඟ ය.

බුදු දහමත් සමඟ අපේ කෘෂිකාර්මික සමාජය තවත් දියුණුවීම නිසා වැව් සාදා ජලය ලබාගෙන කරන ගොවිතැනට භික්ෂූන් වහන්සේ ද එකතු වූහ. මෙහිදි දියුණු වන සමාජයට ඒකාබද්ධව බෞද්ධ භික්ෂුවට කළ හැකි කාර්ය කිහිපයක් විය.

පළමුවෙන් ම උන්වහන්සේ ආගම ධර්මයට අනුව අධ්‍යාපන ක්‍රමයක් සමාජයට ලබා දුන්හ. එමෙන්ම පොතපත ලිවීමේ දී මෙලොවටත්, පරලොවටත් අවශ්‍ය දැනුම ලබා දුන්නේ ද උන්වහන්සේ ම වූ හෙයින් එකී කරුණු මිහිඳු හිමියන්ගෙන් ලැබුණු දායාද ලෙස පෙන්වා දිය හැක.

තවද කෘෂිකාර්මික ජීවිතයේ දී ස්වාමීන් වහන්සේගෙන් අනුශාසනා ලැබූ අතර, වැවක් සාදන විට දාගැබක් ද ඉදිවිය. ඊට අදාළ චාරිත්‍ර හා ගුරු හරුකම් උපදෙස් උන්වහන්සේ ලබා දුන්හ. එමෙන්ම ගොවිතැනට අවශ්‍ය නැකැත්, කලට වේලාවට ගොවිතැන් කිරීමේ අගය, බීජ වැපිරීම හා වගා කිරීම්, කල්වේලා නොඉක්මවීම පිළිබඳ ව උන්වහන්සේගේ මඟ පෙන්වීමේ සංස්කෘතික ලක්ෂණයක් විය.

මිහිඳු හිමියන්ගේ සඟ පරපුර ජනතාවගේ ලෙඩ රෝග සහ සෞඛ්‍ය පිළිබඳ උනන්දු වූ අතර ඒ සඳහා මුදල් අය නොකළහ. හුදෙක් ජනතාව කෙරෙහි අනුකම්පාවෙන් සෞඛ්‍ය ගැන ජනතාව උනන්දු කිරීමක් ද, ජනතාව අතර ඇතිවන ආරවුල් විසඳුවේ ද විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ ය.

ස්වාමීන් වහන්සේ ඊළඟට පිහිට වූයේ මිනිසුන්ගේ මානසික දුකට ය. විවිධ ප්‍රශ්නවලින් පෙළෙන මිනිසුන්ට උපකාර ලැබුණේ විහාරස්ථානයෙනි. එහෙයින් වර්තමානයේ සිදුවන උපදේශනය (COUNSILING) එදා සිදුවූයේ පන්සලෙන් ය. ලෙඩක් ,මරණයක්, කම්පනයක් හෝ වෙනත් කරදරයක් සිදුවූ විට ඊට ඉදිරිපත් වූයේ මිහිඳු හිමියන්ගේ මේ නියෝජිත පිරිස ය. ගස්වැල් සතා සිවුපාවාට ඉතා ආදරයෙන් සලකන්නට මිනිසා පුරුදු වූහ. දෙවැනිපෑතිස් රජු මුව දඩයම අත්හැරීමත් සමඟ සතුනට ද හිංසා කිරීම නොකරන්නට මුළු සමාජය ම උනන්දු විය.

අකුරු සාහිත්‍යයක් අපට ලැබුණේ මහින්දාගමනයෙනි. ස්වාමීන් වහන්සේ බුදුදහම මුල්කොට ගෙන පොතපත රචනා කළ නිසා අපේ සාහිත්‍ය අලංකාර විය. අනුරාධපුර යුගයේ සිට ධර්ම ශාස්ත්‍රීය කෘතියද සම්පාදනය වීමෙන් සාහිත්‍යය පෝෂණය විය. සාහිත්‍ය පමණක් නොව ලලිත කලාව, චිත්‍ර කැටයම් බුදු දහමින් පෝෂණය විය. ලෝවාමහාපාය, රුවන්වැලිමහ සෑය, අභයගිරිය බුදුදහම නිසා ලැබුණි. මේ ආලෝකය සිංහලයාට දායාදයක් විය. ලංකාව පුරා වැව් දහස් ගණනක් ගොඩනැඟුණේ ද ඒ අනුව යි.

එහිදී රාජ්‍ය පාලනය බුදුදහමට එකඟව සිදුවිය. මේ අනුව රජු ධාර්මික විය. පංචශීල ප්‍රතිපත්තියට අනුගතව සතර සංග්‍රහ වස්තු, සතර අගති, දසරාජ ධර්ම, දස සක්විතිවත් ආදියේ පිහිටා රජු රාජ්‍ය කරවීය. මෙහිදී දේවානම්පියතිස්ස රජුගේ පටන් සිරිසඟබෝ රාජ්‍ය පාලනය අපට සිහිවේ. මේ බෞද්ධ රාජ්‍යවරුන්ගේ පාලනය යටතේ සියලු සතුන්ට නිදහස ලැබුණි. අවි ආයුධ නිෂ්පාදනයෙන් හා විෂ ද්‍රව්‍ය නිෂ්පාදනයෙන් තොරවීම, මත්ද්‍රව්‍ය සහ මත්පැන් නිෂ්පාදනය නොකිරීම , මසට සතුන් නොවිකිණීම යන මේ මූලධර්ම ප්‍රතික්ෂේප කළහ. රජ්‍ය පාලකයින් නිවැරැදි මඟ ගමන් කරවීමට අනුශාසනා කළේ මහා සංඝරත්නය යි.

මහජන බලය රජුට දැනෙන්නට මඟ පෑදුනේ භික්ෂූන් වහන්සේ මඟිනි. එහිදී රජු යහමඟට යැවීමට උපක්‍රම උන්වහන්සේට තිබුණි. ගැමුණු හා තිස්ස සොහොයුරන් සමඟි කරවූ සැටි ප්‍රකට නිදසුන් ය. මහජන බලය එක්තැන් කිරීමට මිහිඳු හිමියන් සමඟ මෙරටට වැඩම කළ සඟරුවන මුල් වූහ. රජවරු රට පාලනය කළද ඔවුනට අවශ්‍ය මහජන බලය ගැනීමට අවස්ථා මතුකර දුන්නේ ද බෞද්ධ භික්ෂූන් වහන්සේ ය.

මිහිඳු හිමියන් නව සමාජයක් ගොඩනැඟීමට අත්තිවාරම් දැමුවේ බුදුදහම පමණක් මෙරටට ගෙන ඒමෙන් නොව ඒ සමඟම විශාල ඥාන සම්භාරයක් හා ශිල්පීය ක්‍රමයක් අපට දායාද කිරීමෙනි. අනුරාධපුර යුගයේ ජීවත් වූ ජනතාව දවසට දෙවතාවක් එකට එකතු වී සිය නිවසේ, පවුලේ සියලු දෙනා සමඟ ආගමික කටයුතුවල නිරත වූහ. සවස් වරුවේ ඔවුන් පිරිත් පොත හා ජාතක පොත වැනි වටිනා ග්‍රන්ථ කියවූහ. එහිදී පියා සමඟ පිරිමි දරුවන් කෘෂිකාර්මික කටයුතුවල යෙදුණු අතර, ගැහුනු දරුවෝ සිය මවට එකතුව ඉවුම් පිහුම් කටයුතු කළහ. මේ තුළින් පවුලේ එකිනෙකා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව ඇතිවිය. එවිට පවුලත්, අවට සමාජයත්, පන්සලත් අතර සම්බන්ධය දැකගත හැකිවිය.

එහෙයින් යුතුකම් හා කළගුණ සලකන සුහදශීලි දුකේදී සැපේදී පිහිට වන පුද්ගල සමාජයක් ඇති වීමට මිහිඳු හිමියන් වැඩම වීම ඉවහල් විය. එමනිසා වර්තමාන සමාජය ද මේ දායාද රැකගෙන ඉදිරියට යා යුතු ය.



ගාල්ල මානවිල බෙත්තාරාමාධිවාසී,
අධ්‍යාපන විද්‍යා දර්ශනවේදී සද්ධර්ම කීර්ති ශ්‍රී,
ත්‍රිපිටකවේදී විනයාචාර්ය
ශාස්ත්‍රපති
**දෑරංගල මංගල හිමි**

**සිරි සදහම් පැන විසඳුම්**



සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුර ලියා එවා ගුණසේන සහ සමාගමෙන් "මහ පිරිත් පොත් වහන්සේ " ධර්ම ග්‍රන්ථය හිමිකර ගන්න.

සතිපතා ජයග්‍රාහකයින් පස් දෙනකුට ත්‍යාග තිළිණ කෙරේ

බුදුසරණ

සතියේ ප්‍රශ්නය - 86

**චේතියගිරිය ලෙස හැඳින්වෙන පින්බිම කුමක් ද?**

ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

පිළිතුර : ..........

නම : ..........

නිවසේ ලිපිනය : ..........

..........

දුරකතන අංකය : ..........

ඇම්. ඩී. ගුණසේන - බුදුසරණ සිරි සදහම් පැන විසඳුම් , බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10



# ගැඹුරු දහමක් සරලව ...

03 පිටුවෙන් ...

යමරජු විසින් මරණයේ දුකත්, ජීවිතයේ නිසරු බවත් පැහැදිලි කරන දේවදූතයන් දුටුවා ද?

යනුවෙන් ප්‍රශ්න කරයි. ඔබ දුටුවාද තමන්ට කිසිවක් කරකියාගත නොහැකිව උපදින දරුවා මල මුත්‍රා ගොඩේ වැටී නිදන ආකාරය. ඒ පළමු දේව දූතයා ය. තමා ආශාවෙන් පරිහරණය කළ

රැක ගත් ශරීරය කෘෂවී වැහැරී ජරාවට පත් මහල්ලා දුටුවා ද? ඒ දෙවන දේවදූතයා ය.

අපරාධවලට අසුවී රාජ දඬුවම් ලබා කසපාර කන, වේදනා විඳින පුද්ගලයා දුටුවා ද? ඒ තෙවැනි දේවදූතයා ය. ඔබ ජීවිතයේ නිසරුබව දුටුවා ද? මළ මුත්‍රා ගොඬේ එක් තැන් වී දුක් විඳින ලෙඩා දුටුවා ද? ඒ හතරවැනි දේව දූතයා ය.

මෙසේ යමරජු සතර අපාය සංජීවය, කාළ සූත්‍රය, සංඝාතය, රෞරවය, මහා රෞරවය, තාපය, ප්‍රතාපය, අවිචිය තත්ත්වය දකින්නට සලස්වනු ඇත.

මෙසේ ඉතා වටිනා ධර්ම කරුණු රාජවාසලේ දී දේශනා කිරීමෙන් පසු දෙවන පෑතිස් මහ රජු අගනා දහම් පණිවුඩය සිත් සතුටින් පිළිගන්නා ලදී.

අනුබුදු මිහිඳුහිමියන් ලක්වැසි දනන් හට හඳුන්වාදුන් ඒ නිර්මල බුදු සමය සමඟ මෙරට ආගමික, ජාතික, සංස්කෘතික හා සාමාජික නවෝදයක් ඇති විය. මිනිසාගේ ක්‍රියා කලාපය සිතුම් පැතුම්, අදහස් උදහස් පූර්ණ වෙනසකට බඳුන් විය. එදා සිට අද දක්වා ලක්දිව බුදු සසුන ඔපවත්ව බබළවන්නට ලක්වැසි දනන් කැපවනුයේ එනිසාම ය. ඒ අනුව රටේ රජුගේ පටන් හුදී ජනයා දක්වා හදවත් තුළ මුල් බැසගත් ආගමික ශ්‍රද්ධාව හා ධාර්මික ආර්ථික රටාව, දැහැමි පෝෂණය අනොන්‍ය සුහදතාවය, ආගමික සහජීවනය, ජාතික එකමුතුව බුදු දහමේ හර පද්ධතීන් ය. එදා මෙදා තුර ගිහි පැවිදි දෙපාර්ශවය භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා වශයෙන් සිව්වනක් පිරිස එකට ඇද බැඳ තබන්නට උතුම් බුදු දහමට හැකියාව ලැබුණි.

# මිස්සක පව්වෙන් ...

05 පිටුවෙන් ...

ගිහිපැවිදි උතුමනට එදා හෙළයෝ අත්‍යාදර ගෞරව පෙරදැරිව වැඳුම් පිදුම් කළහ. පවුලට, සමාජයට කළ යුතු යුතුකම් යනාදිය මැනවින් ඉටුකිරීමට ද, ධාර්මික සරල සුන්දර දිවිපෙවෙතකට ද සිඟාලෝවාද, මංගල, වසල, ව්‍යග්ඝපජ්ජාදි සම්බුදු දේශනා මහෝපකාරි විය.

මෙවන් ආකාරයෙන් සිරිලක් සමාජය ප්‍රභාවත්වැ හෙළි පෙහෙළි වූයේ ද, මිථ්‍යා ගන තිමිර පටලින් වැසුණු දේශයට සත්‍යයේ අරුණාලෝකය පතිත වූයේ ද, පොසොන් සදහම් සොමිකැන් ලක්දෙරණ සිප ගත්තේ ද, පොසොන් පුන් පොහෝ දිනක දී ය. ජාතියට ප්‍රඥාවේ ආලෝකය එදින උදාවුණි.

මිහිඳු මහරහතන් වහන්සේ අභියස පංචශීලය, සමාදන් වූ හතළිස්දාහක අපේ මුතුන්මිත්තෝ තම පණමෙන් පන්සිල් රැක්කහ. පස්පව් පිළිකෙව් කළහ. ගොවිතැන් බතින් දිවි සරි කර ගත්හ. සම්මා ආජීවයෙන් ජීවිතය ජය ගත්තහ. කෙතෙන් බඩ වියතත්, දාගැබෙන් ආධ්‍යාත්මික ඉගැන්වීම් පරමාදර්ශී සමාජ සංස්ථාවකට මඟ පෑදුනු ආකාරය සිරිලක් සමාජ සංස්ථාවෙන් විද්‍යමාන විය.

අහස්කුස නැගුණු උස් දාගැබ් සේ ම සිරිලක් වැසි දනන්ගේ උතුම් මිනිස්කම් ද එලෙසින් ම උස්විය.

මට කියන්නකෝ, අනෙකාගේ දාහය මහන්සිය සරතැස උදෙසා ගිමන් නිවා ගැනීමට අම්බලම් හදන ලෝකයේ වෙන රටක්. මට කියන්නකො අනෙකාගේ පවස, පිපාසය නිවන්නට පිංතාලිය තබන වෙනත් රටක්.

මට කියන්නකො අනෙකාගේ කුසගිනි නිවන්නට මෙතරම් දන්සල් ඉදිවන වෙනත් රටක්.

මේ සත්පුරුෂ හදවත ඔප මට්ටම් කරන්නට බුදුන් වහන්සේගේ පණිවුඩය මෙහි රැගෙන වැඩි මිහිඳු මහ රහතන් වහන්සේගේ ඉගැන්වීම් මහෝපකාරී විය.

උතුම් මිනිස්කමින් දන මන බැන්දූ රන්හුය, රන්දම බුදුදහම යි. මිනිසා ගැන පමණක් නොව සතා සීපාවා ගැන ද අපේ ඇත්තෝ වෙසෙසින් සිතූහ. සැබෑ ලෙසම තිරසාර සෞභාග්‍යය යනු ආර්ථිකය, සමඟින් ම සංස්කෘතික, සාමාජීය දේශපාලන යන මේ සෑම ක්ෂේත්‍රයකම වෘද්ධිය යි. තර්ක රහිත ,අවිවාදිත, සැබෑවක් ම කියමි. එනම් අංග සම්පූර්ණ ශ්‍රේෂ්ඨ ශිෂ්ටාචාරයක්, උත්කෘෂ්ට සභ්‍යත්වයක්, පරමාදර්ශී සංස්කෘතියක් සහජීවනයෙන් බැඳුණු තිරසාර සමෘද්ධියක්, මිස්සක පව්වෙන් පැන නැඟි සදහම් අමා ගඟුලින් සිරිලක් මාතාවට දායාද වූ බව යි.

ඒ වූ කලි වචනයෙන් කිවනොහැකි තරම් වූ වටිනාකම් සම්භාරයකි. අමිල ධන නිධානයකි. වටිනාකම තක්සේරු කළ නොහැකි ඒ මහාර්ඝ වස්තුවෙන් අද්‍යතන ලක්වැසි ජනතාව විපුලඵල නෙළා ගත්තේ ද යන්න විමසිය යුතු කරුණකි.

මේ ඉරහඳ තාරකා යට දුටු දුටු දනන්ගේ නෙත් සිත් පැහැර ගන්නා මිහි පිට සුරපුරය සිරිලංකා ද්වීපය පවතින කල් එදා මිස්සක පව්වෙන් පැන නැඟි සදහම් ගඟුලේ සිසිලසින් ලක්දෙරණ මනුසත් හද රැඳි සත්පුරුෂ ගති සොබා කිසිවිට වියැකී නොයනු ඇත. සියලු සත්වග සදහම් ගඟුලේ සිසිලෙන් සැනසෙත්වා!


**ගම්පහ ප්‍රදේශයේ අලුතින් ආරම්භ කරනු ලබන වැඩිහිටි නිවාසයක් සඳහා වැඩිහිටියන් බඳවාගැනේ.**
071-1515335

ගාල්ලේ මෙහෙණි ආරාමයක දසසිල් මාතාවකට **නැවතීමට පහසුකම් ඇත.**
0718609760, 0776281041

**වැඩිහිටි හිමිනමක් යටතේ හෝ වසා ඇති විහාරස්ථානයක් සොයනු ලැබේ.**
071-6936825
075-1304658

**වැඩිහිටි භික්ෂුවකට උපස්ථාන කරමින් වැඩ සිටීමට කැමතියි.**
071-6936816

මීගොඩ ප්‍රදේශයේ භාවනා මධ්‍යස්ථානයක තෙරණින් වහන්සේ නමකගේ මගපෙන්වීම යටතේ
**නිවන් දැකීම අරමුණු කරගෙනම මහණ දිවියට එළඹෙන්න / දසසිල් මාතාවක් වෙන්න අපේක්ෂාවෙන් සිටින පින්වත් කාන්තාවන් අමතන්න.**
උදේ 9.30 සිට සවස 4.30 දක්වා
077 2618047 / 0718312598

**නිවැරදි දහම ලබමින් අවංකවම මෙම ජීවිතයේදීම ධර්මාවබෝධයට කැමති නිරෝගී නවක හිමි නමකට - ගිහි මහතෙකුට අවස්ථාව ඇත.**
071-0713197

**ආරාධනාවයි**
වස් වසා වැඩ සිටීමට ස්වාමීන් වහන්සේ නමක්, පැවිදි කිරීම සඳහා කුල දරුවන් කිහිප දෙනෙක්, කැපකරුවෙක් අවශ්‍යව ඇත.
විමසන්න : 077 1005057

**තායිලන්තයෙන් ගෙන්වන ලද**
අඩි 3 උස, අඩි 2 පළල පිත්තල ඉදි පිළිමය හා අඩි 1 1/2 උස අඩියක් පළල පිත්තල ඉදි පිළිම හා අඩි 4 1/2 දිග අඩි 2 1/2 පළල ශ්‍රී පතුල **විකිණීමට.**
071-8071009

**ගිහි සේවකයෙකු**
පන්සලක නැවතී කටයුතු කිරීමට වයස 40-50 සුරාවෙන් තොර ගිහියෙකු අවශ්‍යයි. ගමේ පන්සලේ විහාරාධිපති හිමියන්ගෙන් චරිත සහතිකයක් සමග පැමිණෙන්න.
**පෙතියාගොඩ විහාරය, කැලණිය.**

**පිං කැමති ඔබට කාරුණික ආරාධනා !**
2022 වර්ෂයෙහි කොළඹ විහාරස්ථානයක කඨින පිංකම සිදු කිරීමට ආරාධනා, තවද එම විහාරස්ථානයෙහි දේවාලයක් ඉදිකර දේවාශිර්වාද ලැබීමටද ආරාධනා, එමෙන්ම උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන්ටද වැඩ විසීමට ආරාධනා.
**විමසීම් : විහාරාධිපති හිමි - 071-5373235, 076-0912997, 077-2528120**

**විහාර චිත්‍ර හා මූර්ති නිර්මාණය කරනු ලැබේ.**
**අමතන්න**
0702388894

**මැදිවියේ සියම් නිකායේ සාමණේර හිමිනමකට උපසම්පදා වීමට ගුණයහපත් ගුරු හිමිනමක් සොයයි.**
072-0493603

**උපස්ථායිකාවක් සොයයි**
අසනීප වැඩිහිටි කාන්තාවක් බලා ගැනීමට කාන්තාවක් සොයයි.
0112792201

**අඩු ආදායම්ලාභී පවුලක පාසල් සිසුවෙකුගේ අධ්‍යාපන කටයුතුවලට උදව් කිරීමට කැමතිය. බස්නාහිර පළාත විශේෂයි.**
0717955051 / 0779136213

**භික්ෂූන් වහන්සේ නමකට වස් විසීම සඳහා ග්‍රාමීය හෝ හුදකලා පරිසරයකින් කුඩා නිවසක් සාධාරණ කුලියකට හෝ පිංතකා උවමනායි.**
**කුරුණෑගල, කෑගල්ල, ගම්පහ දිස්ත්‍රික්ක විශේෂයි.**
0777-146505

**කාරුණික මහත්මයකු හෝ නෝනා කෙනෙකු ළඟ**
සේවයට හෝ නැවතීමට අවු. 28 පිරිමි කෙනෙක් සොයමි.
0768773849

**උපසම්පදා ස්වාමීන් වහන්සේ නමක් පන්සලක් සොයයි**
උඩරට අමරපුර නිකායට අයත් උපසම්පද ස්වාමීන් වහන්සේ නමක් අමරපුර නිකායට අයත් වසාදමූ හෝ අතහැර දමූ පන්සලක් හෝ අලුතින් ඉදිකරන පන්සලක් ලියාපදිංචි නොකළ සොයයි.
**ගම්පහ අනුරාධපුර කුරුණෑගල විශේෂයි.**
076-0599780, 070-3145466

**වස් විසීමට, දිගටම වැඩසිටීමට පන්සලක් සොයමි**
45 වියැති උපසපන් හිමි නමකි.
0783568608

**වකුගඩුවක් උවමනාය**
37 වන වියේ පසුවන දෙදරු පියෙකුට B පොසිටිව් වර්ගයේ වකුගඩුවක් සොයයි. HLA සහතිකය තිබෙන අය විමසන්න.
0779756223, 0117331390



දිවයින පුරා සිටින අඩු ආදායම්ලාභීන් සඳහා
**අවමංගල්‍යාධාර ලබාදීම**
කතරගම, කාවන්තිස්සපුර ධම්මවිචය විහාර බෞද්ධ සංගමය
බෞ. කො./වි. හා. දෙ/09/09/043



ඓතිහාසික වාරණ රජමහා විහාරාධිපති, සියනෑ හාපිටිගම් අලුත්කුරු කෝරළයේ ප්‍රධාන අධිකරණ සංඝනායක, මුළු දිවයිනටම සාමවිනිසුරු, පූජ්‍ය, ආචාර්ය දොම්පේ ශ්‍රී පුඤ්ඤානන්ද නාහිමි වන මාගේ ගුරු දේවෝත්තමයන් වහන්සේගේ අනුශාසනා මත, වාරණ රජමහා විහාරවාසී, රුහුණු කතරගම, කාවන්තිස්සපුර ධම්මවිචය විහාරාධිපති, බත්තරමුල්ලේ සීලරතන හිමි වන, මාගේ පූර්ණ අනුදැනුම මත, අප රටේ ජීවත් වන ඉතාමත් අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් කරන සත්කාරයක් වශයෙන්, ඔවුන්ගේ අවමංගල අවස්ථාවලදී දේහය බහාලීමට භාවිත කරන පෙට්ටිය (මිනී පෙට්ටිය) ලබාදීමට තීරණය කර ඇත.

ඒ සඳහා කැමැත්තක් දක්වන අඩු ආදායම්ලාභී ඔබට අයදුම් කළ හැක. ඔබ ප්‍රදේශයේ විහාරස්ථානයක විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ නිර්දේශ ලිපිය සමඟ, ඔබගේ නම, ලිපිනය, හැඳුනුම්පත් අංකය සහ ග්‍රාමසේවා සහතිකය සමඟ අප වෙත ඔබගේ අයදුම් පත ලැබීමට සලස්වන්න. දිස්ත්‍රික්ක මට්ටමින්, ගම් මට්ටමින් මෙය සංවිධානය කරලීමට ඔබට ආරාධනා කරමු.

**මෙම උතුම් සත්කාරයට ඔබත් හැකි පමණ දායක වන්න.**
ගිණුම් අංක 82578082 ධම්මවිචය විහාරය බෞද්ධ සංගමය BOC City Office, Colombo.

**පූජ්‍ය බත්තරමුල්ලේ සීලරතන හිමි,**
දේවාල පාර, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.
දුර./ Whatsapp 0718 872671 / ෆැක්ස් : 0112 882028
ඉමේල් : dammavicaya@yahoo.com FB : Dammavicaya



# සමානාත්මතාවට මුල් තැන දුන්

# බෞද්ධ ආරාමික අධ්‍යාපනය

**ආරාම මුල් කර ගත් අධ්‍යාපන ක්‍රමය බුදුදහම මානව ශිෂ්ටාචාරයට උරුම කොට දෙන අගනා දායදයකි. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් සම්ප්‍රදාය පුද්ගලයා තුළ මෙන්ම තමා ජීවත් වන ලෝකය පිළිබඳ පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා දෙන ඉගැන්වීමකි. පස්වග මහණුන්ගෙන් ආරම්භ වූ මෙම අධ්‍යාපන ක්‍රමවේදය ඉන්දියාවේ විවිධ භික්ෂු ආරාමවල ව්‍යාප්ත වී දියුණු විය.**

ලක්දිව ආරාමික අධ්‍යාපනය ආරම්භ වූයේ දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයත් සමඟ ය. දෙවනපෑතිස් සමයේ දී විශාල පිරිසක් බුදුසමය වැළඳ බුදුසසුනේ පැවිදි වූහ.

මෙම පිරිස ධර්මදූතයන් වහන්සේ යටතේ පුළුල් ව බෞද්ධ දර්ශනය ද, භාෂා ද උගත්තෝ ය. මෙම ලාංකේය භික්ෂූන් වහන්සේ ශ්‍රී ලංකාවේ පළමු ආරාම ශිෂ්‍ය පරපුර ලෙස සැලකිය හැකි ය.

මේ සමඟ ම මහා විහාරය, චේතියගිරිය, ථූපාරාමය, ඉසුරුමුණිය, දඹකොළ වෙහෙර, තිස්සමහාරාමය වැනි ආරාම දිවයින පුරා ස්ථාපනය විණි. එකී සෑම ආරාමයක් ම ආගමික ස්ථානයක් මෙන් ම පාසලක් ද විය. මෙම ආයතන අතර මහා විහාරය ථෙරවාදීන්ගේ ප්‍රධාන ගුරුකුලය වූ අතර, පසු කාලයේ දී ලෝකයේ මහත් කීර්තියට පත් අධ්‍යාපනික මධ්‍යස්ථානයක් එනම් විශ්වවිද්‍යාලයක් ලෙස දියුණු වූයේ ය. ආරාම අධ්‍යාපනයෙහි සාර්ථක ගුරු-ගෝල සම්බන්ධතාවක් තිබූ බව පැහැදිලි වන අතර, ශිෂ්‍යයා දැනුමින් පමණක් නොව කුසලතා ආකල්පවලින් සන්නද්ධ කරවීමට මෙම අධ්‍යාපන ක්‍රමය බෙහෙවින් බලපෑවේ ය.

දැනුම ලබාදීම ආරාමික අධ්‍යාපනයේ මූලික අරමුණක් වේ. ග්‍රන්ථධූරී භික්ෂූන් වහන්සේලා ප්‍රධාන වශයෙන් ආරාමවල ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වූහ. පසු කාලයේ දී ආරාමික අධ්‍යාපන විෂයමාලාවට වෙනත් බොහෝ විෂයයන් ද ඇතුළත් වීමත් සමඟ ම බුද්ධවචනය ගැන පමණක් නොව භාෂා ශාස්ත්‍ර, දර්ශන හා ශිල්ප කර්මාන්ත පිළිබඳ දැනුම ලබාදීම ද ආරාමික අධ්‍යාපනයේ මූලික අරමුණක් විය.

ආකල්ප සංවර්ධනය හා සදාචාර සම්පන්න පුද්ගලයකු බිහි කිරීම ගුරුවරු තමන්ගේ ප්‍රධාන යුතුකම ලෙස සැලකීය. කුසලතා වර්ධනය ද ආරාමික අධ්‍යාපනයේ අරමුණකි. ආරාමයක ඉගෙන ගන්නා ශිෂ්‍යයකු විසින් හුරු පුරුදු විය යුතු ඇමදීම, ගෙත්තම් පන්නම් කිරීම, පිළිසකර කිරීම වැනි කටයුතු හා දිනපතා ඉටු කළ කුදු මහත් කාර්යයන් හේතුවෙන් ඔහුගේ අධ්‍යාපනය පොතට පමණක් සීමා නො වූ අතර, හසුරු කුසලතා ද වර්ධනය විය.

මුල සිටම ආරමවල ඉගැන්වූ වැදගත්ම ප්‍රධාන විෂයය වූයේ පර්යාප්තිය යි. අරාමවල අධ්‍යාපනය ලැබූ ගිහි පැවිදි සියල්ලෝ ම පර්යාප්තිය හදාළෝ ය. එකල අරාමවල බුද්ධධර්මය විෂයය කිහිපයකට බෙදා උගන්වන ලදී. දීඝනිකාය, මජ්ඣිමනිකාය, විනය, අභිධර්මය වැනි ත්‍රිපිටකයේ කොටස් ද ඉගැන්වූහ. ඉතිහාසය ආරාමවල උගන්වන ලද ඉතා ම ජනප්‍රිය විෂයය වූ අතර, ඊට අමතර ව කියවීම, ලිවීම, ගණිතය වැනි විෂයයන් ද උගන්වා තිබේ. වෛද්‍ය විද්‍යාව හා නක්ෂත්‍රය ද උගන්වා ඇති බවට සාධක ලැබේ.



පැරැණි ශ්‍රී ලංකාවේ ආරාමික අධ්‍යාපන ක්‍රමයෙහි ගුරුවරයකු වශයෙන් පිළිගත්තේ ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලූ අයකු පමණි. දැනුම, සදාචාර සම්පන්න බව හා වයසත් සමඟ ලබන පළපුරුද්ද ගුරුවරයකුගේ මූලික සුදුසුකම් ලෙස සැලකූහ.

ඒ අනුව ගුරුවරයකු විය හැකි වූයේ ව්‍යක්ත ප්‍රතිබල බහුශ්‍රැතයකුට පමණි. ආරාමවල ගුරුවරු උපජ්ඣාය හා ආචරිය යන නම්වලින් හඳුන්වා තිබේ.

ගුරුවරයා ශිෂ්‍යයාට උද්දේසයෙන් හා අනුශාසනාවෙන් සංග්‍රහ කළ යුතු විය. විශේෂයෙන් බෞද්ධ ආරාමවල ගුරුවරුන් ශිෂ්‍යයන්ට ධර්ම ශාස්ත්‍රය උගන්වන ලද්දේ කිසිදු ලාභ අපේක්ෂාවක් නොමැති ව නිස්සරණාධ්‍යාශයෙනි. එසේ ම ආරාමික ගුරුවරු හුදෙක් වැටුපක් සඳහා ඉගැන්වීම් නො කළත් පසු කාලයේ දී වැටුප් ලබා දීමේ ක්‍රමයක් සංවිධානය වී තිබූ බව හඳුනා ගත හැකි විය.

ආරාමික ගුරුවරුන් ඉගැන්වීම සඳහා ශිෂ්‍යයකු භාර ගැනීමේ දී ඔහුගේ අභියෝගතාව පිළිබඳ මූලිකව ම පරීක්ෂා කර බැලූහ. ඔහු සතුව එම දැනුම පැවතී නම් ආරාමික අධ්‍යාපනය සඳහා ඔහු තෝරා ගත්තේ ය. ආරාමික අධ්‍යාපන ක්‍රමය අනුව ගුරුවරයා ශිෂ්‍යයාගේ භාරකරු විය. ඉගෙනීමේ යෙදෙන අතර, ශිෂ්‍යයෝ ආරාමවල වෙනත් කුදු මහත් කටයුතුවල නිරත වූහ. අලුයම පිබිදීම, ආරාමය ඇමදීම, පිරිසුදු කිරීම හා ජලය සැපයීම, ගුරුවරයාට උවටැන් කිරීම ශිෂ්‍යයා විසින් කළ යුතු ය.

පන්ති පැවැත්වීම අද මෙන් එදා දැනුම ලබා දීමේ ප්‍රධාන මාර්ගය විය. ශිෂ්‍යයන් කිහිපදෙනකු සහභාගී වූ පන්ති මෙන් ම ශිෂ්‍යයන් සිය ගණනක් සහභාගි වූ පන්ති ද පවත්වා තිබේ. ශිෂ්‍යයා අධ්‍යාපනය ලබා දෙන කාල සීමාව තුළ ගුරුවරයා සමඟ නේවාසිකව වාසය කළේ ය. ආරාමික දින චර්යාව අනුව වෙනත් වැඩ කටයුතු සඳහා මෙන්ම ඉගෙනීම සඳහා ද කාලපරිච්ඡේද වෙන් කර තිබිණි. ශිෂ්‍යයන් දැනුම ලබාදුන් මාර්ග ලෙස ධර්ම දේශනා, සාකච්ඡා,

> **"බෞද්ධ ආරාමික අධ්‍යාපන ක්‍රමය මනුෂ්‍ය දුර්වලකම් පිළිගත් බව ද, ගුරුවරයා වැරැදි මඟකට යොමු වුවහොත් ශිෂ්‍යයන් ඥානාන්විත ව ක්‍රියා කොට ගුරුවරයා ආරක්ෂා කර ගත යුතු යැයි ද පිළිගෙන තිබිණි. එපමණක් නොව ගුරුවරයාගේ චරිතය විනය නීතිරීතිවලට අනුව හැඩගස්වා ගැනීමට ද ශිෂ්‍යයා සහය විය යුතු යැයි සැලකිණි."**

සම්මේලන, වාදවිවාද, චේතියචාරිකා දැක්විය හැකි ය. විනය අධ්‍යයනය කිරීම අනිවාර්ය වී තිබූ බව සමන්තපාසාදිකාව, විනය කර්ම, විනයවිභංග ආදී ග්‍රන්ථවල සඳහන් වේ. එකී මූලාශ්‍රය අධ්‍යයනය කිරීමෙන් ශිෂ්‍යයන්ගේ විනය පරිපූර්ණත්වයට පත් විය.

## පැරැණි බෞද්ධ ආරාමික අධ්‍යාපනයේ සුවිශේෂී ලක්ෂණ

ස්ත්‍රී පුරුෂ හෝ කුලභේදය, දුප්පත් පොහොසත් භේදය අධ්‍යාපනයට බාධා නො වීම නිසා සමානාත්මතාව පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක වීම.

වයස්ගත වීමෙන් පසුව ද ඇතැම් පුද්ගලයන් ආරාමවලට ඇතුළත් ව ඉගැන්වීම් කටයුතුවල නිරතවීම.

බුදුදහමෙන් ගුරුමුෂ්ටිය රැක ගැනීම අනුමත නො කළ හෙයින් ආරාම අධ්‍යාපන ක්‍රමයේ ද එකී ලක්ෂණය ගැබ් වී පැවතීම.

ශිෂ්‍ය ජීවිතය බ්‍රහ්මචාරී ව ගත කළ යුතු වූ අතර, පෞද්ගලික බැඳීම් ඇති කර ගෙන ඉගෙනීම අඩාල කර ගැනීමෙන් ශිෂ්‍යයා වළක්වා ගැනීම සඳහා ගුරුවරු උනන්දු වීම.

ශිෂ්‍යයා විසින් ගුරුවරයාට මඟ පෙන්වීම පැරැණි ආරාමික අධ්‍යාපන ක්‍රමයෙහි සිදු විය. බෞද්ධ ආරාමික අධ්‍යාපන ක්‍රමය මනුෂ්‍ය දුර්වලකම් පිළිගත් බව ද, ගුරුවරයා වැරැදි මඟකට යොමු වුවහොත් ශිෂ්‍යයන් ඥානාන්විත ව ක්‍රියා කොට ගුරුවරයා ආරක්ෂා කර ගත යුතු යැයි ද පිළිගෙන තිබිණි. එපමණක් නොව ගුරුවරයාගේ චරිතය විනය නීතිරීතිවලට අනුව හැඩගස්වා ගැනීමට ද ශිෂ්‍යයා සහය විය යුතු යැයි සැලකිණි.

පැරැණි ලංකාවේ ආරාමික අධ්‍යාපනික වශයෙන් වෙනත් රටවල අධ්‍යාපනික ආයතන සමඟ සබඳතා පැවැත් වූ බවට සාධක ලැබේ. විදේශිකයන් ශ්‍රී ලංකාවේ ආරාමවලට පැමිණ ඉගෙනීම හා ඉගැන්වීම කළ අතර, ලාංකිකයන් ද විදේශවලට ගොස් අධ්‍යාපනික කටයුතුවල නිරත වී තිබේ. මෙවැනි විදේශීය සබඳතා ශ්‍රී ලංකාවේ ආරාමික අධ්‍යාපනය දියුණු වීමට ද එහි යම් යම් වෙනස්කම් ඇති වීමට ද හේතුවිය. ගුරු-ගෝල සබඳතාව වර්ධනය කළා වූ ඵලදායීතාවකින් යුත් අධ්‍යාපන ක්‍රමයක් ලෙස ද මෙය හඳුනා ගත හැකි ය. එම නිසාවෙන් වර්තමාන ජන සමාජයෙන් තුරුන් ව යමින් තිබෙන්නා වූ පැරැණි ලංකාවේ ආරාම මුල් කොටගත් බෞද්ධ අධ්‍යාපනයේ සාධනීය ලක්ෂණයන් නූතන අධ්‍යාපන ක්‍රමයට උකහා ගැනීම වැදගත් වනු ඇත.

අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ
සහාය කථිකාචාර්ය
**කලුබෝවිටියන සෝරත හිමි**





බත්තරමුල්ල
සිරි සුදස්සනාරාම
සදහම් සෙනසුනෙහි
ප්‍රධාන අනුශාසක ආචාර්ය
**මිරිස්සේ**
**ධම්මික නා හිමි**

# අනුන්ගේ පව් තමන්ගේ කර නොගන්නට ධර්මයේ පිහිට

**දීඝ සසර ගමනේ දුර්ලභ අවස්ථාවක් වූ මනුෂ්‍ය ජීවිතය ලබා ඇත්තෙමු. තථාගත බුදුරජාණන් වහන්සේ විසින් චතුරාර්ය සත්‍ය අවබෝධය සමගින් ත්‍රිවිද්‍යා අවබෝධය ද ලැබූහ. එනම් පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය සහ ආසවක්ඛය ඥාණයයි.**

මෙහිදී භාග්‍යවතුන් වහන්සේ විසින් අවබෝධ කරනු ලැබුවේ කුමක්ද? තමන් වහන්සේ ඇතුලු සියලු සත්වයෝ ම ඔවුන්ගේ සසර ගමනෙහි වඩාත්ම උපත ලබා ඇත්තේ සතර අපායේ බව ය.

බඹ ලොවක, දෙව්ලොවක හෝ මනුෂ්‍ය ලෝකයේ ඉපිද යම් සැපක් ලබා ඇත්තේ නම් එය නරක , තිරිසන්, ප්‍රේත, අසුර නම් වූ සතර අපායේ ඉපිද විඳි දුකට අලගු තබන්නටවත් නොහැකි බව ය.

මහා නිරය, අවීචිය වැනි තැනෙක උපත ලැබුවේ නම් ඒකාන්තයෙන් ම කල්පයකට වඩා අපමණ වූ දුක් විඳිය යුතු වන්නේ ය. ඒ අනුව අඩුවෙන් ම උපත ලබා ඇත්තේ මනුෂ්‍ය ලෝකයේ ය. එක් මනුෂ්‍යයෙක් අම්මා වෙනුවෙන්, තාත්තා වෙනුවෙන්, දුව වෙනුවෙන්, පුතා වෙනුවෙන්, සොහොයුරා සොහොයුරිය වෙනුවෙන් වැගුරූ කඳුළු ද, ලෙඩ දුක් ඉදිරියේ ද අනෙකුත් ඥාති ව්‍යසනයේ දී, භෝග ව්‍යසනයේ දී වැගුරූ කඳුළු සිව් මහා සාගරයේ ජල කඳට වඩා වැඩි ය. සංයුත්ත නිකායේ අනමතග්ග සංයුත්තයට අනුව මේ බව පැහැදිලි වෙයි.

ඉපදෙමින්, මරණයට පත්වෙමින් සිදුවෙන්නා වූ භවගාමීත්වය සසර ලෙස සාමාන්‍ය ජනයා තේරුම් ගන්නේ ය. සසර නම් රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ නම් වූ ස්කන්ධ පඤ්චකයේ නොසන්සිඳී පැවැත්මයි. මේ අනුව සිදුවෙන්නාවූ කර්ම භවය සහ උත්පත්ති භවය සසරේ ලක්ෂණ ලෙස දැකිය හැකි වන්නේ ය.

මේ බව අනුක්‍රමයෙන් අවබෝධ කර ගනිමින්, දැනට ලබා ඇති මනුෂ්‍ය ජීවිතයේ දී මුහුණපාන්නට සිදුවන දුක්ඛ ස්වභාවයන් තේරුම් ගත යුතු වන්නේ ය. මේ ජීවිතයේ ද ජාති, ජරා, ව්‍යාධි, මරණ සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, පරිලාහ වශයෙන් කායික සහ මානසික දුක්ඛයන්ට මුහුණ දිය යුතු වන්නේ ය. මේ දුක්ඛ දෝමනස්ස ඉදිරියේ සියලු දෙනාම අසරණ වෙති.

ලැබූ මේ ජීවිතයට බුද්ධ ශ්‍රාවක ශ්‍රාවිකයන්ට උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය මුණගැසී ඇත්තේ ය. කළ යුතු වන්නේ කල්‍යාණ මිත්‍ර සම්පත්තියෙන් යුතුව,මජ්ඣිමා පටිපදා" නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමයි. හඬා වැළපීමෙන් ප්‍රයෝජනයක් නැත.

ප්‍රාණඝාත, සොරකම් ආදී ලෙසින් දුශ්චරිතයන්ට යොමු වීමෙන් සිදු වන්නේ, භවය සතර අපාය සහිතව දීර්ඝ වෙනවා මෙන් ම ජරා, ව්‍යාධි, මරණ ඉදිරියේ තවදුරටත් මේ ජීවිතයේ ම අසරණ වීමයි. අපට කළ හැකි වන්නේ කුමක්ද? බුද්ධ දේශනාවට අනුව, ලෝභ, දෝස මෝහ සංසිඳවීමේ මඟ නම් වූ කුසල් සම්පාදනය කළ යුතු ය. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීම නම් වූ බ්‍රහ්මචර්යාව අනුගමනය කළ යුතු ය. "එයට හේතුව නම් උපන්නාහට නොමැරී සිටීමට පුළුවන් කමක් නැත.

සම්මත පැවැත්මෙහි පස්පව් දස අකුසලයන්ගෙන් බැහැරව ඉගෙනීම, වෘත්තිය හෝ රැකියාව, ව්‍යාපාර, විවාහය, දූ දරුවන්, ගේ දොර, ධන ධාන්‍ය උපයා ගැනීම්, මව්පිය ස්වාමි භාර්යාව, දූදරු ,ඥාති හිතමිත්‍ර, ගම්වැසි, රටවැසි ආදි ලෙසින් කළ යුතු ක්‍රියාදාමයන් අනුගමනය කළ යුතු වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් "නතුම්හ සුත්‍ර" දේශනාවෙහි මතුකොට දැක්වූ දහම් කරුණක් පිළිබඳ විශේෂයෙන් ඔබගේ අවධානය යොමු කරමි. "මහණෙනි මේ කය නුඹලාට අයිති නැත. අන් අයකුට ද අයිති නැත. පුරාණ කර්මයන්ගේ ඵලයකි. පඨවි ආදී ධාතූන්ගෙන් සමන්විත වූවකි. චේතනාව මුල් වූවකි. විඳීමට වස්තු වූයේ ය. ඉගෙනීම, රැකියාව, විවාහය, දරුවන්, ගේදොර, ධනධාන්‍ය, තනතුරු ආදි ලෞකිකත්වය පිළිබඳ ව ඔබට දැන් වැටහෙන්නේ කුමක්ද? ජීවිතය, සතුට, ආදරය, සැප, විඳීම්, හමුවීම්, එක්ව වාසය කිරීම්, සම්මාන, තනතුරු ආදි ලෙසින් මේවා ලබමින් හෝ ලබන්නට අනේකවිධ වෙහෙස දරමින්, දුක්කම්කටොලුවලට මුහුණදෙමින් ගත කරන ජීවන පැවැත්ම, මොනතරම් තාවකාලික ද? කෙතරම් අස්ථිර ද? හේතු ප්‍රත්‍ය කරගෙන හටගන්නා වූ සවිඤ්ඤාණක, අවිඤ්ඤාණක සියලු දෙනාම, සියලු වස්තූන් ම, අනිච්ච, දුක්ඛ, අනන්ත නම් වූ ත්‍රිලක්ෂණයට යටත් ය. සෑම මොහොතක් පාසාම උප්පාද, ඨිති,භංග, ලෙසින් හටගෙන බිඳී නැතිව යන්නේ ය නම් වූ සත්‍යයයි. කෙතරම් "මම මගේ" කියා සිතුවත්, ප්‍රකාශ කළත් , ක්‍රියා කළත්, තමාවත් තමාට සැබෑ අයිතියක් නැති බව අවබෝධ කර ගත්තේ ද? දිරාගෙන යාම, ලෙඩදුක්, මරණය, අප්‍රියයන් සමඟ එකතු වන්නට සිදුවීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමති දෑ නොලැබීම හෝ කැමති පරිදි සිදු නොවීම, කෙටියෙන් පවසතොත් මේ ස්කන්ධ පඤ්චකය ම දුකක් බව තවමත් ටික ටිකවත් වටහා නොගත්තේ ද? මේ වටහා ගැනීම යනු, මේ ජීවිතය ලෞකික වශයෙනි. අකර්මණ්‍ය වීමක් හෝ ඔබ සිතන සතුට බැහැරවීමක් නොවේ.

ඔබගේ ජීවිතය හැබෑම සත්‍ය වූ චතුරාර්ය සත්‍ය ධර්මයට අනුගතව ධර්ම ප්‍රීතිය හෙවත් නිරාමිෂ සතුටට සමීප වෙයි. මේ සතුට ඇතුළත තරහව වෛරය, සැකය , බිය , මානය, හෝ තද ආශාවන් නැතිව යන්නේ ය.

ලෞකික දියුණුවට හේතුවන ඉගෙනීම, රැකියාව, ගේ දොර පටන් උපයා ගත්තත් එහි යථා ස්වභාවය තේරුම් ගැනීම එයට හේතුවයි. එනම් විනාශ නොවන කිසිවෙක් හෝ කිසිවක් හටගන්නේ හෝ උපදින්නේ නැත.

යමක් හටගන්නා සුළු ද ඒ හැම නැසෙන සුළුයි. ඒ බව අවබෝධ කර ගනිමින් සතර සතිපට්ඨානයේ උගන්වන සිහිය හෙවත් සති සම්පජඤ්ඤය පිහිටුවීම කෙරේ භාවිත බහුලීක බවක් ඇති කරගනී.

මහා සතිපට්ඨාන සුත්‍ර දේශනාවේ ආරම්භ යේ දී ම සඳහන් කරන ආකාරයට එළඹ සිටි සිහිය පවත්වාගත යුතු වන්නේ ය. මෙලොවත් අසරණ කරන, පරලොව දුගතියට ඇද දමන දැඩි ආශාව සහ තරහව මුල්කොටගත් කෙලෙස්වලින් සිත් පිරිසුදු කර ගැනීම පිණිසත් සෝක, හඬාවැලපීම්, සමනය කර ගැනීමටත් දුක්දොම්නස් බැහැර කර ගැනීමටත් ජීවිතය සම්මුති පැවැත්ම, සසර අවබෝධ කරන අනිච්ච ලක්ෂණ, දුක්ඛ ලක්ෂණ අනන්ත ලක්ෂණ පිරිසිඳ දැනීම පිණිසත්, සියලු තෘෂ්ණාව මුළුමනින් ම බැහැර කිරීම නම් වූ නිවන පිණිස හේතුවන බවයි පිහිට වන බවයි.

තමා තමාටත් හැබෑ අයිතියක් නොමැති මේ ජීවිතයෙහි තවත් අයෙක් කෙරේ අයිතියක් පවත්වන්නේ කෙසේද? එනම් නුඹලා මගේ "වස්තුව" යැයි පවසන දරුවන් කෙරේවත් හැබෑ අයිතියක් නැත. ආදරය , රැකවරණය. ආහාරපාන, නිවාස, ඇඳුම් පැළඳුම් බෙහෙත්හේත් ආදි ලෙසින් ඔවුනොවුන්ට උපකාර වුවත් ජරා, ව්‍යාධි, මරණ ඉදිරියේ උපන් සියලු සත්වයෝ ම අසරණ ය. මේ බව ධර්මයෙන් අවබෝධ කර ගන්නට උත්සාහ නොගන්නා වූ හෝ තේරුම් නොගන්නාවූ පුද්ගලයෙක් ජීවත් වෙන්නට යැයි කියමින් මෙලොව දී ම දුක් දෙන පරලොව අකුසල කරමින් හැසිරෙති. හැකිතාක් දුරට නිති පන්සිල් රකිමින් කුසල් මඟ ගමන් කරන්නාට ධර්මයේ පිහිට ඇත. පස්පවින් සොයා ගත් දෑ හින්දරක් සේ තමා වෙතට විපාක ලෙස එනවාට වඩා දැහැමින් සොයා ගත් දේ ස්වල්පයක් වුව ද දිව්‍ය ආහාරයකි. සැනසිල්ලකි. සත්පුරුෂයෝ සමීප වෙති. උපකාර කරති. සම්‍යක් දෘෂ්ඨික දෙවියන්ගේ ද පිහිට ලැබේවි. පරලාව සුගතිය උරුම වෙයි.







# පොසොන් පොහෝ දින අරුත වටහා ගනිමු

**සංස්කෘතිය හා සදාචාරය පිරිහුණු තැනක භෞතික සංවර්ධනයට ද පැවැත්මක් නැත. භෞතික දේ සතුටින් අත්විඳිය හැක්කේ ද සමාජයේ ඇති හර පද්ධතියේ පැවැත්ම මත ය. සිරිත් විරිත්, නැතිවිට අප විඳින්නේ සංතාපය යි. ලබන්නේ පරිහාණිය යි.**

මහින්දාගමනයෙන් ලද දැනුමෙන් හා ශික්ෂණයෙන් අප ලැබුවේ සන්තෘෂ්ඨියෙන් යුතු සමාජයක පැවැත්ම ය. එනිසාම අතීත චාරිත්‍ර වාරිත්‍ර විමසා බලන්නට මෙවර පොසොන් සමය සුදුසුම අවස්ථාවකි.

මහින්දාගමනයට පෙර ලෝකධර්මතාව මත හෝ සදාචාරය මත අපේ සමාජයට ගුණ ධර්මපිළිබඳ අවබෝධයක් තිබුණත්, වඩා විධිමත් සමාජ සැකැස්මක් ගොඩනැඟෙන්නේ බුදු සමය මෙරට ස්ථාපිත වීමත් සමඟ ය.

රාජකීයයන් බුද්ධාගම වැළඳගැනීමත්, බුදු දහම රට පුරා ව්‍යාප්තවීමත් සමඟ මෙරට සමාජය භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස බවට පත්වීමෙන් පසු පන්සිල්, දසසිල් ආදී වශයෙන් ගුණධර්ම පුරුදුවීමත්, බුද්ධ දේශනාවල පෙන්වාදෙන යුතුකම් වගකීම් ආදිය වටහා ගැනීමත් නිසා ලාංකීය සමාජයේ නව සිරිත් විරිත් පද්ධතියක් ගොඩ නැඟිණි.

සිඟාලෝවද සූත්‍රයෙන් පෙන්වා දෙන්නේ අන්‍යොන්‍ය ගරුත්වය, ගෘහ ආර්ථිකය මනාව සංවිධානය කර ගැනීම ආදී දර්ශනයන් ය. සදිසා නමින් සමාජය කොටස් හයකට බෙදා දැක්වෙන ඒ ඒ සමාජ කාණ්ඩායම් අතර අන්‍යොන්‍ය ව පැවැතිය යුතු සාරධර්ම පැහැදිලි කර ඇත.

නැගෙනහිර දිසාව-මවුපියන්, දකුණු දිසාව-ගුරුවරුන්, බටහිර දිසාව- පුත්‍ර දාරාවන්,උතුරු දිසාව-හිත මිතුරන්, යට දිසාව-සේවක සේවිකාවන්, උඩදිසාව පැවිදි උතුමන් වශයෙන් වන්දනාව සඳහා යොදාගන්නා ලෙස කර ඇති දෙසුම්වලින් සමාජයට දෙන පණිවුඩය සමාජයේ සහජීවනයටය. අන්‍යයන්ගේ අයිතියට ගරු කිරීම ය. යුතුකම් ඉටුකිරීම ය. ඒ ඒ සමාජ කොටස් අතර විශ්වාසය රැකගැනීමය.

පරාභව සූත්‍රයෙන් පුද්ගලයා පිරිහෙන කරුණු අර්ථවත් කර අති අතර නොකළ යුතු දේ අර්ථවත් කෙරේ.

**"ඉත්ථිධුත්තෝ සුරාධුත්තෝ
අක්ඛධුත්තෝ ච යෝ නරෝ
ලද්ධං ලද්ධං විනාසේති තං
පරාභවතෝ මුඛං"**

ස්ත්‍රීන්ට, මත්වතුරට මෙන්ම සූදුවට ලොල් වීම විනාශ මුඛයකි ආදී වශයෙන් පුද්ගලයා විනාශ වන කරුණු රාශියක් පරාභව සූත්‍රයෙන් කියා ඇත. ධම්මපදය, සූත්‍ර දේශනා, බුද්ධ චරිතය, ජාතක කථා සහ බුද්ධ දේශනා ආදිය පුරාම පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය අවවාද අනුශාසනා, උපදේශ, උදාහරණ සහ ආදර්ශ පවතී.



අනුරාධපුර ලංකාරාමාධිකාරි
උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන
අධිකරණ සංඝනායක
**රැළපනාවේ
ධම්මජෝති හිමි**

අතීත සමාජය මේ දහම් මඟ ඔස්සේ චාරිත්‍රවාරිත්‍ර ගොඩනඟාගෙන තිබුණි. එම චාරිත්‍ර වාරිත්‍ර පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා ද, රජුගේ සිට යාචකයා දක්වා ද බැඳුණු සිරිත් විරිත් විය. අතීත සමාජය මෙන්ම එම සමාජයේ සාමාජිකයා ද සුරක්ෂිත වූයේ මේ ධර්මතාවලට ගරු කිරීම නිසා ය.

පුද්ගලයා තුළ ඇති සාරධර්ම පිරිහීම මූලිකව ම හඳුනාගත හැක්කේ ප්‍රතිපත්ති ගරුක නොවීම ලෙස ය. පන්සිල් නොරැකීම හා රටේ නීතියට ගරු නොකිරීමත්, සදාචාරයට පටහැනිව වැඩකිරීමත් ඒ තුළ දැකිය හැක.

පවුල තුළ මවගේ යුතුකම්, පියාගේ යුතුකම්, දරුවන්ගේ යුතුකම්, වැඩහිටියන්ට සැලකීම, එකිනෙකාට ආදර්ශවත්වීම හා එකමුතුකම කොතරම් දුරට පවතී ද යන්න අප විමසා බැලිය යුතු වේ.

මහ රෑ වන තුරු රූපවාහිනී නරඹා නින්දට වැටීමෙන් උදේට පාසල් යන දරුවාට ගෙනයාමට ආහාර පිළියෙල කිරීම මඟහැරෙන මව්වරුන් අප සමාජයේ කොතෙකුත් සිටී. දියණියන් ඉක්මවා අසංවර විලාසිතාවන් වැළඳගත් මව්වරු සිටිති.

යම් වෘත්තියක් තුළ නියැළෙන පුද්ගලයා ඔහුට හිමි වරප්‍රසාද අත්පත් කර ගැනීමට වැර දරුවත් ඔහුගේ යුතුකම් හා වගකීම් කොටස නිසි ලෙස ඉටුකරන්නේ ද? වෛද්‍ය, ගුරු, ඉංජිනේරු, පරිපාලන ආදී ඕනෑම වෘත්තියක් තුළ එම වෘත්තීය භාවය හෝ ආචාරධාර්මික භාවය පවතී ද? මුදල්, අල්ලස හෝ අයථා ඉපයීම් මුල්කරගෙන බලය යොදවන ආකාරය පැහැදිලි වේ.

වැඩි දෙනා කටයුතු කරන්නේ පරිසරය,පොදු දේපළ, සතාසිව්පාවා ගැන හෝ තැකීමෙන් නොවේ. ජල ගැලීම්, වන අලි තර්ජන, වස විෂ භූගතවීමෙන් ඇතිවන ජල දූෂණය, සංඥ කුලුනු හේතුවෙන් අතිවන කම්පන තරංග බලපෑම,වන විනාශය, වායු දූෂණය, සාගර දූෂණය ආදී දහසකුත් විනාශයන් මිහිපිට සිදුවෙමින් පවතී. ඒ සියල්ල සාරධර්ම නොතකා සංවර්ධනය මුවාවෙන් කරන ව්‍යාපාරයන් ය.

ඇතැමුන් ආගම දහම නොසලකා හරී. නැතහොත් වැරැදියට අර්ථ දැක්වීමත්, පහත් කොට සැලකීමත් පෙනේ. උදාහරණයක් ලෙස යමෙක් දරුවා දහම් පාසලට නොයවන්නේ ආගම දහම කෙරේ ඇති භක්තිය හා එහි වටිනාකම නොතැකීම නිසා ය. එවිට නිර්මාණය වන දරුවා දැනුම පමණක් ඇති ආකල්ප හා භක්තිය නොමැති අයෙක් බවට පත්වේ. රටේ සම්ප්‍රදාය මතු පරපුරට සම්ප්‍රේෂණය වීම වළකී. දිනෙන් දින බිහිසුණු සමාජයක් වෙත මඟ පෑදෙයි. අසංවර නොහික්මුණු පුරවැසියන් බිහිවේ.

සදාචාරයට සිදුකරන හානිකිරීම් බරපතළ සමාජ ව්‍යසනයන් ය. පවතින චාරිත්‍ර වාරිත්‍ර ඉටු නොකිරීමත්, විකෘති කිරීමත් දෙකම අනාගතයට ගෙන දෙන්නේ භයානක ප්‍රතිඵලය. අලුත් අවුරුදු චාරිත්‍ර ඉටු නොකරන විට තම ජාතියේ අනන්‍යතා නොදන්නා දරු පිරිසක් අනාගතයට උරුම වේ. දෙමාපියන් නමදින්නේ නැති, වැඩහිටියන්ගේ බසට අකීකරු, හිතුවක්කාර හා වැඩහිටියන්ට සලකන්නේ නැති දරුවන් නිර්මාණය වන්නේ එවිට ය. පෝය දිනයේ ආගම දහම තුළ නොහැසිරීම, අසම්මත විවාහ, අනියම් ලිංගික සබඳතා, පූජ්‍ය පක්ෂය හෙළා දකින ප්‍රකාශ, අසභ්‍ය කලා කෘති තැනීම හා නැරඹීම, පොදු වැඩ මැඟහැරීම, පින් පව් විශ්වාස නොකිරීම, මිථ්‍යාව ප්‍රකට කිරීම සහ අන් අය වෙනුවෙන් වැරැදි තීන්දු ගැනීම සදාචාරයට කරන හානි බව අප දැනසිටීම වටී.

සාදාචාරය එලෙස පිරිහෙන විට අනාථ නිවාස, බන්ධනාගාර, පොලිස් පැමිණිලි, නඩු හබ, හදිසි අනතුරු, එකිනෙකා අතර ගැටුම් වේගයෙන් ඉහළ යනු ඇත. අවසානයේ බිහිවන්නේ මානසිකත්වය බිඳුණු, ඉච්ඡාභංගත්වයට පත් හා රෝගාතුර මිනිස් සමාජයකි.

බුදු දහම හා මිහිඳු සංස්කෘතිය අපට අර්ථවත්කර ඇත්තේ සරල බව ය. එමෙන්ම අන්‍යොන්‍ය ගරුත්වය, සහජීවනය, අනෙකාට ඇති අයිතිය, මානව හිමිකම්, සමගිය, එකමුතුකම, විනය හා නීතිගරුකභාවය ආදියයි. මේ බෞද්ධ සිරිත් විරිත් පුනර්ජීවනය සඳහා පොසොන් පොහොයේ අරුත වටහා ගැනීම අවශ්‍යම දෙයකි.



> **පුද්ගලයා තුළ ඇති සාරධර්ම පිරිහීම මූලිකව ම හඳුනාගත හැක්කේ ප්‍රතිපත්ති ගරුක නොවීම ලෙස ය. පන්සිල් නොරැකීම හා රටේ නීතියට ගරු නොකිරීමත්, සදාචාරයට පටහැනිව වැඩකිරීමත් ඒ තුළ දැකිය හැක.**

# පෙරදිග රටක් හැටියට ආගමික පසුබිම ශක්තිමත් කරන්න අවශ්‍යයි



**උදාර පැවිදි දිවියක පියසටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ මහාචාර්ය ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ බස්නාහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක මොරටුව ලුනාව බෝධිරාජාරාමාධිපති**

**අගලකඩ සිරිසුමන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**

**අපේ හාමුදුරුවනේ, ආගමික හා අධ්‍යාපනික පමණක් නොව, ජාතික වශයෙනුත් අගයෙන් අගය කළ යුතු සේවාවක නිරතවන බහුශ්‍රැත ධර්මානුධර්ම ප්‍රතිපන්න සංඝ නේතෘන්වහන්සේ නමක් වශයෙන් ප්‍රකට ගෞරවනීය මහාචාර්ය අගලකඩ සිරිසුමන නායක හාමුදුරුවන් වහන්සේ බාල කාලයේ පටන් මෙතෙක් පැමිණි ගමන් මඟ පිළිබඳ යම් පැහැදිලි කිරීමක් කරනවා නම්,**

වැලිවිට ශ්‍රී සරණංකර සංඝ රාජයාණන් වහන්සේ වෙතින් උපසම්පදාව ලැබූ අගලකඩ ධම්මරක්ෂිත ස්වාමීන් වහන්සේ පහත රටට වැඩම කරමින් අගලකඩ පුරාණ විහාරස්ථානය ස්ථාපනය කර තිබෙනවා. අගලකඩ සඟ පරපුර උන්වහන්සේගෙන් ආරම්භ වුණ සඟ පරපුරක් වගේම වැලිගම අග්‍රබෝධිරාජ විහාරය, ගොඩපිටිය ජේතවන රාජ මහා විහාරය වැනි ආයතන ස්ථාපනය කිරීමේ ගෞරවය ද උන්වහන්සේට හිමිවෙනවා. උන්වහන්සේ නිසා කීර්තිමත් වුණ ගමක ජන්මලාභය ලබන්නට මට භාග්‍ය ලැබුණා. එය මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස නගරයට නොදුරුව පිහිටි ඉතාම සුන්දර සශ්‍රීක වූ ගැමි පරිසරයකට ආවේණික වූ අංගෝපාංගයන්ගෙන් සමන්විත වුණ ගමක්.

පෝරතොට කනිෂ්ඨ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබාගෙන මාතර තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයෙන් සාමාන්‍ය පෙළ විභාගය දක්වා අධ්‍යාපනය ලැබීමෙන් පසුව තමයි මම පැවිදි ජීවිතයට ප්‍රවේශය ලබන්නේ. ඒ පැවිදි ජීවිතයට ප්‍රවේශය ලබා ගන්න විශේෂයෙන් බලපෑමක් ඇති කළේ ගමේ විහාරස්ථානය. අපි නිවසින් පිටතට පැමිණෙන විට ගමේ විහාරස්ථානයේ සුදෝසුදු පැහැයෙන් බබළන චෛත්‍යරාජයාණන් වහන්සේ දකින විට සිත උතුරා යන ශ්‍රද්ධාවක් දියුණු වුණා. ගමේ පන්සල ආශ්‍රයෙන් හැදුණ වැඩුණ නිසා ආගමේ බලපෑම දැඩිසේ ජීවිතය හා බද්ධවීමේ ප්‍රතිඵලයත්, වාසනා ගුණයත්, මා පුරණ ලද පාරමීදම් බලයත් නිසා මේ වාසනාවන්ත ප්‍රව්‍රජ්‍යා ජීවිතයට ප්‍රවේශවීමේ භාග්‍ය ලැබුණා.

මම පැවිදි බව ලබන්නේ මොරවක් කෝරළ යේ ඓතිහාසික රුවන්කන්ද රාජමහා විහාරයේදී. මගේ ආචාර්ය පාදෝත්තමයාණන් වහන්සේ වුණ අතිපූජනීය දෙහිගස්පේ සුමනසාර නායක හාමුදුරුවන් වහන්සේ බොහොම ගෞරවයෙන් පුණ්‍යානුමෝදනා පූර්වකව කෘතවේදීව මේ අවස්ථාවේ දී සිහිපත් කරනු ලබනවා. උන්වහන්සේගේ අනුදැනුම, මඟපෙන්වීම, අවවාද අනුශාසනා හා පූර්වාදර්ශ නිසා ශිෂ්‍ය ජීවිතයත්, භික්ෂු ජීවිතයත් අද දක්වාම පූජනීයත්වයෙන් සුරක්ෂිත වුණා.

ඒ වගේම එවකට කීර්තිමත් විද්‍යායතනයක් වුණ බද්දේගම ශ්‍රී ඉන්දසර පිරිවෙනින් ඉතා හොඳින් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලැබුවා. විශ්ව විද්‍යාල මහා ඇදුරන්ටත් වඩා භාෂා ඥාණයන්ගෙන් පරිපූර්ණ ගුරු පරපුරක් වූ නිසාම ඔවුන්ගේ ඇසුර හරිම ආශ්වාදනීයයි. ඔවුන්ගේ දැනුම හරිම නවීන වුණා. එවැනි සම්භාව්‍ය වියත් ඇදුරු මඬුල්ලක් වෙතින් ලැබූ දැනුමත් සමඟ මම කොළඹ සරසවියට ඇතුළත් වුණා. මගේ විෂයයට, දැනුමට, හොඳම තෝතැන්නක් වුණ එම සරසවියේ සිටි කීර්තිධර මහ ඇදුරු පරපුරකින් ශිල්ප ඥානය ලබන්න වාසනාවන්ත වුණා. ප්‍රථම පන්ති සාමාර්ථයක් ලබාගෙන එහිම ආචාර්යවරයකු වෙලා අවසානයේ මහාචාර්යවරයකු වගේම සිංහල අංශයේ අංශ ප්‍රධාන බවට පත්වෙන්නට මට පුළුවන්කම ලැබුණා.




**විචිත්‍ර ධර්ම දේශකයාණන් වහන්සේ නමක් වශයෙන් ජනාදරයට පත් අපේ හාමුදුරුවෝ ව්‍යක්ත ලේඛයකු මෙන්ම ගත් කතුවරයකු වශයෙන් ශාස්ත්‍රීය ලෝකයට ප්‍රදානය කළ සම්භාව්‍ය ග්‍රන්ථ පිළිබඳ හැඳින්වීමක් කරන්න හාමුදුරුවනේ,**

බුද්ධ පුත්‍රයකු හැටියට භික්ෂුවකට පැවරෙන අනිවාර්ය වගකීම බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඊළඟ පරම්පරාව වෙත කියාදීම, ගමේ පන්සලේ හාමුදුරුවො පමණක් නොවෙයි සෑම හාමුදුරුනමක් ම බණ කියන්න ඕනේ. ලංකාවේ විශ්ව විද්‍යාල ආචාර්ය භික්ෂූන් වහන්සේ බොහෝ පිරිසක් වැඩ සිටියත් ධර්ම දේශනා කරන භික්ෂූන් වහන්සේලා හරිම අඩුයි. මට දුප්පත් පුංචි පැල්පතකින් ආරාධනාවක් ලැබුණත්, රජ මැදුරක ආරාධනාවක් ලැබුණත් ධර්මය දේශනා කරනවා. ලෝකයේ කොතැනක සිටියත් බුද්ධ පුත්‍රයකුගේ කාර්යභාරයෙහි අපි නිරත නොවුණහොත්, එම කාර්යය ඉෂ්ට කරන්නේ කවුද? එනිසා භික්ෂුවගේ කාර්ය හැටියට මම අරලියගහ මැදුරේ සිට පුංචි පැල්පත දක්වාම දහම් දෙසීමේ කාර්යයෙහි නියැළෙමින් සිටිනවා. බොහොම නිහතමානීව සත්කාර පිරිකර අපේක්ෂාවෙන් තොරව ඇතැම්විට ගමන් ගාස්තු පවා ලබා නොගෙන, නිස්සරණාධ්‍යාශයෙන් බුද්ධ පුත්‍රයකුගේ කාර්යභාරය ඉටුකරනවා.

ඒ වගේම අපේ රටේ සාහිත්‍ය , කලාව පෝෂණය කළේ විශ්වවිද්‍යාල ඇදුරන් අද විශ්ව විද්‍යාල ඇදුරන් පොත් ලියන ප්‍රමාණය බොහොම අඩුයි. විශ්ව විද්‍යාල ආචාර්යවරයා තමයි සමාජයට මඟ පෙන්වන්නේ. ඔහු තමයි සමාජයේ මතය හදන්නේ. මම පුවත්පත්වලට, සඟරාවලට අප්‍රමාණ ව ලිපි ලියනවා.

මා විසින් දේශනා කළ අපේ රහතන් වහන්සේගේ චරිත කතා දේශනා මාලා "නුවණ පුබුදන දහම් අරුණලු' යනුවෙන් කෘතියක් වශයෙන් රචනා කළා. බුදුසරණ පුවත්පතට ලියන ලද ලිපිමාලාව" බුදු දහමින් පෝෂිත සිංහල සාහිත්‍ය" වශයෙන් වටිනා ග්‍රන්ථ බවට පත්වෙලා තිබෙනවා. තෝරාගත් ජාතක කතා 50ක් අපූර්වට විවරණය කරමින් 'බෝසත් කතා පෙළ නැවත කියවමු' යනුවෙන් රචනා කළ ග්‍රන්ථයත්, සම්භාව්‍ය සාහිත්‍යයේ රසමුසුතැන් විචාරයට ලක්කරමින් රචනා කළ "විමසුම්ධාරා ග්‍රන්ථත්, අමාවතුර ග්‍රන්ථය පාඨකයාට පහසුවෙන් කියවා රසවිඳිය හැකි අයුරින් "අමාවතුර ගැටපද අකරාදිය ග්‍රන්ථයත්, ගුත්තිල කාව්‍ය අලුත් සංස්කරණයත්, ගුරුවරයකු නැතිව තනිව රසවිඳිය හැකි හංස සන්දේශ සංස්කරණයත්, පාඨක ලෝකයා වෙත දායාද කර තිබෙනවා. එයට අමතරව සම සංස්කරණත් විශාල ප්‍රමාණයක් තිබෙනවා.


**සමාජය පිළිබඳ ප්‍රබුද්ධ ලෙස ක්‍රියාශීලී ඔබ වහන්සේ නූතන සමාජයේ මතුවී ඇති ගැටලුවලට විසඳුම් සෙවීමෙහිලා ධර්මානුකූල යම් ප්‍රවේශයක් පැහැදිලි කරමින් අපේ සාකච්ඡාව අවසන් කරමු නායක හාමුදුරුවනේ.**

අපි පුංචි කාලේ අපේ ගෙවල් දොරවල්වල බොහොම සුන්දර ආගමික බෞද්ධ සංස්කෘතික වටපිටාවක් ගොඩනඟාගෙන තිබුණා. අපේ අම්මල තමයි එම සංස්කෘතික පරිසරය දරුවන්ට ප්‍රවාහය කළේ. අපි අනිවාර්යයෙන බුදුන් වඳින්න ඕනෙ. මල් කඩන්න ඕනේ. හැන්දෑවට ඔක්කොම එකට එකතු වෙලා පැය භාගයක් බුදුන් වැන්දාට පසුව රාත්‍රී ආහාර ගන්නා තෙක් පොතක් හෝ පත්තරයක් අතට ගත්තා. අපට රූපවාහිනී,ගුවන්විදුලි තිබුණේ නැහැ. හැත්තෑව දශකයෙන් පසුව ඇතිවුණ සමාජ පෙරළිය සමාජය උඩුයටිකුරු වුණා. රූපවාහිනිය, දුරකතනය, පරිගනකය, ගුවන්විදුලිය, ජනජීවිතයට විශාල ලෙස බලපෑම් කරන්න වීමෙන් ගෙදර තිබුණ සංස්කෘතික වටපිටාව සම්පූර්ණයෙන් බිඳ වැටුණා.

මේ සමාජය භෞතික වශයෙන් ඉහළ දියුණුවක් ඇතිවෙලා තිබුණත්, ආධ්‍යාත්මික ශික්ෂණය කාරණා රාශියකින් බිඳවැටිල තිබෙනවා. එක දරුවෙක් බණ ගෙදරකට දාන ගෙදරකට ගෙන එන්නෙ නැහැ. ඔවුන්ට එම සංස්කෘතිය දායාද කරන්න අම්මල තාත්තල හැසිරෙන්නේ නැහැ. සමහර පාසල්වල ගුරුවරු එම ආගමික පරිසරය දරුවන්ට ගොඩ නඟාදෙන්න බොහෝ වෙහෙසුණත්, ගෙදර වටපිටාව තුළ ඒ සඳහා පෙළඹවීමේ තිබෙන මදකම නිසා ආගමෙන් ගොඩනැඟෙන ආධ්‍යාත්මික සුවතාවත්, රසවින්දනයත් බැහැරවීම තුළ යන්ත්‍ර වගේ අසංවේදී මිනිසුන් නිර්මාණය වෙලා තිබෙනවා. බොහෝ සංවේදී ගුණවත් දරුවන් සමාජය තුළ සිටියත්, පොදුවේ සමාජයට අත්වෙලා තිබෙන විනාශය මෙයයි. පෙරදිග රටක් හැටියට අපි ආගමික පසුබිම ශක්තිමත් කරන්න අවශ්‍යයි. එසේ නොවුණහොත් ගොඩනැඟෙන්නේ පෞරුෂය දීනවුණ මිනිස්සු බුද්ධිය තිබුණත්. හදවතක් නැහැ. එනිසා එම ප්‍රවේශය මෙම ප්‍රතිසංස්කරණ තුළ නොගතහොත් අපේ ජාතියටත්, රටටවත් අනාගත යක් නැහැ.

හේමමාලා රන්දුනු





දුටුගැමුණු මහ රජතුමා

67 කොටස

# අපේ උරුමය රැකගැනීමේ සටන ආරම්භ කරමු

**"යුද්ධයට ඇති සූදනම මදි. ඒ නිසා ඒ සඳහා අවසර දෙන්නට බැහැ". පිය රජතුමා කීවාම ගැමුණු කුමාරයා කිපුණා. ඇත්තටම මමත් කලකිරුණා. නමුත් රජතුමා නිවැරැදි බව දැන් අපට වැටහෙනවා.**

රජතුමා මියගිය බව දැනගත් අවස්ථාවේ මට මහත් වේදනාවක් ඇති වුණා. එයින් මිදෙන්නට නම් මාගමින් දුරස්වී සිටීම අවශ්‍ය බව පෙනුණා. දුටුගැමුණු රජතුමා මළගමට නොපැමිණීම ලොකු වරදක්. එයින් තිස්ස අයුතු ප්‍රයෝජන ගන්නට සූදානමින් සිටින බවත් මට හැඟී ගියා. දීඝාභය, තිස්ස දෙදෙනා අතර සුහදතාවක් ඇති වීම වැළැක්වීමට නම් මා සිටිය යුත්තේ දිගාමඩුල්ලේ බව මට අවබෝධ වුණා. ගැමුණුට නිදහසේ මාගමට එන්නට ඉඩ තබා මා දිගාමඩුල්ලට ගියා.

"දැන් ඒ සියල්ල අවසන්. අපේ ප්‍රධාන අරමුණට යොමු වෙමු. අපි අපේ උරුමය ලබා ගැනීමේත්, බුද්ධශාසනය රැක ගැනීමේත් සටන ආරම්භ කරමු."

බිසොවුන් වහන්සේගේ කතාවට සවන්දී සිටි පිරිස සිය අසුන්වලින් නැඟී එතුමියට ආචාර කර සිය ප්‍රසාදය පළ කළහ.

ත්‍රිසිංහලය එක්සේසත් කිරීමේ, බුද්ධ ශාසනය ආරක්ෂා කිරීමේ උදාර අරමුණු සඳහා යුද්ධයට මාගම රාජ්‍යයේ සියලු බල හමුදා සූදානම් ව සිටිතියි ප්‍රකාශ කරමින් නන්දිමිත්‍ර මහ සෙන්පති ඒ පිළිබඳ ප්‍රතිඥා පත්‍රය දුටුගැමුණු මහ රජතුමාට පිළිගැන්වී ය.

යුද්ධය සඳහා ඇසළ මස පුර පෑළවිය දින සුදුසු යැයි කියමින් කාම්බෝජ මහ පඬිතුමා ඒ පිළිබඳ නැකැත් පත්‍රය විහාරමහා දේවිය වෙත පිළිගැන්වී ය.

යුද්ධය සඳහා මාගම සිට විජිතපුර දක්වාත් එහිදී විජිතපුර බලකොටුව ජය ගෙන එතැන් සිට ගිරිල, මහෙල බලකොටු, බිඳිමින් අනුරාධපුරය දක්වාත් යායුතු ගමන් මඟ නියමිත සැලසුම් සහිතව නන්දිමිත්‍ර මහ සෙනවි විසින් ත්‍රිපිටක තිස්ස මහතෙරුන් වහන්සේට පිළිගැන්වනු ලැබීය.

ජයශ්‍රී !,ජය ශ්‍රී ! කියමින් සභාවේ සිටි සියලු දෙනා සිය අසුන්වලින් නැඟී සිටියහ.

"මහ රජතුමනි, දැන් අපට යෑමට අවසර දෙන්න. අපි විහාර මහා දේවිය කී සියල්ල අනුමත කරමු. මේ යුද සැලැස්මට මහ බිසොවුන් වහන්සේගේ ද අනුමැතිය ලැබුණු පසු මහ සෙනෙවිවරුන්ගේ අතට පත් කළ යුතුයි. සිරිනාග මහ සෙනෙවි අපෙන් වෙන් වී යන්නට ප්‍රථම මෙහි කසාතොට සිට අනුරපුර දක්වා ඇති ගමන්මග ගැන තවදුරටත් උපදෙස් දෙන්නේ නම් අපේ මහසෙනෙවිවරුන්ට වැදගත් වේවි.

ගැමුණු රජතුමා ඇතුළු රජ පවුලේ සියලු දෙනාගේ විශේෂ ආරක්ෂාව දාව ආචාර්යතුමාගේ උපදෙස් සහිතව මහ සෙනෙවි කෙනකු හා එම සේනාංකය වෙත පැවරිය යුතුයි. දාව ආචාර්යතුමාගේ ආරක්ෂක සෙනෙවිවරුන්, ඒ අසලින්ම ගමන් කිරීම අපේ කලින් සැලසුම්වලට ඇතුළත් ව ඇති. පෙරමුණේම ගමන් කරන්නේ පන්සියයක් භික්ෂූන් වහන්සේලා. උන්වහන්සේලාගේ දානමාන වෙනුවෙන් කිසිවකු මෙහෙය විය යුතු නැහැ. ඒ සියල්ල උන්වහන්සේලා විසින්ම සපයා ගන්නවා ඇති."

"මේ යුද්ධයේ ජයග්‍රහණය ගැන කිසිම සැකයක් නැහැ. නමුත් ගමන බලාපොරොත්තු වන තරම් වේගවත් නැහැ. එය කිසිවකුගේ උදාසීනත්වයට හේතු විය යුතු නැහැ. මෙය තවත් රටක් අල්ලා ගැනීමේ යුද්ධයක් නොවෙයි. බුද්ධ ශාසනය රැක ගැනීමේ, ජාතියේ අයිතිය තහවුරු කිරීමේ ව්‍යාපාරයක්. සංස්කෘතික විප්ලවයක ස්වරූපයක් දෙමින්, ආගමික කටයුතුවලට මුල්තැන දෙමින් ගමනේ යෙදෙන විට ජනතා සහාය නොමදව ලැබේවි. මහියංගනයේ දී මේ අතින් අපට විශාල වැඩ කොටසක් කරන්නට සිදුවේවි."

එසේය, ස්වාමීන් වහන්ස, මගේ සිත් ගත් ගමන් සැලැස්මත් ඒකයි. මහියංගන බලකොටුව ජයගෙන එහි වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීමට මාස කිහිපයක් නතරව සිටිමින්, එහිදී සංවිධාන ශක්තිය වඩාත් පුළුල් කර ගන්නට අවස්ථාව සැලසේවි."

බලකොටුවෙන් බලකොටුව, කඳවුරෙන් කඳවුර ජයගෙන නැවත නැවත සේනා ශක්තිය දියුණු කර ගනිමින් ඉදිරියට යාම කාගේත් ප්‍රබෝධයට හේතු වේවි.

ත්‍රිපිටකතිස්ස මහතෙරුන් වහන්සේ, මහාසිව මහා ස්වාමීන් වහන්සේත් කාගේත් වැඳුම් ලබමින් සභා ශාලාවෙන් පිටත්ව ගියහ. දුටුගැමුණු මහ රජතුමා මහසෙනෙවිවරුන් ඇමතීය.

"අපේ නිරීක්ෂණය අනුව අපට කඳවුරු තිස් දෙකක් ප්‍රබල ජන ප්‍රධානීන් නොහොත් සේනාධිපතිවරුන් තිස් දෙනකු ජය ගන්නට සිදු වේවි. පහසුවෙන් හෝ අපහසුවෙන් ඉදිරියට යමින් අවශ්‍ය තැන කල් ගනිමින් කරන සටන අසීරුවක් නොවෙයි. සියලු හමුදා කොටස් හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් තබා ගන්නට අපට හැකි විය යුතුයි."

"ප්‍රමාණවත් වෙද හෙද මණ්ඩලයක් පත් කිරීම, රාජ්‍ය වෛද්‍යවරුන් ගෙන් සිදුවේවි. විෂ වෛද්‍ය කණ්ඩායමකුත් එයට එකතු කර ගනීවි. එම කාර්යයන් වෙනුවෙන් සෙබළුන් සිය දෙනකු පත් කරන්නට උපදෙස් දී තිබෙනවා.

"එක් සෙනෙවියකු බාරේ සෙබළුන් දහස බැගින් සේනාංක සියයක්,දසමහ සෙනෙවිවරුන්ගේ සේනාංකවලට අමතරව සංවිධානය කර ඇති බව නන්දිමිත්‍ර සේනාධිපතිගේ වාර්තාවේ සඳහන් කර තිබුණා. අතිරේක සියලු සේනාංක හා අලුතින් එකතුවන බලසේනා හා ප්‍රධාන සෙනෙවිවරුන්ගේ අධීක්ෂණය යටතේ සේනාංකවලට ඇතුළත් කෙරේවි."

"කසාතොටට යනතෙක් සේනාංකවල පහසුව සඳහා ගමන් මාර්ග කිහිපයක් යොදා ඇති බව උත්තර මහ ඇමතිගේ වාර්තාවේ සඳහන් වෙනවා. නවාතැන්, ආහාරපාන ආදිය ගැන එක් එක් සේනාංකයට වෙන වෙන ම උපදෙස් ලැබේවි. විවිධ අවශ්‍යතා සඳහා පමණක් නොවෙයි යුද්ධ කාර්යය සඳහා එක්වන කාන්තාවන් පිළිබඳ වගකීම හා මෙහෙයවීම සමන්තා, මහිලා නැඟණියන්ටත් රජිතා, රන් මැණිකා බිසොවුන්ටත් පැවරෙයි." කී දුටුගැමුණු රජතුමා සාකච්ඡා වටය ඇරැඹීමට නන්දිමිත්‍රට කීවේ ය.

පසුදා උදෑසන මාගම රාජ්‍යයෙන් දූතයකු අනුරාධපුර රාජධානියට පැමිණ ඇති බව කසාතොටින් වාර්තා වූ වහාම එළාර රජතුමා ඔහු යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවට කැඳවන ලෙස උපදෙස් දුන්නේ ය.

දුටුගැමුණු රජතුමා සාම දූතයකු එවා ඇතැයි සිතූ එළාර රජු තමා අපේක්ෂා කරන සොළී සේනාව එනතුරු යුද්ධය ප්‍රමාද කර ගත හැකි නම් මැනවැයි සිතට නඟා ගත්තේ ය.

එළාර මහ රජතුමා. අමාත්‍ය මණ්ඩලය, මහසෙනෙවි මණ්ඩලය පමණක් කැඳවා ගන්නා ලද්දේ දූත කාර්යයට ප්‍රචාරයක් ලබා නොදිය යුතු යැයි දීඝජන්තු කළ යෝජනාව හෙයිනි.

කසාතොට සිට ආ ආරක්ෂක සෙනෙවිවරුන් දෙදෙනකු විසින් කැඳවාගෙන ආ බඤ්ජදේව මහසෙනෙවි, මහමෙව්නාවේ සම්මන්ත්‍රණ ශාලාවට කැඳවනු ලැබිණි. එළාර රජු ප්‍රමුඛ සභාව ඉදිරියට පැමිණි ඔහු එහි වූ කාටත් සිනාමුසු බැල්මකින් සංග්‍රහ කළේ ය.

"මහ රජතුමනි, මාගම රාජ්‍යයේ දුටුගැමුණු මහ රජතුමාගෙන් සන්දේශයක් රැගෙන ආවෙමි."

අයන්ති විතාන



# පින් පව් ගැන නොසිතා වැඩ කරනවා නම්

# ආදීනව විඳින්නටත් සූදානම් වන්න

**සැවැත් නුවර මහාකාල නම් උපාසකයෙක් විසීය. ඒ උපාසක තෙමේ සෝවාන් ය. ඔහු මසකට දින අටක් පෙහෙවස් සමාදන් විය. නිරතුරුව ම දහම් ඇසුමෙහි ද භාවනා කිරීමෙහි ද යෙදුණේ ය. රාත්‍රියෙහි විහාරයට ගොස් බණ අසා අලුයම් කාලයෙහි මුහුණ කට සෝදා පිරිසුදු වීම සඳහා විහාරය අසල පොකුණට පැමිණෙයි.**

ඒ ආකාරයෙන් දිනක් මහාකාල උපාසකතුමා පොකුණට පැමිණෙන විට ඒදින ම රාත්‍රියෙහි ධනවත් පුද්ගලයකුගේ නිවසක් සොරුන් බිඳ නොයෙක් ධනය පැහැර ගෙන යමින් සිටියහ. යම් හඬක් ඇසී ගෙහිමියෝ පිබිද පරීක්ෂා කොට බැලූහ. සොරු පසුපස ලුහු බඳින්නට වූහ. සොරු තමන් පැහැරගත් බඩු ද රැගෙන පැන ගියහ. එක් සොරෙක් විහාරයට යන මඟ ඔස්සේ දිව ගොස්, පොකුණ අසල කැලයේ සොරාගත් බඩු දමා සැඟවිණි. අලුයම් කාලයේ පොකුණට පැමිණි මහාකාල උපාසක මේ කිසිවක් නොදනී.

සොරු කණ්ඩායම පැන ගිය මඟ ලුහුබැඳ පැමිණි ගෙහිමියෝ, රාත්‍රි බණ අසා උදෑසන පොකුණෙන් මුහුණ සෝදමින් පිරිසුදු වන මහාකාල උපාසකත්, තමන් සතු බඩු භාණ්ඩත් දැක කිපුණාහ. "රාත්‍රියෙහි ගෙවල් බිඳ බඩු ගෙනැවිත් දමා තමා සොරෙක් නොවන බව හඟවන්නට විහාර පොකුණෙහි සිටින්නේ දැයි විමසමින් උපාසක අල්ලා ගත්හ. කිසිවක් නො විමසා, පරීක්ෂා නොකොට මහාකාල උපාසකව තලා, මරා දමා තම බඩුත් රැගෙන ගෙහිමියෝ ඉවත ගියහ.

උදෑසන කාලයේ විහාරයේ වත් පිළිවෙත් සිදු කොට පැන් ගෙන ඒමට පැමිණි ස්වාමීන් වහන්සේ නමක් පොකුණේ පසෙක මරා දමා සිටි උපාසක දැක දුකට, කම්පාවට පත්ව ඒ බව බුදුරජාණන් වහන්සේට සැළ කළේ ය.

අත්තනාව කතං පාපං
අත්තජං අත්ත සම්භවං
අභිමත්ථති දුම්මේධං
වජිරං වසම්මයං මණිං

තමා විසින් ම කළා වූ, තමා කෙරෙන් ම උපන්නා වූ, තමාගෙන් ම හට ගත්තා වූ අකුසලය ගලින් උපන් මැණික, දියමන්ති මෙන් අනුවණයා බෙහෙවින් මඩනේ ය.

බුදුරජාණන් වහන්සේ ඒ උපාසකට පෙර කළ පව් පල දුන් ආකාරය වදාළහ.

මහාකාල උපාසක පෙර අත් බවයෙහි කම් සුව සෙවීමෙහි ඇලී රූපවත් වූ තරුණ කාන්තාවක් කෙරෙහි ලොල් වී ඒ කාන්තාවගේ හිමියා මරණයට පත් කළේ ය. එම පාපයෙන් ඒ පුද්ගලයා අපායෙහි පැසෙන්නට විය. අපායෙහි දුක්වින්දත් ඒ පාප කර්මය නො ගෙවුණ හෙයින් ඉපදෙන අත් බව සියයක ම මේ ආකාරයෙන් මරණයට පත්වන බව පැහැදිලි කළ සේක.

තමා විසින් ම කරන ලද, තමා කෙරෙන් ම, උපන් තමා තුළින් ම හට ගැනුණු පව ඒ අනුවණ පුද්ගලයා විපතට, දුකට පමුණුවන බව තථාගත බුදුරජාණන් වහන්සේ වදාළ සේක.


අප ජීවත්වන සමාජයේ බොහෝ සේ මේ ආකාර වූ සිද්ධීන් දක්නට ලැබේ. පෘතග්ජන සමාජයේ මෙවැනි පාපකර්ම සිදු කරන පුද්ගලයන් තමන්ට අපාගත වී ගෙවන්න සිදුවන පාප කර්මය කෙතරම් බලවත් ද කියා නොසිතන්නේ ය. දුර්ලභ මනුෂ්‍ය ජීවිතය ලබා ඇති මෙම අවස්ථාවෙහි එමඟින් ලැබිය හැකි උතුම්ම ඵලය වන දහම් ඇස පාදාගෙන සසර දුකින් මිදීම සඳහා සතර සම්‍යක් ප්‍රධාන වීර්ය පවත්වාගත යුතු බවට නිතර මෙනෙහි කරන්න. පස් පව් දස අකුසල්වලින් මිදෙන්නට යැයි මොනතරම් පැවසුව ද වැඩි පිරිසක් ඒ ගැන නොසිතන්නේ කුමක් නිසා ද? එයට හේතුව නම් දුර්ලභව ලබා ඇති මිනිස් ජීවිතයේ වටිනාකම අවබෝධ කර නො ගැනීමයි. ජීවිතයේ සැබෑව තේරුම් ගන්නට නිතර උත්සාහ කරන්න.

බුදුරජාණන් වහන්සේ බුද්දක නිකායේ උදාන පාලියෙහි දී දේශනා කොට වදාළේ යම් කෙනකුට ප්‍රිය වස්තු යම් ප්‍රමාණයක් වේ ද ඒ හා සමානව ම දුක් ඇතිවන බව ය. යම් කෙනකුට ප්‍රිය වස්තුවක් නැද්ද ඔහුට දුකක් ද නැත.

**යම් කෙනකුට ප්‍රිය වස්තු යම් ප්‍රමාණයක් වේ ද ඒ හා සමානව ම දුක් ඇතිවන බව ය. යම් කෙනකුට ප්‍රිය වස්තුවක් නැද්ද ඔහුට දුකක් ද නැත. තමා විසින් ම කරන ලද, තමා කෙරෙන් ම, උපන් තමා තුළින් ම හට ගැනුණු පව ඒ අනුවණ පුද්ගලයා විපතට, දුකට පමුණුවන බව තථාගත බුදුරජාණන් වහන්සේ වදාළ සේක.**

**දීපා පෙරේරා**





## හැම දෙන රැස්වුණා අම්බස්තලාවට

පොසොන් පෝය දා පෙර සිරිලංකාවේ
එදා රජුන් මිගසෙන් පසු පස දිව්වේ
හුදු සතුටමයි මහ නිරිඳුන් ඉන් සෙව්වේ
සැණකෙළි සමරන්න මුව කැළ දිවි නැසුවේ

තිස්ස රජුන් හා සෙන් මිස්සක අරණේ
සැණකෙළි සිනා සයුරේ මොනවට ගිලුණේ
අසරණ මුව කැළගෙ ජීවිතයයි නැසුණේ
අනුබුදු බණෙනි සිරිලක දන මන දැමුණේ

දුහු හි විසිවුණා මහ ගන කැලෑවට
නැණ මල් පෑදුණා සම්බුදු බණ වෙතට
රජු පෙරටුව තබාගෙන තෙරුවන් පුදට
හැම දෙන රැස්වුණා අම්බස්තලාවට

සිරිමුවඟින් නැගුණු සදහම් අමිල මිණී
මිහිඳු සමිඳු දෙසුවේ හද දයාවෙනි
පස් පව් නතර වුණි ධර්මය පතළ වුණි
මුළු ලෝකයේ සිරිලක දම්දීපේ වුණි

සදහම් නිසා ජන හදවත නිති හැදුණා
බුදු බණ පද නිබඳ ජන සිත තුළ රැඳුණා
ඉසි කෝ මාන උල්කටු බල ඉන් සිඳුණා
දෙව්ලෝ සිරිය සිරිලක අප හට දැනුණා

යහගුණ කියාදී මිනිසත් දම් පෙව්ව
දැයකට මඟ කිව්ව තුඟු මිස්සක පව්ව
හෙළිකොට නැවත අනුකම්පාවෙන් යුතුව
සදහම් දියෙන් ජනහද සනසනු මැනව

උතුම් මිනිස්දම් සිරිලක වල් වැදිලා
සම්දුන් කියා දුන් බණ අමතක වීලා
පස්පව් නිසා සුන්දර රට වැනසීලා
ලක්විල සුදිලේවා සදහම් මල් පිපිලා

උදම්මිට ජාඇල
උත්තමාරාම පුරාණ විහාරයේ
**මොරටුවේ ආනන්ද හිමි**





# සම්බුදු දහමින් සුපෝෂිත පින් බිමක ශ්‍රී විභූතිය



කන්දේකුඹුරේ
නන්දසාර හිමි

**මිහිඳු මාහිමියන්ගේ ලංකාගමනයෙන් පසු මෙරට ඉතිහාසයේ නව සමාජ පරිවර්තනයක් උදාවිය. ඒ ආගමික, අධ්‍යාපනික, කෘෂිකාර්මික. කාර්මික, සාමාජික සහ දේශපාලනික වශයෙනි.**

ගස්ගල්, ඉර, හඳ, තාරකා, ගින්න, සුළඟ, අකුණු....ආදී ස්වභාව ධර්මයේ වස්තූන් ඇදහීම ලක්වැසි ජනතාව කාලාන්තරයක් තිස්සේ කරගෙන ආ ආගමික පුද පූජාවෝ ය. ඊට පසුකාලීනව යක්ෂ, නාග වැනි සත්ව වර්ගයා ද, අමනුෂ්‍යයින්ට ද වන්දනාමාන කළහ.

මිහිඳු මාහිමියන් මෙය අලලා පේතවත්ථු හා විමානවත්ථු වශයෙන් දෙවියන්, යක්ෂ යින් පිළිබඳ විස්තර කථා දෙසනුයේ උපත ලද ආත්මවල කුසලාකුසල තත්ත්වය හේතු කොටගෙන මරණින් මතු උපත ලබන ආත්ම පිළිබඳ විස්තරයයි. බෞද්ධයා උපතේ සිට මරණය දක්වා ජීවිතයේ වැදගත් යැයි සම්මත සෑම අවස්ථාවක ම ත්‍රිවිධ රත්නයේ පිහිටාධාර බලාපොරොත්තු වූහ.

ආදී දෙවියන්ගේ පිහිටාධාර බලාපොරොත්තුවෙන තැන එසේ පිහිට භය සැක සංකා දුරු කර ගැනීමට පිහිට ඉල්ලිය යුතු බව හින්දු දහමේ අදහසකි.

මිනිසුන්ට ඇතිවෙන මේ වූ බිය නිසැක සංකා, ලොමුඩැහැ ගැනීම් බුද්ධ රත්නය පිළිබඳව ද, ධර්ම රත්නය පිළිබඳව ද සංඝරත්නය පිළිබඳව ද සිතා සරණ ගොස් දුරුකර ගත හැකි ය. ඒ අනුව බුද්ධ වන්දනා, පිරිත් දේශනා, ධර්ම දේශනා, බෝධි පූජා චෛතිය සිදුකර ගැනීමට එකසේ වැදගත්වන බව පෙන්වා දෙයි. තව ද කඨින චීවර පූජා, අටපිරිකර පූජා......ආදී පූජාවෝ ද ඉතා වැදගත් ම මහාබල සම්මන්න පූජා පින්කම් අටෙකි. ඒවා අට මහ කුසල් යනුවෙන් නම් කෙරෙති.

වැව, දාගැබ, ගම, පාසල, කෙත්යාය යන පංච බලවේගය මහින්දාගමනයත් සමඟ මෙරට ඇති වූ වැදගත්ම සංකල්පයයි. මුළු මහත් සමාජය ම මේ හා බැඳී ක්‍රියා කිරීම අද ද දක්නට ලැබේ.

අනුරාධපුර යුගය මෙන් ම පොළොන්නරු යුගවල කළ වාරිකර්මාන්ත, වැව් අමුණු මහා සාගරය පරයා යන පරිදි ඉදිකළ බව පෙන්වාදිය යුතු ය. මහා පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය රටට ඉතා අගනා ප්‍රෞඪත්වයක් එකතු කරන්නකි.

මිහිඳු මාහිමියන්ගේ ඇරයුමකට අනුව මෙරටට වැඩම කරෙන සිය සොහොයුරිය වූ සංඝමිත්තා තෙරණිය සමඟ ගොවි කටයුතුවලට දක්ෂ ශිල්පින් ද පැමිණි බව සඳහන් වේ. ඔවුහු රැගෙන ආ විවිධ ධාන්‍ය වර්ග පිළිබඳව ඉතිහාසගත තොරතුරු සඳහන් වේ.

අධ්‍යාපනය ද මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකි වෙන්නේ මිහිඳු මාහිමියන් රැගෙන ආ බුදුදහම සූත්‍ර, විනය, අභිධර්ම වශයෙන් ත්‍රිපිටකාගත ව පැවති හෙයිනි. ඒ වූ ධර්ම කොටස් කියාදීමේ දී විශේෂයෙන් ම ඉගැන්වීම කළ යුතු වූ බැවිනි. මෙකල මිහිඳු මාහිමියන්ගේ නියමයෙන් මහා විහාරය ඉදිවූ අතර, එහි ධර්ම විනය කොටස් භික්ෂු අධ්‍යාපනය හැටියට ලබා දී තිබුණි. ඒ අනුව ශාසනයට ඇතුළු වූ භික්ෂූන්ට දහම් අධ්‍යාපනය අවශ්‍යයම වූවෙකි.

මහාවංශය, චූලවංශය, දීපවංශය වැනි ලංකාද්වීපය පිළිබඳ සිදුවූ ප්‍රවෘත්ති පිළිබඳ විස්තර ද, කව්සිළුමිණ, සියබස්ලකර ,අමාවතුර, බුත්සරණ, ජාතක පොත් වහන්සේ සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, සද්ධර්මරත්නාකරය, භෙසජ්ජමංජුසා, බෝධිවංශය, ථූපවංශය, සිදත් සඟරාව, වැනි මහත්වූ ග්‍රන්ථ රැසක් ගිහි – පැවිදි පඬුවන් විසින් රචනා කළහ. මිහිඳු මාහිමියන් මෙ ලක්දිවට රැගෙන ආ ත්‍රිපිටක ධර්මය මුඛ පරම්පරාගතව පැවැතියත්, වළගම්බා රජ දවස මාතලේ අලුගල්ලෙන් විහාරයේ දී සංඝායනා කොට සිංහල භාෂාවෙන් හෙළ අටුවා ලෙස ලියා තබන ලදී. පසුව හළටුවා බුදුගොස් මාහිමිපාණෝ හෙළ අටුවා පාලි භාෂාවට පරිවර්තනය කළහ.

පිරිවෙන් අධ්‍යාපනයට මූලික අඩිතාලම දමන ලද්දේ මිහිඳු මාහිමියන්ගේ ලංකාගමනය සිදුවූ පොසොන් සමය තුළ ය.

මිහිඳු ආගමනයත් සමඟ මෙරට ඇති වූ තවත් වැදගත් අංශයක් වනුයේ කලාත්මක පැත්තයි. මෙරට තුළ ගෘහ නිර්මාණ ශිල්පයත්, ඊට සම්බන්ධ චිත්‍ර, මූර්ති, කැටයම්, ලියකම්, මල්කම් ද, පෙරහර , තොරණ, නාට්‍ය දියුණු තත්ත්වයක පවතියි. ගෘහ නිර්මාණය පළමුව මිහිඳු හිමියන්ගේ උපදෙස් මත ඉදි වූ බව කියැවෙන්නේ කාලප්‍රාසාදය පිළිබඳ ව ය. පසුව මහා විහාරය ද විහාරාරාම ද තවත් ඉදිවිය.


ඒ අතරම විහාර (ප්‍රතිමා ගෙය) චෛතිය (දාගැබ) හා චෛතියඝර බෝධිඝර වැනි ගෘහයන් ද ත්‍රිවිධ චෛත්‍ය වන්දනා මාන කිරීමේ දී අව්, වැසි සුළංවලින් බේරීමට මෙන්ම, විහාරාරාමවල ආරක්ෂාවට ද ඉදිකළ බව පෙනේ.

එකී ගෘහ අලංකරණය සඳහා ලියවැල්, පලා පෙති, සඳකඩපහණ, කොරවක්ගල, වාමන රූප, මුරගල, පියගැට පෙළ, ලී ස්තර කැටයම් කර නිර්මාණ වශයෙන් අද ද නටබුන් අතරින් දැකගත හැකි ය.

එසේම රට පුරා දොළොස් මහා පොහොය දිනයන් පදනම් කරගෙන බෞද්ධ සංස්කෘතික මහා මංගල්‍යයන් ලෙස පෙරහර , වෙසක් පොසොන් තොරණ, පහන්කූඩු ආදිය ද නිර්මාණය කෙරෙනුයේ එදා මිහිඳු සංස්කෘතිය මෙරට බිහිකළ බෞද්ධ කලා කෞශල්‍ය ලොවට මොනවට ප්‍රකට කරමිනි.

කැලණියේ දුරුතු පෙරහර, මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ ඇසළ මහා පෙරහර, ප්‍රමුඛව කතරගම, මහියංගනය, රත්නපුර, දෙවුන්දර, අළුත්නුවර, නවගමුව, හලාවත, මූලික කරගෙන බුදුරජාණන් වහන්සේට සහ දෙවි දේවතාවුන්ට කරන ලද පුද පූජා හා වතාවත් හැටියට පෙරහර චාරිත්‍ර සිදුකරති.





# The Arrival Of Buddhism In Sri Lanka

As a result of the third Dhamma Council, Arahant Maha Mahinda Thero arrived in Sri Lanka with the sublime message of the Buddha on the Poson Full Moon Day and introduced Buddhism to all citizens. Ever since Sri Lankan Buddhists grandly celebrate the Poson Full Moon Day annually in the month of June throughout the country with immense pleasure and devotion.

Emperor Ashoka and king Devanampiya Tissa became friends though they had not met each other physically. According to some historical documents, as the kings of neighbouring countries, Ashoka and Devanampiya Tissa have exchanged their views and thoughts on differentmatters.

On one occasion Emperor Ashoka (communicated) wrote to his sincere friend, Devanampiya Tissa regarding his conversion to Buddhism taking refuge in the Buddha, the Dhamma, and the Sangha. With this message, he made a request to his friend, Tissa to take refuge in the noble Triple Gem - the Buddha, the Dhamma, and the Sangha.



Senior Lecturer, Pandit,
Faculty of Humanities and
Social Sciences
University of Sri Jayewardenepura
**Dr. Ven. Dodamgoda SumanasaraThero**

As a result of thistrue friendship and the genuine understanding between these two kings, king Dharmashoka sentout missionaries including his own beloved son Most Venerable Arahant Mahinda Thera with the sublime message of the Buddha and his teaching to our country in the reign of the king Devanampiya Tissa.

236 years after the passing away of the great teacher, the Buddha, the most venerable Arahant Maha Mahinda Thero who was the chief disciple of Arahant Moggaliputta Tissa Thero accompanied with Arahant Theras namely, Itthiya, Uttiya, Sambala, Bhaddasala, Arahant Sumana Samanera and the lay-anagami Bhanduka alighted on the Ambastala Rock (Mihintale), Anuradhapura in the year 347 B.C.

On this special day, king Devanampiya Tissa was out on a hunting expedition in Mihaintale with his retinue. But king Tissa was not aware of Mahinda Maha Thero and other monks remaining on the Ambastala Rock.

Then Mahinda Thero addressed the king solemnly by his name 'Tissa'. At that time, he was much astonished and looked around to see who was addressing him by his name. Then he saw Arahant Maha Mahinda Thero accompanied by other Theros on the rock and seeing them he respectfully kept his bow and arrow down. After seeing the Theros the king was in a doubt and he wanted to know about them immediately.

So, he asked several questions from Arahant Mahinda Thero. In reply to the questions, the Maha Thero introduced themselves and explained the purpose of arriving in Sri Lanka. He said that they were the disciples of the Buddha and had arrived from India for the benefit of the king and the people of Sri Lanka with great compassion.

"Samanamayam maharaja
dhammarajassa savaka
Tavewa anukampaya
jambudipa idhagata."

Further, he described that he was the son of Emperor Ashoka and had arrived with the sublime teachings of the Buddha to preach to the people of the country. Also, the Arahant Maha Mahinda Thero wanted to know whether the king of the country was intelligent enough to understand the doctrines of the Buddha, so he asked him the following questions;

**Arahant Maha Mahinda Thero:** Oh king, what is this tree?

**King Devanampiya Tissa:** Most Venerable Sir, it is a mango tree.

**Arahant Maha Mahinda Thero:** Are there any other mango trees here?

**King Devanampiya Tissa:** Yes, Most Venerable Sir. And there are many other mango trees here.

**Arahant Maha Mahinda Thero:** Are there trees other than this mango tree and those other mango trees?

**King Devanampiya Tissa:** Yes, Most Venerable Sir. There are trees but those trees are not mango trees.

**Arahant Maha Mahinda Thero:** Are there any trees other than those mango trees and the other trees?

**King Devanampiya Tissa:** Yes, Most Venerable Sir. It is this mango tree.

Having received good answers from the king to the questions, Mahainda Maha Thero turned the way of asking questions to further assess and observe the king's intelligence.

**Arahant Maha Mahinda Thero:** Oh king, have you any relatives?

**King Devanampiya Tissa:** Yes, Most Venerable Sir, I have many.

Arahant Maha Mahinda Thero: Are there any others who are not your relatives?

**King Devanampiya Tissa:** Yes, Most Venerable Sir, there are.

Arahant Maha Mahinda Thero: Is there anyone else besides your relatives and the others?

**King Devanampiya Tissa:** Yes, Most Venerable Sir, there is. It is me.

Through this friendly discussion, Arahant Mahinda Thero was able to assess the king's intelligence and realized that he was wise enough to embrace the sublime teachings of the Buddha. After that, the Maha Thero preached the Maha Hatthipadopama Sutta (the Simile of the Elephant's Footprint) to the king and his followers. As mentioned in the Mahavansa, after listening to the sermon the king Tissa and his forty thousand followers took refuge in the Buddha, the Dhamma, and the Sangha.

In the first few days, the Arahanth Maha Thero exposed several discourses such as Petavathu, Vimanavathu, Devaduta Sutta, Balapandita Sutta, Anamataggiya Sutta, Aggikhandhopama Sutta, Saccasamyutta Sutta and so on for the king, the ladies of the king's palace and the ordinary people to elicit the fundamental concepts of the Buddha's teachings. Based on the above sermons, the Arahant Thero revealed how good and bad deeds affect human life. Furthermore, he showed that accumulating merits would make life peaceful and happy. Through the Four Noble Truths, he has clearly elaborated why people would understand the reality of life in this existence as well.

In brief, the arrival of Arahant Maha Mahinda Thero in Sri Lanka was able to convert the human minds and their thoughts towards meaningful religious practices. Also, he illustrated the value of accumulating merits for the benefit of their lives and eradicating all painful suffering through his Dhamma sermons. So, all the people in the country should respect Arahant Mahinda Maha Thero and king Devanampiya Tissa for granting their invaluable, great and noble service to introduce Buddhism and establish Buddhism in Sri Lanka.



# සම්බුදු දහම අපට ලැබුණ දා

ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවට ඉතාමත් වැදගත්ම පොහොය දිනයකි පොසොන් පොහොය දිනය. ඒ ධර්මාශෝක අධිරාජයාගේ පුතු වූ මිහිඳු මහ රහතන් වහන්සේ විසින් බුදු දහම රැගෙන අප රටට පැමිණි දිනය වීමයි.

මුව දඩයමේ යමින් සිටි දේවානම්පියතිස්ස රජුට මිහින්තලා ගල් පර්වතය මුදුණේ සිට “තිස්ස” කියා ආමන්ත්‍රණය කළ මිහිඳු මහරහතන් වහන්සේ සම්බුදු දහම ප්‍රචාරය කිරීමේ මහඟු කාර්යය ආරම්භ කළ සේක. පොසොන් පෝදා සිහිපත් කරමින් රටපුරා පොසොන් පෙරහර රාශියක් ද පැවැත්වේ.

**දීත්ම සජාර ජයසිංහ**
*06 ශ්‍රේණිය*
*සිරි විමලසිරි ඉංග්‍රීසි දහම් පාසල,*
*පොල්පිටිමූකලාන*



# පොසොන් පොහෝදා

පොසොන් පොහොය අපට වැදගත් වන්නේ ශ්‍රී ලංකාද්වීපයට බුදුදහම ලැබූ දිනය නිසයි. අපේ ආගමික, සංස්කෘතික, සමාජයීය හා අධ්‍යාපනික අංශ මෙන්ම අපේ ශිල්ප ශාස්ත්‍ර ආදී සකලවිධ උපයෝගීතාවන්හි පුනර්ජීවනයක් හා නව ප්‍රබෝධයක් ඇති වූයේ මහින්දාගමනයත් සමඟයි.

දඹදිව අධිරාජයා වූ ධර්මාශෝක රජුගේ පුත්, මිහිඳු මහ රහතන් වහන්සේගේ මූලිකත්වයෙන් ඉට්ඨිය, උත්ථිය, සම්බල, භද්දසාල, සුමන සාමණේර හා භණ්ඩුක උපාසක යන පිරිස ලංකාද්වීපයේ මිහින්තලාවට වැඩමකර එවකට රජව සිටි දේවානම්පියතිස්ස රජු හා සිදුකළ අඹ පැනයේ සංවාදයෙන් පසුව දේශනා කළේ, චුල්ලහත්ථි පදෝපම සූත්‍රයයි. පොසොන් පෝදා අටසිල් සමාදන් වීම වැනි ආධ්‍යාත්මික පිළිවෙත්වලට අමතරව දන්සල් දීම, විශේෂයෙන් ම එදා මිහින්තලා ගල් පර්වතයේ දී වූ සිද්ධිය මූර්තිමත් කොට නිර්මාණ තැනීමත්, පරිසරය වර්ණවත් වන අයුරින් විදුලි බුබුළුවලින් සැරසීමත් බෞද්ධ කොඩිවලින් සැරසීමත් මෙදින දැකිය හැකි සුවිශේෂයන් වේ.

**ඩී.ජී. අනුපමා නෙත්සරණි**
*9 ශ්‍රේණිය*
*සුවිසුද්ධාරාම දහම් පාසල, වැල්ලවත්ත*

# ලක් දෙරණට පෑයූ සුපුන් සඳ

මිහිඳු සමිඳු සිරිලක් දිව වැඩි          දින
මුව දඩයමේ සිටියා අප රජුන්          කැලේ
රජුට දම් දෙසූ හිමි ගුණ කඳ          මෙකලේ
සිහිපත් කරමු බොදු දන අලස මෙත්          සිතිනේ

රාග ගින්න ඇවිලෙයි සත          වනසාලා
ලක්දිව සැමට සම්බුදු ගුණ          පෙන්වාලා
දයා සිසිලසෙන් සත සිත එකලු          කළා
පොසොන් පෝය සඳ දෙරණට          පායාලා

මෝහ අඳුර දුරලා මේ ලක්          දෙරණේ
දම් දෙසුවා අනුබුදු හිමි අඹ          සෙවණේ
ඒ සිල් සුවඳ තවමත් අප සිතට          දැනේ
තවමත් රැව් දෙනවා අනුබුදු හිමි          සඳුනේ

**වටරැක ඤාණවංස හිමි**
*2 ශ්‍රේණිය*
*ප්‍රඥානන්ද පිරිවෙන,මහරගම*



# සදහම් අරණ

සංස්කරණය - **නයනා නිල්මිණී**

# පොසොන් අසිරිය

පොසොන් සිරියෙන් රටම          බබළයි
පහන් එළියෙන් දසත          එළියයි
සැම තැනම බුදු ගුණ ම          පැවසෙයි
ඔබට සම්බුදු සමිඳු          සරණයි

**අලුත්වත්තේ සුගත රතන හිමි**
*ශ්‍රී බෝධිරාජරාම විහාර*
*ගලේවත්ත*

# දැහැමි දෙරණක ඇරඹුම

මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කළේ උතුම් පොසොන් පෝය දාක ය. ඒ සමඟම ලක් වැසියන්ට සසරින් එතෙර වීමේ මාර්ගය උදා වුණි. එදා දේවානම්පියතිස්ස රජු මුව දඩයමේ ගියේය. එදින පොසොන් පොහෝ දිනයක් විය. රජතුමා මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු පිරිස දැක ඔබලා කවුරුන්දැයි විමසුවේ ය. පසුව මිහිඳු හිමි රජුගේ පැනයට පිළිතුරු දෙමින් අපි ගෞතම බුදුරදුන්ගේ ශ්‍රමණ පුත්‍රයෝ වෙමු ඔබ ගැන අනුකම්පාවෙන් සසරින් එතෙර කරවීම පිණිස වැඩම කළෙමු කියා පිළිතුරු දුන්හ. රජතුමා දුනු ඊතල බිම දමා, දන නමා නමස්කාර කළේ ය. මිහිඳු හිමි රජුගෙන් ප්‍රශ්න ඇසුවේ ය. රජු පිළිතුරු දුන්නේ ය. රජතුමා ධර්මයට පැහැදුණු පසුදින මිහිඳු හිමි ඇතුළු පිරිස මාලිගයට වැඩම කළහ. මාලිගයේ සිටි සියලු දෙනාට ධර්මය දේශනා කොට නිවන් මාර්ගය පහදා දුන් අතර, භික්ෂු ශාසනය අප රටට දායාද කළ සේක.

**මල්කි රුවන්සා**
*07 ශ්‍රේණිය*
*ආනන්ද මහා විදුහල, ගාල්ල*



# පින්බර පෝ දිනෙක ...

ලක් දනන් ශිෂ්ටාචාරගත කරමින් සම්බුදු දහමේ මහිමය අපට ලැබුණු සුපින්වත් දිනයක් ලෙස පොසොන් පුර පසළොස්වක පෝ දිනය හැඳින්විය හැකි ය. එකල අපේ මුතුන් මිත්තන් යක්ෂයින්, නාගයින්, වෘක්ෂ දේවතාවන් වන්දනා කරමින් විවිධ මිථ්‍යා විශ්වාසවල සිටි කාලයකි.

එවන් ජාතියකට බුදු දහමේ සදාතනික උරුමය රැගෙන දේවානම්පියතිස්ස රජතුමා රාජ්‍ය කරන සමයෙහි මිහිඳු මහ රහතන් වහන්සේ අප මහා තිලෝගුරු බුදුපියාණන් වහන්සේගේ නිර්මල වූ බුදු දහම රැගෙන ලක්දිවට වැඩම කළහ.

ඉට්ඨිය, උත්තිය, සම්බල, බද්දසාල යන මහ රහතන් වහන්සේත්, සුමන සාමණේරයන් වහන්සේ සහ භණ්ඩුක උපාසක යන පිරිස මිහිඳු මා හිමියන් සමඟ මෙරටට වැඩම කළහ. ලක්දිව බුදු සසුන ආරම්භ කළහ. භණ්ඩුක උපාසක තුමා මහණ කරමින් මෙරට ප්‍රථම මහණ උපසම්පදාව සිදුකිරීම, අනුලා දේවිය ඇතුළු කාන්තාවන් බුදු දහම වැළඳ ගැනීම යනාදී උතුම් සිදුවීම් මාලාවක් සිදු වීම සම්බන්ධ අසිරිමත් පොහෝ දිනයක් ලෙස පොසොන් පුර පසළෙ ාස්වක පොහෝ දිනය බෞද්ධ අපට බොහෝ සේ වැදගත් ය.

**තරුෂි ෂෙහාරා තිලකසිරි**
*11 ශ්‍රේණිය*
*මෙත්මුණු දහම් පාසල ,*
*ඇහැලියගොඩ*


# පොසොන් පෝදා වැදගත්කම

තිස්ස කුමරු දඩයමේ යමින් සිටියදී, මිස්සක පර්වතයේ දී මිහිඳු මහ රහතන් වහන්සේ මුණ ගැසුණි. තමන් වහන්සේ කාගේ කවුරු ද යන්නත්, පැමිණියේ කුමකට ද යන්නත් පැහැදූ මිහිඳු මා හිමියන් තිස්ස රජුගේ දැනුම විමසා බලනු වස් අඹ හා ඥාති යන ප්‍රශ්නයන්ගෙන් ප්‍රශ්න ඇසූහ.

ප්‍රමාණවත් පිළිතුරු ලබා දුන් රජු හොඳ නුවණැතියකු බව මිහිඳු මාහිමියන්ට අවබෝධ විය. පසුව උන්වහන්සේ රජු ඇතුළු පැමිණි සිටි පිරිසට චුල්ලහත්ථිපදෝපම සූත්‍රයෙන් ධර්මය දේශනා කළහ. දේශනාව අවසානයෙහි රජු ඇතුළු පිරිස තිසරණ පන්සිල්හි පිහිටු වීමෙන් බෞද්ධයෝ වූහ. අන්ධකාරයේ සිටින්නකුට ආලෝකයක් දුන්නා සේ. මං මුළා වූවකුට නිසි මඟ කියන්නා සේ, මිසදුටු බොහෝ පුද්ගලයන් සම්‍යක් දෘෂ්ඨියෙහි පිහිටුවීම සඳහා මිහිඳු මාහිමියන් විසින් දේවදූත සූත්‍රය, බාලපණ්ඩිත සූත්‍රය, ආසිවිසෝපම සූත්‍රය ආදී බොහෝ සූත්‍ර දේශනාවන් උපයෝගී කරගෙන දහම් දෙසූහ.

මිහිඳු මාහිමියන් දෙසා වදා හළ සම්බුදු දහම ඇසුරු කරගත් අභිනව සංස්කෘතිය හේතු කොට ගෙන විශාල සමාජ විපර්යාසයක්, ආධ්‍යාත්මික විප්ලවයක්, චින්තන ප්‍රබෝධයක් ලක්වැසියන් අතර ඇති විය. මෙසේ මිහිඳු මාහිමියන්ගෙන් අපට ලැබුණු ශ්‍රී සද්ධර්මයේ පණිවුඩය රැක ගනිමින් අනාගත පරපුරට දායාද කිරීමට අප සියලු දෙනා තරයේ සිහියේ තබා ගත යුතු ය.

**කන්තලේ සූරියවංස හිමි,**
*සුවිසුද්ධාරාමය,*
*වැල්ලවත්ත.*




## බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

සම්පූර්ණ නම :- ...........................................................
පාසල /දහම් පාසල :- ...........................................................
ඉගෙනුම ලබන ශ්‍රේණිය :- ...........................................................
ලිපිනය :- ...........................................................
දුරකථන අංකය :- ...........................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක සතර පෝය දිනටම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.

# සම්බුදු සසුනේ උන්නතියට කැපවූ

# වරාපිටියේ ආනන්ද හිමි



දකුණු පළාතේ රෝහණ පුරවරයට අයත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ මනරම් පරිසරයක ඓතිහාසික සිත්තම්ගල්ලෙන රාජමහා විහාරාසන්නයේ රුක්ගහදෙනිය නිවසේ කොඩිකාර කංකානම්ගේ හෙන්ද්‍රික් අප්පුහාමි හා හෙට්ටිආරච්චි ගමගේ ඥාණවතී යන දම්පතීන්ට දාව උපන් දරුවන් හයදෙනකුගෙන් යුත් පවුලේ හතරවැනි දරුවා ලෙස 1950 අගෝස්තු 28 දින මෙම පින්වත් කුල කුමරුවා උපත ලැබීය.

රම්මල ආරණ්‍ය සේනාසනාධිපති නැටියපානේ ධම්මපාල ලොකු හාමුදුරුවන්ගේ ඇසුරට පත්ව උන්වහන්සේගේ මඟ පෙන්වීම යටතේ වතුරුවිල ශ්‍රී ඥාණානන්දාභිධාන මහා නායක ස්වාමීන් වහන්සේගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන් වර්ෂ 1963 නොවැම්බර් 21 වන දින වරාපිටියේ සුමනසාර නමින් උතුම් ප්‍රව්‍රජ්‍යා භූමියට පත්විය.

හුණුපිටියේ ගංගාරාම විහාරයේ ශ්‍රී ජිනරතන පිරිවෙණට ඇතුළත්ව අධ්‍යාපනය ලබමින් සිටින අතර, උතුරු තලංගම බත්තරමුල්ල හීනැටිකුඹුර පුරාණ විහාරයේ විහාරාධිපති අංගම්පිටියේ ගුණරතන ස්වාමීන් වහන්සේ ඇසුරේ හැදී වැඩෙමින් සුවච ව කීකරු ව ගුරු –ශිෂ්‍ය සබඳතාවක් ඇතිව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස විහාරාධිපති අංගම්පිටියේ ගුණරතන ස්වාමීන් වහන්සේ තමන් වහන්සේගේ ශිෂ්‍යයකු ලෙස හා ඇතුල්කෝට්ටේ සිරිපැරකුම්බා පරිවේණාධ්‍යක්ෂ තත් විහාරාධිපති අත්තිඩියේ ධර්ම ශ්‍රී නායක ස්වාමීන් වහන්සේ යන දෙනමගේ ආචාර්යත්වයෙන් හා උපාධ්‍යායත්වයෙන් වර්ෂ 1978 ජූලි 23 වැනි දින කෝට්ටේ රාජමහා විහාරයේ දී වරාපිටියේ ආනන්ද නමින් නැවත ප්‍රව්‍රජ්‍යා භූමියට පත් වූහ.

වර්ෂ 1971 ඇසළ මස 04 වැනි දින මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ වනවාස සංඝ මූලස්ථානස්ථ මංගල උපෝසථාගාරයේ දී වතුරුවිල ශ්‍රී ඥාණාන්දාභිධාන මහානායක ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍යයකු ලෙස උතුම් උපසම්පාද පදවියට පත්වූහ.

උතුරු තලංගම හීනැටිකුඹුර පුරාණ විහාරස්ථානයේ විහාරාධිපති අංගම්පිටියේ ගුණරතන ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍ය භාවය ලැබූ බැවින් කොළඹ කොටා පාර ජයවර්ධනාරාමය, කෝට්ටේ ශ්‍රී නාග විහාරය, හීනැටිකුඹුර පුරාණ විහාරය යන විහාරත්‍රයාධිපති අංගම්පිටිය් ගුණරතන ස්වාමීන් වහන්සේගේ සහ ඇතුල්කෝට්ටේ සිරිපැරකුම්බා පිරිවෙන් අධ්‍යක්ෂ අත්තිඩියේ ධර්ම ශ්‍රී නායක ස්වාමීන් වහන්සේ දෙනමගේ ශිෂ්‍යයකු ලෙස 1978 ජුනි මස 24 වන දින කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රිධර්ම මහා සංඝ සභාවේ කෝට්ටේ රාජමහා විහාරස්ථ මංගල උපෝසථාගාරයේ දී දෙවන වරට අධිශීල සංඛ්‍යාත උපසම්පදා ප්‍රාප්තියට පත්වූහ.

හීනැටිකුඹුර පුරාණ විහාරස්ථානයේ විහාරාධිපතිත්වයට පත් වූ අප ස්වාමීන් වහන්සේ ජරාජීර්ණ ව පැවති මෙම විහාරස්ථානය ක්‍රමානුකූලව පිළිසකර කරමින් නව විහාරාංග ද එකතු කරමින් සියලු විහාරාංගයන්ගෙන් සම්පූර්ණ වූ දර්ශනීය විහාරස්ථානයක් බවට පත්කිරීමට සමත් වූහ.

ස්වකීය නායකත්වයට අයත් වගකීම් නොකඩකොට මැනවින් ආරක්ෂා කරමින් විහාරස්ථ භික්ෂූන් වහන්සේලාට හා සතරපේරුවේ දායකදායිකා පින්වතුන්ට තමන් වහන්සේගෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් පිළිබඳ දැඩි අධිෂ්ඨානයකින් කටයුතු කිරීම උන්වහන්සේගේ සුවිශේෂ ගුණාංගයක් ලෙස දැක්විය හැකි ය.

පස්නමකගෙන් යුත් ශිෂ්‍ය පිරිසක් බිහිකිරීමේ කාර්යය ද වරාපිටියේ ආනන්ද ස්වාමීන් වහන්සේ වෙතින් ඉටුවී ඇත.

සම්බුද්ධ ශාසනය පිළිබඳ ප්‍රසන්න සිතින් යුතුව වැඩවිසූ උන්වහන්සේ වසර 60 කට අධික කාලයක් මහ තෙරනමක ලෙස මහ මෙහෙවරක් ඉටුකර වයස අවුරුදු 72ක් ආයු වළඳා 2022 ක් වූ ජුනි මස 05 වැනි ඉරු දින අපවත් වී වදාළහ.

හීනැටිකුඹුර පුරාණ විහාරය සහ බණ්ඩාරවත්ත ආනන්දාරාමය යන උභය විහාරාධිපති, විනයාචාර්ය, සමස්ත ලංකා සාමවිනිසුරු වරාපිටියේ ආනන්ද ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය පසු ගිය 08 වැනි දින සිදු කෙරිණි. උන්වහන්සේට උතුම් වූ නිවන් සුවය ප්‍රාර්ථනා කරමු.

දීපා පෙරේරා

# අංකුර පාලි පද්‍ය රචකයකුගේ කුසලතාව පළකරන

## “සිරි සරණංකර සංඝරාජ ථෙරාපදානය”



දෙදියගල නන්දරතන හිමි

මහනුවර අස්ගිරි මහාවිහාර මහා පිරුවන්හි ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණ සිදු කොට ප්‍රාචීන පණ්ඩිත උපාධිය සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂාවෙන් සිටින දෙදියගල නන්දරතන සාමණේරයන් වහන්සේ මැයි මස 25 වැනි දින මහනුවර මල්වතු මහාවිහාරයීය රාජපූජිත මංගලෝපෝසථාගාරයේ දී ස්වකීය උපසම්පදාව නිමිත්තෙන් සිරි සරණංකර සංඝරාජ ථෙරාපදානය නමින් පාලි ගාථා 128 කින් යුත් නිබන්ධනයක් මල්වතු මහාවිහාරයීය

විංශත්වර්ගික කාරක සංඝසභාව වෙත ඉදිරිපත් කොට අතිපූජ්‍ය ශ්‍රීමත් මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අනුනාහිමිපාණන් වහන්සේලා ප්‍රමුඛ සංඝ සභාවේ මහත් ප්‍රසාදයට පත් වූහ.




බෝධිසත්ත්ව ගුණෝපේත වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝ රාජෝත්තමයාණන් වහන්සේ නූතන ශාසන පුනරුද්දීප්තියේ ආදි කතෘවරයාණන් වහන්සේ යි. සම්බුද්ධ ශාසනයත්, භාෂා ශබ්ද ශාස්ත්‍රයනුත් පිරිහී පැවති යුගයක ලංකා ධරණී තලයෙහි ශ්‍රී සම්බුද්ධ ශාසනය පුනර්ප්‍රතිෂ්ඨාපනයෙහිලා අප්‍රතිහත ධෛර්යයෙන් විචක්ෂණශීලිව කටයුතු කළ සරණංකර සංඝරාජෝත්තම චරිතය අළලා රචනා වී ඇති ග්‍රන්ථ රාශියකි. 18 වැනි සියවස වන විට ලක්දිව පැවති සමාජ, ආර්ථික හා දේශපාලනික බිඳ වැටීම මෙන්ම ශාසනික පරිහාණිය පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇතුළත් එකී ග්‍රන්ථ සමුදාය මගින් ප්‍රක්ෂේපිත ශ්‍රී සරණංකර සංඝරාජ චරිතාපදානය අද්‍යතන ශාසනික ගැටලු නිරාකරණයෙහිලා ද සපයන පිටිබලය සුවිසල් ය.

එකී මහානීය චරිතාපදානය වස්තුවිෂය කොට ගනිමින් පාලි භාෂාවෙන් පද්‍ය කාව්‍යයක් ඉදිරිපත් කිරීමට දෙදියගල නන්දරතන හිමියන් විසින් කටයුතු කිරීම අතිශය ප්‍රශංසාර්හ කටයුත්තකි. ප්‍රාචීන අධ්‍යාපනය නිමකරමින් යතිවරයාණන් වහන්සේ නමක් ලෙස ස්වකීය පාලි භාෂා පාණ්ඩිත්‍ය, ගාථා බන්ධනයේ ඡෙකත්වය මෙන් ම, සරණංකර සංඝරාජෝතතමයාණන් විෂයෙහි ස්වකීය ගෞරවය ද මනාව විශද කිරීමට මේ තුළින් නන්දරතන හිමියන් සමත් ව ඇත.

මල්වතු මහාවිහාරානුයත්ත දක්ෂිණ ලංකාවේ අති සම්භාවනීය සංඝ පරම්පරාවක් වන තෙල්වතු සංඝපරම්රාවට අයත් දහර භික්ෂුවක් ලෙස සිය අධිශීල සංඛ්‍යාත උපසම්පත්තිය නිමිති කොටගෙන මෙවැනි මහැඟි ශාස්ත්‍රීය ව්‍යායාමයකට ප්‍රවේශ වීම ම නන්දරතන හිමියන් තුළ පවත්නා ශාස්ත්‍රකාමීත්ව ප්‍රකාශ කරන්නකි. ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් සමස්ත ලංකා දෙවැනි ස්ථානය ලබාගෙන ශෝභාවත් අධ්‍යාපන පසුබිමකට හිමිකම් කියන දෙදියගල නන්දරතන හිමියන් හට තවදුරටත් මෙවැනි විශිෂ්ට සාහිත්‍ය නිර්මාණ සිදු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවා'යි ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

මල්වතු මහාවිහාරයේ විංශත්වර්ගික කාරක සංඝසභික, රාජකීය පණ්ඩිත, දර්ශනපති,

**මහවෙල රාජගුරු ශ්‍රී ධම්මක්ඛන්ධ රතනපාල නාහිමි**





# ඌවේ උපසම්පද පුණ්‍යමහෝත්සවය මෙම මස 25 වැනි ද

ඌවේ සියම් මහා නිකායේ වාර්ෂික උපසම්පදා පුණ්‍යමහෝත්සවය මෙම 25 වැනි සෙනසුරාදා ඌවේ සියම් මහා නිකායේ අතිගෞරවාර්හ ශ්‍රීමත් මහා නායක, කැප්පෙටිපොල ශ්‍රී සෝමානන්ද මහ පිරිවෙනේ සම්මානිත පරිවේණාධිපති, එරබද්ද ශ්‍රී විවේකාරාමාධිපති, මහෝපාධ්‍යාය ශ්‍රී සුමන ප්‍රඥසේකර වැටහිරේ සෝරතාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අනුනායක ස්වාමීන්ද්‍ර ප්‍රමුඛ විංශත්වර්ගික කාරක සංඝ සභාවේ සහභාගිත්වයෙන් කලබුලුලන්ද පුරාණ විහාරස්ථ ශ්‍රී දේවරක්ෂිත උපෝසථාගාරයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බව ඌවේ සියම් මහා නිකායේ ප්‍රධාන ලේඛකාධිකාරී විල්ඔය පඤ්ඤතිලක ස්වාමීන්ද්‍රයන් වහන්සේ දන්වා සිටිති.

# උපසම්පදා ලබති



අපවත් වී වදාළ ඌවේ සියම් මහා නිකායේ ශ්‍රීමත් මහා නායක, පාලුගම ශ්‍රී සුභද්‍රාරාමය, ඓතිහාසිකතැන්න ශ්‍රී සෝමානන්ද බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පිළියන්දල, සුවාරපොල බුද්ධාලෝක මහා විහාරය යන විහාරත්‍රයාධිපති, ශ්‍රී සෝමානන්ද මහ පිරිවෙනේ කෘත්‍යාධිකාරී, සද්ධර්මභාරතීශ්වරාචාර්ය අඹේවෙල පඤ්ඤසාරාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා විල්ඔය පඤ්ඤතිලක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රිය ශිෂ්‍යවර අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලයෙහි ශාස්ත්‍රෝද්ග්‍රහනයෙහි නිරත කැප්පෙටිපොල මේධානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේ මේ මස 25 වැනි ශනි දින මහා විහාරවංශික ඌවේ ස්‍යාමෝපාලි මහා නිකායේ කලුබුලුලන්ද පුරාණ විහාරස්ථ ශ්‍රී දේවරක්ෂිත උපෝසථාගාරයේ දී අධි සීල සංඛ්‍යාත උපසම්පදාවෙහි පිහිටුවති.

උන්වහන්සේ පිළිගැනීමේ උත්සවය මේ මස 26 වන ඉරිදා කැප්පෙටිපොල, පාලුගම ශ්‍රී සුභද්‍රාරාම මහා විහාරස්ථානයේ දී පැවැත් වෙයි.

# උපසම්පදා ලබති



පදලංගල අතුල හිමි



නාරංඹිවිට ලක්ඛණ හිමි



පනාකඩුවේ රාහුල හිමි

ගාල්ල යටගල රාජමහා විහාරය, රුහුණු මාගම සිතුල්පව්ව රාජමහා විහාරය ප්‍රමුඛ තදනුබද්ධ අෂ්ට මහාවිහාරාධිපති, හෙට්ඨාවල පරිවේණාධ්‍යක්ෂ, දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක, උපාධ්‍යාය ධුරන්ධර, අග්ගමහා පණ්ඩිත මැටරඹ හේමරතන නාහිමි ලේල්වල සමිත හිමි, කෙහෙල්වල සුමංගල හිමි, පදලංගල අස්සජි හිමි සහ බෝපාගොඩ නාගිත හිමි යන හිමිවරුන්ගේ ශිෂ්‍ය හිමිවරුන් වශයෙන් යටගල රාජමහා විහාරවාසී, හෙට්ඨාවල පිරුවනේ ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණ කටයුතු සිදු කොට දැනට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන පනාකඩුවේ රාහුල හිමි, පදලංගල අතුල හිමි සහ නාරංඹිවිට ලක්ඛණ හිමි යන සාමණේර හිමිවරුන් පසුගිය මැයි මස 20 වන දින මහනුවර මල්වතු මහාවිහාරයීය රාජපූජිත මංගල උපෝසථාගාරයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලැබූහ.

# රාගම වල්පොළ ඓතිහාසික පොසොන් මහ පෙරහර

1928 වර්ෂයේ පොසොන් පුරපසළොස්වක පොහෝ දින ඉතා කුඩා මල් පෙරහරකින් ආරම්භ වූ රාගම – වල්පොල පොසොන් මහ පෙරහර 93 වැනි වරට සුපුරුදු පරිදි පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබේ.

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අශ්චර්යවත් උතුම් ශ්‍රී සද්ධර්මය සිරිලකට වැඩම කොට, සම්බුද්ධ ශාසනය පිහිටුවා වදාළ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ අපිරිමිත ගුණකදම්භය සිහිපත් කරමින් කෘතගුණ සැලකීමේ මහානීය පුණ්‍ය කර්මයක් ලෙස මෙම රාගම වල්පොල ඓතිහාසික පොසොන් මහ පෙරහර පැවැත්වේ. ශ්‍රී විමලරත්නාරාම විද්‍යානිවාස මහ පිරිවෙන් මහ විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන සියලු දෙනාගේ ආශිර්වාදයෙන් මෙම පින්කම වාර්ෂිකව පැවැත්වේ. උඩරට, පහතරට, සබරගමුව නැටුම්වලින් අලංකාර වල්පොළ ගිනිකෙළි කණ්ඩායමෙන් ආලෝකවත් වෙමින් ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදයෙන් සැමට සෙත ශාන්තිය සැලසේවා යන උදාර අරමුණෙන් මෙම පෙරහර පැවැත්වේ. ශ්‍රී විමලරත්නාරාම විද්‍යා නිවාස මහ පිරිවෙන් මහ විහාරස්ථානයේ විහාරධිපති පිරිවෙන් කෘත්‍යාධිකාරී කලුවලග විමලසාර නාහිමි, විහාරගණයේ ප්‍රධාන සතරකාර තබ්බෝව පුරාණ විහාරස්ථානයේ විහාරධිපති පොල්පිටිමූකලානේ විමලරතන නාහිමි ඇතුළු පැවිදි අනුශාසක හිමිවරුන්ගේ අනුශාසනා අනුව ගිහි පින්වතුන්ගේ උපකාරයෙන් ආර්ථික අර්බුදයෙන් රට පවතින තත්ත්වයක වුව ද ඉතාම කැපවීමෙන් සංස්කෘතික උරුමය රැක ගැනීමේ අරමුණෙන් මෙම පෙරහර පවත්වයි. පසුගිය වසර කිහිපයක් අර්බුද හමුවේ පෙරහර හොඳින් කළ නොහැකි වූ අතර ශ්‍රී ලංකාවේ ජනතාව මුහුණ දී ඇති කරදර දුරු වීමට ප්‍රාර්ථනා කරමින් මේ වසරේ පෙරහර පැවැත්වේ.

පෙරහරට සමගාමීව සත්දින බෝධිපූජා පින්කම්, පිරිත්, පින්කම්, දානමය පුණ්‍යක්‍රියා ආදීයත් ජුනි මස 10,11,12 තෙදින ස්වාමීන් වහන්සේලා උතුම් ධර්ම දේශනා ද පවත්වති. පොසොන් පොහොයට පෙර දින (13) සවස සුබ මොහොතින් සුපුරුදු ගමන් මාර්ගයේ පෙරහර ගමන් කරනු ලබයි.

**සිරිමල්ගොඩ විමලජෝති හිමි**

# පිහිට පතයි

නාරහේන්පිට පදිංචි ඒ.යු.ආර්. ප්‍රේමචන්ද්‍ර යන අය දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට "ඕ පොසිටිව්" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව වෛද්‍යවරු නිර්දේශ කර ඇති බව ද කියයි. පරිත්‍යාගශීලියෙකු වේ නම් 071 3580178, 071 42 73470 දුරකතනයන්ට දැනුම් දෙන ලෙස ඉල්ලීමක් කරයි.

.........................................

මග, පින්නවල දියබලුලන්ද අංක 84 හි පදිංදි එම්.ඩී. පුබුදු පැතුම් දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඔහුට "ඕ පොසිටිව්" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළයුතු බව වෛද්‍ය නිර්දේශය බව ද කියයි. පරිත්‍යාගශීලියෙකු වේ නම් 071 1075246 සහ 070 1964546 දුරකතනයට දැනුම් දෙන ලෙස ඉල්ලීමක් කෙරේ.

.........................................

මහියංගණය, වටවන සොරබොර ඓතිහාසික ශ්‍රී සේරණා ගල්ලෙන් භාවනා මධ්‍යස්ථානාධිපති බලංගොඩ ශ්‍රී නාරද හිමියන් එක් වකුගඩුවක් දන් දුන් බව ද මේ වන විට අනෙක් වකුගඩුවට විෂබීජයක් ඇතුල් වී ඇති බව ද කියයි. උන්වහන්සේට වකුගඩුවක් පරිත්‍යාග කිරීමට අයකු සිටියත් ඒ සඳහා මුදල් නොමැති බව කියයි. පරිත්‍යාගශීලීන් වේ නම් 076 48 92 385 දුරකතනයෙන් වැඩිදුර විස්තර විමසිය හැකි බව කියයි. ආධාර උන්වහන්සේගේ නමින් ඇති ලංකා බැංකුවේ විවෘතව ඇති 82105651 ගිණුමට මුදල් බැරකළ හැකි බව ද කියයි.

.........................................

සම්පත්නුවර, අංක 90 හි පදිංචි ටී.එම්.එස්.එස්. විජය බණ්ඩාරනායක (33) යන අය වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. දුෂ්කර පළාතක ගුරුවරයකු වශයෙන් කටයුතු කරන ඔහුට බී පොසිටිව් වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මනින් අවශ්‍යව ඇති බව කියයි. වැඩි විස්තර 0714376978/0778198671 දුරකතන අංකයෙන් විමසිය හැකි බවද කියයි.


.........................................

හෝමාගම, ගලවිලපාර, අංක 244/ඒ හි පදිංචි දිනේෂා හිරුෂි දියණිය (16) දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඇයට ඉක්මනින් වකුගඩුවක් බද්ධ කළ යුතු බව වෛද්‍ය නිර්දේශය බව ද කියයි. වකුගඩුවක් පරිත්‍යාගශීලියෙකු සිටිය ද ඒ සඳහා විශාල මුදලක් වියදම් වන බව මව්පියන් දන්වා ඇත. මුදල් පරිත්‍යාගශීලින් වේ නම් මහජන බැංකුව හෝමාගම ගිණුම් අංක 049- 2- 001-8-0072172 ගිණුමට මුදල් බැර කළ හැකි බව ද කියයි. වැඩි විස්තර 0768970211 දුරකතනයෙන් විමසිය හැකි බව ද කියයි .

# බත්තරමුල්ල සිරි සුදර්ශනාරාම සදහම් සෙනසුන - පෝද පින්කම්


පෙරවරු 6.00 - 7.00 සීල සමාදානය හා අනුශාසනාව, 7.00 - 7.30 තෙරුවන් වන්දනාව, 8.15 - 10.00 භාවනාව 10.00 - 11.00 ධර්ම දේශනය, 11.00 - 11.30 තෙරුවන් වන්දනාව උදෑසන වැඩසටහන් මෙහෙයවීම ආචාර්ය මිරිස්සේ ධම්මික නා හිමි. පස්වරු 12.30 - 1.00 සූත්‍ර සජ්ඣායනාව, 1.00 - 2.00 ධර්ම දේශනය සියඹලාගොඩ ධම්මින්ද හිමි, 2.00 - 3.30 ධර්ම සාකච්ඡාව ඇල්ලේ කුසලඤාණ හිමි, 4 - 5 ධර්ම දේශනය මහඔය අනුරුද්ධ හිමි, 5 - 6 ධර්ම දේශනය මඩිහේ සුගතසිරි හිමි.

# පොහොය දින දර්ශනය




පොසොන් පුර පසළොස්වක

**පොසොන් පසළොස්වක පෝය ජුනි 13 සඳුද අපරභාග 09.02 පුර පසළොස්වක ලබා 14 අඟහරුවාද අපරභාග 05.22 ගෙවේ. 14 අඟහරුවාද සිල්.**



පොසොන් අව අටවක

ජුනි 21



පොසොන් අමාවක

ජුනි 28



ඇසළ පුර අටවක

ජූලි 07



# අමා දම් ගඟ ගලා ගිය වග



මිස්සක පව්ව මත අනුබුදු මිහිඳු හිමී
ලස්සන පොසොන් සඳ රැස් අහුරකට තෙමී
තිස්ස ය කියා අමතන විට සිරස නැමී
පස්සට ගියා මහ රජ අවි බිමට දැමී

දුනු හී අමෝරා මුව දඩයමේ ගිය
මහ රජ දෙවන පෑතිස් හදවතේ බිය
මතු කර කඳු මුදුන බැලුවම අගේ ම ය
වැස්සූ මිහිඳු හිමි සදහම් අමා දිය

**රත්නපුර**
**ගිලීමලේ සමීර එම්. ගමගේ**

# පොසොන් පොහෝ දින අසිරිය

නිරිඳු දඩ කෙළි යද්දී
තිස්ස යන නම ඇසුණී
කඳු මුදුන වෙත යද්දී
රජු මිහිඳු හිමි දිටී

විමසමින් අඹ පැනය
රජුගේ පිළිතුර ලබා
හස්ති පද සුතුරකින්
මිහිඳු හිමි දම් දෙසූ

**කැස්බෑවේ මුණසිංහ නිශ්ශංක**


# පොසොන් පොහෝ දින

කසාවතින් සැරසී අනුබුදු හිමි මිස්සක පව්වට වැඩිය දිනේ
සිහිපත් කරමු බැති සිතින් පින්බර පොසොන් දිනේ
අඳුරින් ආලෝකයට ලක්දිව එක් කරපු දිනේ
කියමින් තුරු ලතා තාලෙට සුළඟෙ වැනේ

**පානදුර අරුක්ගොඩ ඩබ්.පී. ඉන්ද්‍රානි**



# පොසොන් සඳ බැබළේ



තටු සල සලා ඉගිලෙති සමනල රැන
සිරි සිරි පොදය සිරුරට සීතල ගේන
සම්බුදු සිරිය ඇත තවමත් අඩු නූන
බැබළෙයි පොසොන් පසළොස්වක සඳ මුහුණ

පිහිනා සයුර මැද මෑණියන් කර තබා
විවරණ රැගෙන තම අරමුණ ම සිහි තබා
සාරාසක කල්ප සසරෙහි වැඩිය නොබා
බුදු වුන මහිමි වඳිනෙමි සිරස බිම තබා

**ගිලිමලේ - රත්නපුර**
**ඩී.එස්.ඇඩ්වින් පෙරේරා**

# මිහිඳු සමිඳු වැඩියා බුදු දහම අරන්

පායා පුර සඳ ගනඳුර බින්දාට
තරු හිනැහිලා නිලඹර දිලුනාට
බැඳිලා ලෝබ සිත දඩයමට
පෑතිස් නිරිඳු වැදුණා මහ වනයට

මුවාගෙ පස්සේ රජු ලුහුබැන්දා
පිබිදෙන සතුටින් දුනු දිය ඇද්දා
තිස්ස කියන හඬ රජු සිත බින්දා
දුනු හී අතහැර හිමිරුව වැන්දා

සම්බුදු සමිඳු තෙවරක් වැඩි ලක්බිමට
අනුබුදු මිහිඳු සමිඳුන් වැඩ මිස්සකට
අපි වෙමු පසිඳු සමනුන් ගිය බුදුමගට
දෙසුවා මිහිඳු හිමි පෑතිස් නරනිඳුට

ඉර පායන විට මිනිසුන් ඉරටත් වැන්දා
සඳපායන විට ගැමියන් සඳටත් වැන්දා
විසල් ගසක් විසල් ගලක් දුටුවත් වැන්දා
ගතවිලි වසන්නට කොළඅතු ඇන්දා

අහන්න දරන්න නිති දහමක් ලැබුණා
ලියන්න කියන්න නිති ශිල්පය ලැබුණා
නෙළන්න සදන්න නිති කලාව ලැබුණා
ගයන්න වයන්න නිති තාලය ලැබුණා

වනයට මනරම් උයනක් සැදුණා
උයනට අගනා සෑයක් සැදුණා
සසුනට වටිනා අරමක් පිදුණා
දනහට විඳිනට දහමක් ලැබුණා

පෑතිස් නිරිඳු හා හතළිස් දහසක් ආවා
චුල්ලහත්ථි සුතුරට සැම කැටිකෙරුවා
අනුබුදු මිහිඳු හිමි තුම් සදහම් දෙසුවා
තෙරුවන් සරණ ගොස් බොදුවන් වූවා

සාමණේර සුමන හිමිගෙ ඇරයුම් ලැබිලා
මිස්සක පව්වට දෙව් මහ පිරිසක් වැඩලා
අනුබුදු මිහිඳු හිමි සදහම් රස බෙදලා
පොසොන් පෝය දා ලක්දිව එකලු කළා

**ඒ.එම්. අබේසිංහබණ්ඩා**
**මහනුවර**

# දහමෙහි පැහැද

පෝදා සඳවතින් විහිදේ රැස් කිරණ
ඒ සඳ රැසින් බැබළේ මුළු ලක් දෙරණ
රෑ තද අඳුර සඟවා තුටු කර නයන
පෑ ඔද සිහි කරයි අනුබුදු හිමි ගමන

බුදුවස් දෙසිය තිස්හය වන වසරේ දී
මුටසිව නිරිඳු දම්සෝ නිරිඳුගෙ සබැදී
දෙව්පියතිස් කුමරුහට රජකම ලැබදී
සිහසුන් පත් කළේ ලක්මව පින් පිරිදී

උතුම් බුදු දහම ලොව අන් රටවලට
දෙසා එම සුවය දීමට ලෝ දනට
දම්සෝ නිරිඳු තෝරාගත් රට වලට
ලක්දිව අයත් වූයේ අපේ පෙර පිනට

රජ ඇරයුම ලැබුණි අනුබුදු සමිඳුන්ට
ලක්දිව වැඩමවා ලක් රජු හමුවන්ට
බුදු දම් දෙසා බුදු සසුන ද අරඹන්ට
තුම් බුදු දහම සදහට මෙහි පවතින්ට

රජ ඇරයුම පරිදි අනුබුදු හිමි සමිඳු
කුළුණෑස අප රටේ ජනයා වෙත විහිදූ
මෙහි වැඩමවා හමුවී පෑතිස් නිරිඳූ
සදහම් දෙසා ලක් දනගේ සිත් පැහැදූ

දන් දෙමු පින් කරමු තෙරුවන් නිති නැමද
සන්සුන් ගති පැවත්මන් නිරතුරු වැළඳ
පින් පිරි පිළිවෙත් ම තහවුරු කර නිබඳ
සන්තොස් දැයක් වෙමු බුදු දහමෙහි පැහැද

**විමල් රූබසිංහ**

# පහන් සිතක කවි



**සංස්කරණය**
**දීපා පෙරේරා**

## නිරාමිසය

සඳ නැඟ එන
මැදියම් රෑ
සුළඟ හමන හෝරාවේ
කුටියේ උණුසුම මැද්දේ
බවුන් වඩමි නිසන්සලේ
නිවී ගිහින් මුළු ලෝකෙම
සිත නොදුවයි සතර අතට
නිහඬව නතරව
එකතැන
දැනෙන සුවය
නිරාමිසය

**මාස්පොත**
**ධම්මජෝති හිමි**

## නොදනිමි

රාග ද්වේශ මල මෝහ පරාජිත
ලොව්තුරු බුදු සමිඳුන්
දෙසා සැනහූ රසින් මනහර
මහරු දම් දිය රැස්
කමල බුදු පා සොඳුරු ගුණ පා
වැළඳගත් තෙවරක්
සොඳුරු ලක්දිව ලොවේ සුපතළ
දෙකට බෙදිලා දැන්
කිමිද මම නොදනිමි...
ජාති කුල මල භේද අතරට
ආගමක් එක් වී
නිවට දන සත කාසි අතරට
ජීවිතත් බදු දී
සැමට සෙත දෙන කවිය අතරට
බුදු දහම මිල වී
දහස් අවුරුදු රැකෙන්නේ දම්
කෙසේ දෝ සොයමී,
කිමද මා නොදනිමි.....

**කොත්මලේ චන්දනන්ද හිමි**
**ශ්‍රී විද්‍යාජෝති පිරිවෙන**



බුදුසරණ
## පහන් සිතක කවි

සම්පූර්ණ නම :- ..........................................................................
ලිපිනය :- ..........................................................................
දුරකථන අංකය :- ..........................................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.

# පෝද පින්කම්

## ඓතිහාසික ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරය

පෙරවරු 6.00 - 07.00 සීල සමාදානය, උදෑසන බුද්ධ පූජාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරයේ කාර්‍යාධිකාරී ශාස්ත්‍රවේදී රන්දිලිගම මහින්ද හිමි, 8.00 - 9.00 භාවනාව ශ්‍රී කල්‍යාණි උභය රාජමහා විහාරාධිපති, කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති අග්ගමහා පණ්ඩිත, උපාධ්‍යාය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි, 9.00 - 10.00 ධර්ම දේශනාව ශාස්ත්‍රපති මාදෝවිට වජිරබුද්ධි හිමි, 10.00 - 11.00 ධම්මපදයෙන් බිඳක් මාලබේ අශෝකාරාම විහාරවාසී, කොළඹ අශෝක විද්‍යාලයේ ආචාර්ය ශාස්ත්‍රවේදී කලණියේ ශාසනවංශ හිමි, 11.00 - 11.30 දිවා බුද්ධ පූජාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරවාසී, ශාස්ත්‍රවේදී මාවුස්සාගොල්ලේ මුදිත හිමි, පස්වරු 2.00 - 3.00 වෛද්‍ය දේශනය, 3.00 - 4.00 ධර්ම දේශනාව සියඹලාගොඩ ධම්මින්ද හිමි, 4.00 - 5.00 ධර්ම දේශනාව රාජකීය පණ්ඩිත බැලුම්මහර ඉන්ද්‍රානන්ද හිමි, 5.00 - 6.00 භාවනාව මහින්ද සංඝරක්ඛිත නාහිමි, 6.00 - 7.00 ගිලන්පස බුද්ධ පූජාව කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය දෙනියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි.

## මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය වැඩිහිටි සීල සමාදානය

පෙරවරු 6.00 - 7.00 සිල් සමාදන් කරවීම සහ බුද්ධ පූජාව රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති වතුරගම ධම්මජීව හිමි, 8.00 - 9.00 භාවනාව- රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මන සුමනසිරි හිමි, 9.00 - 10.00 ධර්ම දේශනාව කළුබෝවිල විවේකාශ්‍රමාධිපති මහරගම පදුම හිමි, 10.00 - 11.00 ධර්ම සාකච්ඡාව- රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පානදුර පසන්න හිමි, 11.00 - 11.15 බුද්ධ පූජාව- වැලිගෙපොල සුගතවංස හිමි, තලංගල්ලේ ධම්මරතන හිමි, පස්වරු 12.20 - 1.00 පිරිත් හා තෙරුවන් ගුණ සෙල්ලකතරගම සන්තිඳ හිමි, ගලහිටියේ නාගිත හිමි, 1.00 - 2.00 ධර්ම සාකච්ඡාව ත්‍රිපිටකාචාර්ය වේරදුවේ මහින්ද හිමි, 2.00 - 3.00 ධර්ම දේශනය- ආචාර්ය මිරිස්සේ ධම්මික හිමි, 3.00 - 3.45 ධර්ම දේශනාව- ශාස්ත්‍රපති පණ්ඩිත තල්පාවිල කුසලඥාන හිමි, 4.00 - 5.00 ධර්ම දේශනාව- පණ්ඩිත කථිකාචාර්ය වැලිගෙපොල සීලවංස හිමි, 5.00 - 6.00 ධම්ම පදය- මීගොඩ මධුභානී හිමි, 6.00 - 6.30 බෝධි පූජාව සහ සිල් අලුත් කිරීම, රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මන සුමනසිරි හිමි.

## හොරපාවිට ශ්‍රී විජය සුන්දරාරාමය

කපුදූව ශ්‍රී ගුණාලංකාර නා හිමියන්ගේ සහ නාරන්දෙණියේ පුඤ්ඤරතන නාහිමියන් ඇතුලු අපවත් වී වදාළ ගෞරවණීය ස්වාමීන් වහන්සේගේ ගුණ සිහිකිරීම නිමිත්තෙන් වාර්ෂිකව පැවැත්වෙන බෝධිපූජා, මල් පහන් පූජා, ධර්ම දේශනා, සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනා ඇතුලු පින්කම් මාලාවක් මේ මස 21 සිට 28 දක්වා පැවැත්වීමට කටයුතු යෙදා ඇත.

ඊට සමගාමීව 26 වැනිදා ලේ දන්දීමේ පින්කමක් උදේ 8 සිට සවස 3 දක්වා පැවැත්වෙන බව ද දන්වා ඇත. ජුනි 21 සිට 27 දක්වා පිළිවෙලින් අනුරාධපුර විමලරතන හිමි, ධම්මදීප හිමි, රංසෑගොඩ සිරි විමල හිමි, යටිගල ඤාණසිරි හිමි, දියතලාවේ පියදස්සි හිමි, කිරින්දේ උදිත හිමි දම් දෙසුම් පවත්වති. ජුනි 28 දවල් මහා සංඝගත දක්ෂිණාවකි.

## පිළියන්දල මාකන්දන සංකල්ප විහාරය

පිළියන්දල මාකන්දන සංකල්ප විහාරයේ පොසොන් පෝය නිමිත්තෙන් දවස පුරා පින්කම් මාලාවක් සංවිධානය කර ඇත. උදෑසන 5.00 ට කිරි ආහාර පූජාවෙන් ඇරඹෙන මෙම සිල් වැඩසටහනට මිරිස්වත්තේ ඉන්ද්‍රසිරි, කෝලානේ වසුබන්දු, මුන්දලමේ නාරද, වැල්ලවායේ මහානාම යන හිමිවරුන්ගේ ධර්ම දේශනා ඇතුළත් වේ.

සවස 6.00 ට සංකල්ප දහම් පාසල් දරුවන්ගේ පොසොන් බොදු ගී ප්‍රසංගයක් පැවැත්වේ. ඉන් අනතුරුව සංකල්ප ක්‍රීඩාංගනයේ දී සංකල්ප ක්‍රීඩා සමාජය විසින් මෙහෙයවන බත් දන්සලක් ද විහාරාධිපති උග්ගොඩ ධම්මින්ද හිමියන්ගේ අනුශාසනා පරිදි සංවිධානය කර ඇත.

## රද්දොළුව ශ්‍රී අමර මහා විහාරස්ථානය

සීදූව - රද්දොළුව ශ්‍රී අමර මහා විහාරස්ථානයේ පොසොන් පුන්පොහොය නිමිත්තෙන් පින්කම් මාලාවක් විහාරාධිපති, පණ්ඩිත ගෞරව ශාස්ත්‍රවේදී සීදුවේ සුමනවංස නාහිමිගේ මෙහෙයවීමෙන් හා අනුශාසනා පරිදි පැවැත්වීමට කටයුතු සලසා ඇත.

එදින අලුයම 5.00 ට ශ්‍රී දළදා වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේ උදෙසා ප්‍රණීත කිරි ආහාර පාත්‍ර 32 ක් පූජා කිරීම, අලුයම 5.30 ට සිල් සමාදන්වන පින්වතුන් අෂ්ටාංග උපෝසථ සීලයෙහි පිහිටුවීම හා අනුශාසනාව විහාරාධිපති සීදුවේ සුමනවංස නාහිමි, උදෑසන 6.00 ට ආහාර බුද්ධ පූජාව හා තෙරුවන් වන්දනාව, පෙරවරු 7.30 සිට 8.30 දක්වා ධර්ම දේශනාව- ගෞරව ශාස්ත්‍රවේදී මීවැල්ලාවේ පඤ්ඤාරංසි තිස්ස හිමි, 8.45 සිට 9.30 දක්වා ධර්ම දේශනාව - ශාස්ත්‍රවේදී මාදුවේ කෝලිත හිමි, 9.45 සිට 11.00 දක්වා ධර්ම සාකච්ඡාව - කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අශෝක් ප්‍රියදර්ශන මහතා, ශාස්ත්‍රපති නීල් ධර්මප්‍රිය බණ්ඩාර මහතා, ධර්මාචාර්ය කේ.ඒ.එස්. ආර්. දයානන්ද මහතා, ධර්මාචාර්ය කේ.එම්.ආර්. කුමාරසිංහ මහතා ඇතුළු වියතුන්, 11 ට ව්‍යංජන, පලතුරු, කැවිලි වර්ග 32 ක් ඇතුළු ශ්‍රී දළදා වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේ උදෙසා මුල්තැන් බුද්ධ පූජා කිරීම, පස්වරු 12.00 සිට 12.30 දක්වා සක්මන් භාවනාව, 01.15 සිට 2.15 දක්වා කාව්‍යමය ධර්ම දේශනාව ශාස්ත්‍රවේදී රන්වල සරණසිරි හිමි, 2.45 සිට 3.45 දක්වා ධර්ම දේශනාව - ශාස්ත්‍රපති ඇල්ලේ ඉන්දජෝති හිමි, 4.00 සිට 5.00 දක්වා භාවනාව 6.00 ට විශේෂ ආශිර්වාද අටවිසි බෝධි පූජාව.

## හම්බන්තොට සිංහගිරි විහාරය

උදේ 6.30 සිල් සමාදන් කරවීම හා අනුශාසනාව විතාරන්දෙණියේ වජිර හිමි, 7.00 – බුද්ධ පූජාව හා කිරි ආහාර පූජාව හීන්බුන්නේ නාගිත හිමි, 8.00 ට – ධර්ම දේශනාව. බෝලානේ සිරිසුගත හිමි, 9.00 ට භාවනාව මාමඩලේ මුදිත හිමි, 10.30 බුදුගුණ කවි ගායනා නුගේකන්දේ මංගල හිමි,

දහවල් 11.00 – බුද්ධ පූජාව හම්බන්තොට සමාධි හිමි, දහවල 11.30 දහවල් සංඝගත දක්ෂිණාව, සවස 1.00 ට ධර්ම සාකච්ඡාව, මෙහෙයවීම ධර්මාචාර්ය ඩබ්.ඒ. විජේදාස මහතා,

සවස 3.00 ගිහි දේශනය විජේසිංහ කෝංගලආරච්චි මහතා. සවස 5.00 පොසොන් කවි බණ, ඕපනායක සුජාත හිමි, සවස 6.00 බෝධි පූජාව හා අටවිසි බුද්ධ පූජාව නෝනාගම මෛත්‍රී හිමි රාත්‍රී 7.00 සමචිත්ත පර්යාය සූත්‍ර දේශනාව විතාරන්දෙණියේ වජිර හිමි

## සල්ගල සේනාසනයේ වාහල්කඩ වැඩ ඇරඹේ



වරකාපොළ ගලපිටමඩ සල්ගල ආරණ්‍ය සේනාසනයේ නව වාහල්කඩ ඉදිකිරීමෙහි කටයුතු දැන් ක්‍රියාත්මක වෙමින් පවතී.

සේනාසනාධිකාරී නාවින්න ජයතුංග යෝගාශ්‍රමයේ වැඩවසන හැඳල දමිත හිමි හා සල්ගල ආරණ්‍ය සේනාසනයේ කුඹුක්කඩවල නාහිමියන්ගේ අනුශාසකත්වයෙන් හෙයියන්තුඩුව පුවක්ගහලන්ද ඩී.සී. ගනේගොඩ පරිත්‍යාගශීලි පදනමේ මෙහෙයවීමෙන් මෙම ඉදිකිරීම් කටයුතු සිදුවේ.

## විශේෂ සුවඳ දුම් පූජාවක්

කොබවක ශ්‍රී සුමනාරාම මහා විහාරාධිපති දෙල්මැල්ලේ සුමනරතන පොඩි හාමුදුරුවන්ගේ මෙහෙයවීමෙන් දෙවන වරටත් මේ මස 14 වැනි දා (පොසොන් පුර පසළොස්වක පෝ දා) අනුරාධපුර අටමස්ථානයේ දී හා මිහින්තලේ රාජමහා විහාරස්ථානයේ දී විශේෂ සුවඳ දුම් පූජාවක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

## අමා දම්සර පොසොන් කලාපය

OKI ජාත්‍යන්තර පාසල් ජාලයේ සභාපතිනිය වන නිර්මලී සපරමාදු මහත්මිය හා අධ්‍යක්ෂිකා දැනුම් අබේසේකර මහත්මියගේ අධීක්ෂණය යටතේ, පරිපාලන නිලධාරී මේජර් ජෙනරල් අතුල ගලගමගේ මහතාගේ උපදෙස් පරිදි, පොසොන් පොහොය දින ප්‍රධාන පාසල් පරිශ්‍රයේ දී පෙරවරු 10.30 ට රාගම නවලෝකගම - නවලෝක විහාරවාසී කැලණිය ගුරුකුල විද්‍යාලයේ විද්‍යාවේදී ආචාර්ය ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත දීගල්ලේ සුදස්සන හිමියන්ගේ අනුශාසනාවෙන් පොසොන් පොහෝ දින සැමරුම පැවැත්වේ. එදින දහවල් 12.00 බත් දන්සල ද, සවස 6.30 අමා දම්සර බැති ගී, පාසලේ සිසු සිසුවියන් හා විශාරද එඩ්වඩ් ජයකොඩි, විශාරද චරිතා ප්‍රියදර්ශනී ආරාධිත ගායනයෙන් ද රාත්‍රී 7.00 මහා වෙසක් පහන් කුඩු තරගය ද, රාත්‍රී 7.30 සිට සිසිල් පැන් දන්සල පැවැත්වේ. ජුනි 14 දා දවස පුරා පින්කම් OKI පාසල් ප්‍රධාන පරිශ්‍රයේ දී ඒ සියල්ල පැවැත්වෙන බව ජාත්‍යන්තර පාසලේ බෞද්ධ සංගමය දන්වා සිටියි.

## කහතුඩුවේ දී ගුණ සමරු පින්කම් මාලාවක්

කහතුඩුව ශ්‍රී නන්දනාරාම විහාරාධිපතිව වැඩ සිට අපවත් වී වදාළ කහතුඩුවේ විමලතිස්ස ලොකුහාමුදුරුවන් වහන්සේගේ වර්ෂ පූර්ණ ගුණ සමරුව හා පිටිපන සුගුණසාර ලොකුහාමුදුරුවන් වහන්සේගේ තිස්පස් වන ගුණ සැමරුම නිමිත්තෙන් වත්මන් විහාරාධිපති පෙතිගමුවේ සුමනතිස්ස ලොකු හාමුදුරුවන්ගේ අනුශාසකත්වයෙන් මේ මස 11 වැනි දින සිට 14 වන දින දක්වා ධර්ම දේශනා මාලාවක් හා 15 වන දින සපිරිකර සංඝගත දක්ෂිණාවක් කහතුඩුව ශ්‍රී නන්දනාරාම විහාරස්ථානයේ දී පැවැත්වේ.

11 වන දින සිට 14 වන දින දක්වා සෑම දිනක ම පෙරවරු 6.00 ට ගිලන්පස පූජාවක් පවත්වන අතර සවස 7.00 ට ධර්ම දේශනාව ආරම්භ කෙරේ.

## පහන් කූඩු ප්‍රදර්ශනයක්


දියගම වඩිගවත්ත ශ්‍රී සුදර්මාකර පුරාණ විහාරස්ථානයේ දී දර්ශනීය පහන් කූඩු ප්‍රදර්ශනයක් මේ මස 15 සිට 17 දක්වා ප්‍රදර්ශනය කෙරේ.

# මගේ සීලයේ කැළැලක් නෑ සඳටත් වඩා පිරිසුදුයි



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

*"වස් කාලය අවසන් වුවත් රහත් භාවය තබා මාර්ග ඵලයක්වත් ලබා ගැනීමට මහාසීව තෙරුන් වහන්සේට බැරි වුණා. තුන් මසක් ම ඇඳක පිට නො හොවා දුෂ්කර කාර්යයක යෙදී භාවනා කළත් අපේක්ෂා කළ අරමුණ ඉටු කර ගන්න බැරි වුණා."*



**මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කළ පසු සම්බුද්ධ දේශනාව ලක්දිව පුරා පැතිර ගියා. වෙහෙර විහාර දහස් ගණනක් ඉදිවුණා. රජවරුන්ගේ, මැති ඇමැතිවරුන්ගේ, සැදැහැති දානපතියන්ගේ අනුග්‍රහයෙන් විශාල වෙහෙර විහාර ප්‍රමාණයක් ඉදිවුණා.**

රුහුණු රටේ තිස්ස මහා විහාරය එවැනි එකක්. අනුරාධපුර සමයේ තිස්දහසක් භික්ෂූන් වහන්සේ මේ විහාරය ඇසුරු කළා. වැඩ සිටියා. දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය යනාදී ලෙසින් ත්‍රිපිටකය වෙන් වෙන් ව පුහුණු කළ භාණක ආචාර්ය පරපුරක් ද වැඩ සිටියා.

උන්වහන්සේගෙන් සම්බුද්ධ දේශනාව ඉගෙන ගැනීමටයි තිස්දහසක් පමණ භික්ෂූන් වහන්සේ ලක්දිව විවිධ ප්‍රදේශවලින් වැඩම කළේ.

මේ විහාරයේ වැඩ සිටියා තුන්පිටකය ම උගත් මහා තෙරනමක් මහාසීව කියලා. වැඩම කළ තිස්දහසක් භික්ෂූන් වහන්සේ විවිධ අවස්ථාවල රහත් ඵලයට පත් වුණා. ඒ තිස්දහස අතුරෙන් එක් රහතන් වහන්සේ නමක් තමන් වහන්සේ ලැබුවා වූ අර්හත් ඵලයෙහි ප්‍රීතිය වින්දා.

බොහෝ සතුටට පත් වුණා.

දවසක් ගුරුවරයා කෙරෙහි  සැක උපදවා. අපගේ මහා ආචාර්යයන් වහන්සේට මා ලැබූ සතුට තිබෙන්නේ දැ,යි කල්පනා කළා. ආචාර්යයන් වහන්සේ රහත් බවට නො පැමිණි බව තහවුරු කර ගත්තා.

මෙවැනි උපායකින් තෙරුන් වහන්සේට කළකිරීම් උපදවා, රහත් නැති බව ඇඟවිය යුතු යි, සිතා දිනක් තිස්ස මහා විහාරයට වැඩම කර මහාසීව ආචාර්යයන් වහන්සේ වෙත එළැඹුණා. වත්පිළිවෙත් ඉටු කළා.

පසුව එකත්පස්ව වැඩ සිට නමස්කාර කර ..ස්වාමිනි, මට අවකාශයක් ලබා දෙන්න. මට තවත් එක් ධර්මපදයක් ඔබ වහන්සේගෙන් ඉගෙන ගැනීමට තිබෙනවා. වෙන කිසිදු ආචාර්යවරයෙක් ඒ ගැන නොදන්නා නිසා විසඳා ගැනීමට වැඩම කළේ,යි පවසා සිටියා.

එ විට ශිෂ්‍යයා අමතා ..ඇවැත්නි, බොහෝ දෙනෙක් දැන් ඉගෙනීම් කරනවා. පෙරදාටත් වඩා ශිෂ්‍යය භික්ෂූන් වහන්සේ මෙහි වැඩම කරනවා. කාලයක් වෙන් කර ගැනීමට නම් අපහසුයි. එහෙම වුණත් කිසියම් වේලාවක වෙන්කර ගත් කාලයක් ප්‍රමාදයකින් ලැබීමට පුළුවන්. ටිකක් වැඩ ඉන්න. අවස්ථාවක් ලැබුණු වහාම මම ඔබගේ ධර්ම පදය විසඳා දීමට පැමිණෙන්නම්, යැයි පිළිතුරු දුන්නා.

ශිෂ්‍ය තෙරුන් වහන්සේත් ගුරුවරයා කෙරෙහි ඇති අපමණ ගෞරවය නිසා එය ඉවසා සිටියා. ක්‍රමයෙන් පැයෙන් පැය ගොස් දින කිහිපයක් ගත වුණා. සුදුසු වේලාවක් ලැබුණේ නෑ. දිනක් ගුරුවරයා සමීපයට වැඩම කර ..ස්වාමිනි, මාගේ ධර්ම ගැටලුව විසඳා ගැනීමට දින ගණන් වැඩසිටියත් ඔබ වහන්සේට සුදුසු අවකාශයක් පැමිණියේ ම නෑ. ස්වාමිනි,

**පෙරදාටත් වඩා ශිෂ්‍යය භික්ෂූන් වහන්සේ මෙහි වැඩම කරනවා. කාලයක් වෙන් කර ගැනීමට නම් අපහසුයි. එහෙම වුණත් කිසියම් වේලාවක වෙන්කර ගත් කාලයක් ප්‍රමාදයකින් ලැබීමට පුළුවන්. ටිකක් වැඩ ඉන්න. අවස්ථාවක් ලැබුණු වහාම මම ඔබගේ ධර්ම පදය විසඳා දීමට පැමිණෙන්නම්, යැයි පිළිතුරු දුන්නා.**

මෙසේ අවකාශයක් නැති කළ, නුඹ වහන්සේ කරා එන මාරයාට අවසරයක් ලැබෙන්නේද? යි ප්‍රශ්න කළා.

එවිට මහාසීව තෙරුන් වහන්සේ තම ශිෂ්‍යයා ගැන කල්පනා කරන්නේ ..මොහු මා සමීපයට පැමිණියේ කිසිම ධර්ම ගැටලුවක් විසඳා ගැනීමට නම් නෙවෙයි. මට ම කලකිරීම් උපදවා යන්න,යැයි සිතුවා.

එකණෙහි ම ශිෂ්‍ය තෙරුන් වහන්සේ නැවතත් ..ස්වාමිනි, භික්ෂූන් නම් මා වැනි අයම තමයි, පවසා ආචාර්යයන් වහන්සේගේ පා නමස්කාර කර ආලෝකය විහිදුවන නිල්වන් මැණිකක් මෙන් අහසට පැන නැඟී තමන් වහන්සේ වැඩ සිටින විහාරයට ඍද්ධියෙන් ම වැඩම කළා.

මහාසිව තෙරුන් වහන්සේ ඒ මොහොතේ පටන් දැඩි කලකිරීමට පත් වුණා. මගෙන් ධර්මය උගත් ශිෂ්‍යයන් පවා දැන්  රහත් බව ලබාගෙන. මම රහත් නැති බවත් ඒ අය දැනගෙන. අද ම විදර්ශනා භාවනාව පටන් ගන්න ඕනෑ. මාරයාට නම් අවකාශයක් ලබා දෙන්නේ ම නෑ, යි සිතා තීරණයකට එළැඹියා.

එදා පෙරවස් සමාදන් වන දිනයක්. බොහෝ තෙරුන් වහන්සේ වනගත සේනාසනවලට සහ ගම්දනව්වල විහාරස්ථානවලට වැඩම කරන්න පටන් ගෙන තිබුණා. මහාසීව තෙරුන්වහන්සේත් ශිෂ්‍ය හිමිවරුන් වැඩම කරන අවස්ථාවෙහි ම පාත්‍ර, සිවුරු ආදිය අරගෙන විහාරයෙන් පිටමං වුණා.

ගම් කිහිපයක් පසුකරමින් වනයක් සමීපයේ පිහිටි පර්වත විහාරයකට වැඩම කළා. අපිරිසුදු වූ ලෙනක් පිරිසුදු කර ගත්තා. අවට පරිසරයත් ඇමදීම් ආදියෙන් සකස් කර ගත්තා. භාවනා කිරීමට ආසනයක් වගේම සක්මන් කිරීමට සක්මන් මලුවකුත් හදා ගත්තා. තෙරුවන් නමස්කාර කර භාවනාව ආරම්භ කළා. රහත් නොවී මිස මගේ පිට ඇඳක නො තබමි,යි දැඩි තීරණයක් ද ගත්තා. අද රහත් වෙමි. අද රහත් වෙමි,යි කියමින්, සිතමින් භාවනා කළා.

වස් කාලය අවසන් වුවත් රහත් භාවය තබා මාර්ග ඵලයක් වත් ලබා ගැනීමට මහාසීව තෙරුන් වහන්සේට බැරි වුණා. තුන් මසක් ම ඇඳක පිට නො හොවා දුෂ්කර කාර්යයක යෙදී භාවනා කළත් අපේක්ෂා කළ අරමුණ ඉටු කර ගන්න බැරි වුණා. උත්සාහය අත්හරින්න නම් මහාසීව තෙරුන් වහන්සේ අකැමැති වුණා.

මහාපවාරණයෙන් වස් කාලය අවසන් කිරීමේ දිනයත් උදා වුණා. පූර්ණ චන්ද්‍රයා අහසේ බබළමින් පායා තිබුණා. ..හෙට දිනයේ වස් පවාරණය කරන්න තියෙන්නේ. තුන් මාසයක් ම ගත වී ගියා. කිසිම මාර්ග ඵලයක් ලබා ගැනීමට බැරිවුණා. කමක් නෑ. මට රහත් බව ලබා ගන්න බැරිවුණා තමයි. ඒත් මම උපසම්පදා වුණ දවසේ ඉදන් මේ වසරට අවුරුදු තිහක් වෙනවා. ඒ තිස් අවුරුද්ද පුරාවට ම මගේ ශීලයට කිසිම කැළැලක් සිදු වී නෑ.

මේ පායලා තියන බබළන හඳ වගේ පිරිසුදුයි. නෑ. මේ හදේ හාවාගේ සලකුණක් තියන නිසා මගේ සීලය හඳටත් වඩා පිරිසුදුයි, යැයි සිතමින් බොහෝ සතුටට පත් වුණා.

ඒ මොහොතෙහි ම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන තිලක්ෂණය ගැන තියුණු නුවණින් කල්පනා කළා. එයම අරමුණු වී සිවුපිළිසිඹියාපත් අර්හත් භාවයට පත් වුණා.

කොතරම් වීර්යය කළත් ඇතැම් අයට රහත් ඵලය ලබා ගැනීමට නොහැකි වෙන බවත්, එහෙත් පුරුදු කළ ගුණය හෝ සීලය අරමුණු කර අර්හත් බව ලබා ගැනීමට හැකි වන බවත් මේ කතා පුවතෙන් උගන්වනවා. එබැවින් අරමුණු සාර්ථක කර ගැනීමට වීර්යයත්, සීලයත් පුහුණු කිරීම වැදගත් වෙනවා.

බුදුසරණ



මිහින්තලා මහා සෑ රදුන් වහන්සේ



කණ්ඨක චේතිය



සේල චේතිය



ඉදිකටු සෑය

# චේතියගිරි පින්බිමේ

# මහා දාගැබ් වහන්සේ

**අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ මෙරටට වැඩම කළ මිහින්තලා පුදබිමේ සෑම කඳු මුදුනක ම පාහේ දාගැබ් වහන්සේ ඉදි කිරීම නිසා චේතියගිරිය යන නම් ලැබීය. මිහින්තලා පුදබිමෙහි විසිරී ඇති නටබුන් අතර දාගැබ් 360 ක පමණ නටබුන් හමු වෙයි.**

මිහින්තලා පුදබිමෙහි පිහිටි දාගැබ් අතුරින් සැදැහැවතුන් අතර වඩාත් සම්භාවනාවට පත් වන දාගැබ නම් සේල චෛත්‍යය යි. අනාගත කාලයේ සේල චෛත්‍ය පිහිටන බිම බුදුරජාණන් වහන්සේ තුන්වැනි ලංකාගමනයේ දී මද වේලාවක් සමවත් සුවයෙන් වැඩ සිටි බව මහාවංසය, පූජාවලිය, සද්ධර්මාලංකාරය වැනි කෘතීන්වල සඳහන් වෙයි.

එමතු නොව මේ මහා භද්‍ර කල්පයේ ලොව පහළ වූ කකුසඳ, කෝනාගමන, කාශ්‍යප, ගෞතම යන සිව් බුදුරජාණන් වහන්සේ ම මෙම ස්ථානයේ සමවත් සුවයෙන් වැඩ සිටි බැව් සැලකේ. එසේම මිහිඳු මහ රහතන් වහන්සේ සහ දේවානම්පියතිස්ස රජතුමා සම්මුඛ වී සුප්‍රකට අඹ ප්‍රශ්නය හා ඤාති ප්‍රශ්නය විමසා ඉනික්බිති අනුබුදු මිහිඳු හිමියන් චුල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කරන ලද ස්ථානය ද මෙම ස්ථානය වශයෙන් හඳුනා ගනී.

කූටකණ්ණතිස්ස රජතුමා සෑගිරියෙහි තමා විසින් ම කරවන ලද මහා උපෝසථාගාරයක් ඉදිරිපිට බෝධීන් වහන්සේ නමක් රෝපණය කරවා අසලින් ශෛලමය දාගැබක් කර වූ පුවත මහාවංසයේ දැක්වෙයි. ශෛලමය ස්තූපය සිලාචේතිය හෙවත් සේල චෛත්‍යය වී යැයි නිගමනය කළ හැකි ය. සේල චේතිය වටා වටදාගෙයක නටබුන් හමුවෙයි. එසේම සෑ මලුවෙහි චන්ද්‍රකාන්ති පාෂාණ කොටසක් ශේෂ වී පවතී.

මිහින්තලා පුදබිමේ වඩාත් උස් වූ බිමක පිහිටි, විශාලත්වයෙන් වැඩි ම දාගැබ් වහන්සේ මිහින්තලා මහාසෑය වශයෙන් හඳුන්වනු ලබයි. අෂ්ටවංක මාණික්‍ය රත්නයක තැන්පත් කළ බුදුරජාණන් වහන්සේගේ ඌර්ණරෝම ධාතූන් වහන්සේ තැන්පත් කොට දේවානම්පියතිස්ස රජතුමා ප්‍රථමයෙන් මෙම දාගැබ නිර්මාණය කරන ලද බවත්, ඉන්පසු මහාදාඨික මහානාග රජතුමා විශාල කොට තැන වූ බවත් පිළිගත් මතය යි.

සතර දිග්භාගයට ම, මැනවින් දර්ශනය වන මිහින්තලා පුදබිමේ මනස්කාන්ත බිමක මේ මහා සෑය පිහිටා තිබේ.

මිහිඳු මහරහතන් වහන්සේගේ භෂ්මාවශේෂ තැන්පත් කොට තැනූ මිහිඳු සෑය මිහින්තලා මහාසෑය අසලින් ම පිහිටා තිබේ. දේවානම්පියතිස්ස මහ රජතුමාගේ සහෝදර උත්තිය රජුගේ අටවැනි රාජ්‍ය වර්ෂයේ වප් මස අව අටවක පොහෝ දා උපතින් අසූ වයසක් ද, උපසම්පදාවෙන් හැට වසක් ද ආයු වින්දනය කොට පිරිනිවන් පා වදාළ බැවින් මහා පුදපූජා පවත්වා, ආදාහන පූජෝත්සවය පවත්වා ධාතූන් වහන්සේ තැන්පත් කොට විවිධ ස්ථානවල දාගැබ් ඉදි කර තිබේ. ඒ අතුරින් සෑගිරියේ පිහිටි දාගැබ මෙය වශයෙන් සැලකේ. 1950 දශකයේ පුරාවිද්‍යාඥයන් විසින් හඳුනාගෙන සංරක්ෂණය කිරීම ආරම්භ කළ සෑගිරියේ මිහිඳු සෑය ක්‍රිස්තු පූර්ව යුගයට අයත් දාගැබක් වශයෙන් හඳුනාගෙන තිබේ. එහි වූ ස්වර්ණමය කරඬුවක තිබී මිහිඳු මහ රහතන් වහන්සේගේ භෂ්මාවශේෂ හමු වී ඇත.

ලක්දිව වෙහෙර විසිතුරෙහි හමුවන වාහල්කඩ සඳහා හොඳම නිදර්ශනය සපයන කණ්ඨක චේතිය පිහිටා ඇත්තේ ද මිහින්තලයේ ය. ස්තූපය අසල වූ ක්‍රිස්තුවර්ෂ පළමු සියවසට අයත් සෙල් ලිපියකට අනුව එම දාගැබ කණ්ඨක චේතිය වශයෙන් හඳුනා ගෙන ඇත. මහා සංඝයා වහන්සේ සඳහා වැඩ සිටීමට සකස් කළ අටසැටලෙන් පිහිටා ඇත්තේ ද කණ්ඨක චේතිය ආශ්‍රිතව ය. සද්ධාතිස්ස රජුගේ පුත් වූ ලජ්ජිතිස්ස රජතුමා මෙම දාගැබට කංචුකයක් තැන වූ බව සඳහන් වීමෙන් කණ්ඨක චේතිය ඊටත් පෙර යුගයක තැන වූ දාගැබක් වශයෙන් හඳුනා ගත හැකි ය. කණ්ඨක චේතියේ වාහල්කඩ කැටයම් මෙරට පැරණිතම බෞද්ධ මූර්ති කැටයම් වශයෙන් හඳුනාගෙන තිබේ.

සෙල්ලිපිවල කියැවෙන කතු මහ සෑය වර්තමානයේ කටු සෑය ලෙස ව්‍යවහාර කෙරෙන බව පිළිගැනීමයි. මහායාන ධර්ම ග්‍රන්ථ රචනා කළ තඹ තහඩු මෙම දාගැබ කැණීමෙන් හමු වී තිබේ. මිහින්තලේ පුදබිම ගොඩනැංවීමට යොදා ගත් ආයුධ මෙහි තැන්පත් කොට ඇතැයි ඇතැමුන් අනුමාන කළත් ඊට නිශ්චිත සාධක හමු වී නැත.

කැණීම්වල දී ඉදිකටු හමු වූ හෙයින් ඉදිකටු සෑය වශයෙන් හඳුන්වනු ලබන ඉදිකටු සෑය මිහින්තලේ පිහිටි තවත් දාගැබකි. සිවුරු මැසීමට යොදාගත් ඉදිකටු මෙසේ නිධන් කොට ඇතැයි මතයක් පළ වී තිබේ. මිහින්තලේ වඩාත් ම උසින් පිහිටි ඇත් වෙහෙර කන්දේ පිහිටි දාගැබ අතීතයේ කිරි බණ්ඩ පව් දාගැබ වශයෙන් හඳුන්වා තිබූ බව මිහින්තලා පුවරු ලිපිවල දැක්වෙයි.

දිමුතු පුන්සර කොළඹගේ

වර්ෂ 2022 ක් වූ ජුනි 14 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.